# නිවනේ නිවීම

## දසවන වෙළුම



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

## ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ

# පොදු පුණ්‍යානුමෝදනාව

"**මහණෙනි, ආමිස දානයය, ධර්ම දානයය, යන මේ දන් දෙකෙකි. මේ දන් දෙක අතුරෙන් මෙයම අග්‍රය - එනම්, ධර්ම දානය.**"

මේ අසිරිමත් බුදුවදන අගය කරන බොහෝ පාඨකයින් තම පරලෝ සැපත් මවුපියාදී ඥාතීන්ට කෘතගුණපූර්වකව පින් අනුමෝදන් කරවීමේ චිරාගත චාරිත්‍රයට අනුව ලොකු කුඩා පරිත්‍යාග පිරිනමන බැවින් දෙස් - විදෙස් වැසි ගිහි - පැවිදි දහම් පිපාසිත විශාල පිරිසකට අමිල දහම් අමාපැන් නොමිලයේ බෙදාදෙන **ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය** පුණ්‍යානුමෝදනා වශයෙන් එම ධර්ම දානමය කුසලය එකී පින්වතුන්ට හා ඥාතීන්ටත් මෙම 'අමාගඟ' නොසිඳී ගලායාමට නිරතුරුව කාලය, ධනය, ශ්‍රමය වැයකරන සැමටත් පරම ශාන්ත උතුම් අමාමහ නිවනින් සැනසීමට උපනිශ්‍රය සම්පතක්ම වේවායි පතන බව දන්වා සිටිමු.

මෙයට,

සදුන් ලැදි

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය.

# නිවනේ නිවීම

## (දෙසුම් පෙළක්)

දසවන වෙළුම
(28, 29, 30 දෙසුම්)

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම

ISBN 955-8832-00-6

2002
ප්‍රකාශනය
ධර්මග්‍රන්ථ මුද්‍රණාගාරය
මහාභාරකාර දෙපාර්තමේන්තුව

# ධර්මදානයකි

මුදලට විකිණීම සඳහා තහනම් වෙයි.


ප්‍රථම මුද්‍රණය - 1997 ජූනි
දෙවන මුද්‍රණය - 1999 මාර්තු
තෙවන මුද්‍රණය - 2000 ජූනි
සිවුවන මුද්‍රණය - 2003 ඔක්තෝබර්
පස්වන මුද්‍රණය - 2007 ජනවාරි


## පොත ලබාගත හැකි ස්ථාන

. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.

. රෝයල් ඉන්ස්ටිටියුට්,
191, හැව්ලොක් පාර,
කොළඹ 5.

. ඩී. ටී. වේරගල මහතා
422, වැලිපාර, තලවතුගොඩ.

. අනුර රූපසිංහ මහතා
අංක 27, කොළඹ වීදිය, මහනුවර.

i. මහා භාරකාර දෙපාර්තමේන්තුව
2, බුලර්ස් පටුමග,
කොළඹ 07.


මුද්‍රණය
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
ටෙලි : 011-4302312

මෙම දේශනාමාලාව පැවැත්වීමට ආරාධනාකොට

අප ධෛර්යවත් කළ

මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ

අපවත් වී වදාළ

අතිපූජනීය, මහෝපාධ්‍යාය

## මාතර ශ්‍රී ඥානාරාමාභිධාන

අප ගුරුදේවයන් වහන්සේගේ ශ්‍රී නාමයට

## 'නිවනේ නිවීම'

පූජෝපහාරයක්ම වේවා!

එතං සන්තං

එතං පණීතං

යදිදං

සබ්බ සංඛාර සමථො

සබ්බූපධිපටිනිස්සග්ගො

තණ්හක්ඛයො

විරාගො

නිරොධො

නිබ්බානං

"මෙය ශාන්තය

මෙය ප්‍රණීතය

එනම්

සියලු සංස්කාරයන්ගේ සංසිඳීම

සියලු උපධීන් අත්හැර දැමීම

තණ්හාව ක්ෂය කිරීම

නොඇල්ම නම්වූ විරාගය

නැවැත්ම නම් වූ නිරෝධය

නිවීම නම් වූ නිබ්බානය"

# පටුන


| | පිටු |
|---|---|
| හැඳින්වීම | vi |
| ප්‍රකාශක නිවේදනය | x |
| ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය | xi |
| අමාගඟ | xii |
| ග්‍රන්ථ සංකේත නිරූපණය | xiv |
| 'නිවනේ නිවීම' - 28 | 1 |
| 'නිවනේ නිවීම - 29 | 25 |
| 'නිවනේ නිවීම' - 30 | 49 |
| ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අනුග්‍රාහක මණ්ඩලය | |

# හැඳින්වීම

බුද්ධ දේශනාවෙහි දැක්වෙන ප්‍රතිපත්ති මාර්ගයේ අවසාන පරමාර්ථය වන 'නිවන' පිළිබඳව ඈත අතීතයේ පටන්ම විවිධ මතිමතාන්තර ප්‍රකාශයට පත් වී ඇත. ආර්ය අෂ්ටාංගික මාර්ගය 'සම්මා දිට්ඨි' නම් වූ 'හරි දැක්ම' පෙරටු කරගත් ප්‍රතිපදාවකි. එබැවින් ඒ මාර්ගයෙහි ගමන් කරන්නෙකුට ගමනෙහි ඉලක්කය ගැන නිරවුල් අවබෝධයක් ඇතිවිය යුතුමය. බුද්ධ වචනයට අනුකූලව එවැනි අවබෝධයකට මඟ හෙළි කිරීම මෙම දේශනා මාලාවේ පරමාර්ථය විය.

මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි ප්‍රධාන කර්මස්ථානාචාර්යයන් වහන්සේ වශයෙන් වැඩ විසූ, අපවත් වී වදාළ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ විසින් අප වෙත කරන ලද සමාරාධනය මේ දේශනා පෙළට ආසන්න නිමිත්ත විය. අපගේ ගුරුදේවයන් වහන්සේ වූ උන්වහන්සේ, මෙයට වසර කීපයකට පෙර නිස්සරණ වන යෝගාවචර සඟ පිරිසට ඉදිරිපත්වූ එක්තරා ධර්ම ගැටළුවකදී 'නිවන' පිළිබඳව දේශනා පෙළක් පැවැත්වීම ප්‍රයෝජනවත් විය හැකි බවත්, ඒ දේශනා පටිගත කරගැනීමට කටයුතු යෙදිය හැකි බවත් පවසමින් අප වෙත කරන ලද දයාන්විත ආරාධනය පිළිගැනීමට මුලදී පසුබට වීමු. යළිත් එම ආරාධනාව කළ අවස්ථාවේදී, එසේ පසුබට වීමට එක් හේතුවක් වශයෙන් අප සඳහන් කළේ 'නිවන' සම්බන්ධයෙන් දැනට ප්‍රචලිතව ඇති ඇතැම් මතිමතාන්තර කෙරෙහි අප දක්වන වෙනස් ආකල්පය නිසා ඇතිවිය හැකි ප්‍රතිචාරයය. එවිට උන්වහන්සේ වදාළේ: "ඒකට කමක් නෑ...... මා ආරාධනා කළ බව දේශනාවේදීම කියන්න" යනුවෙනි.

ඒ සා උදාර පැවරීමකින් උත්සාහවත්ව ආරම්භ කැරුණු මෙම දේශනා මාලාව දෙවසරකට වැඩි කාලයක් තිස්සේ (1988.08.12-1991.01.30) දෙපෝයකට වරක් බැගින් අප ගුරුදේවයන් වහන්සේගේ අතිපූජනීය පාදමූලයේදී නිස්සරණ වනයේ අප සබ්‍රහ්මචාරී ගරුතර යෝගාවචර සඟ පිරිස හමුවේ පවත්වන්නට යෙදුණි. ගිලන්වූ ඇතැම් අවස්ථාවලදී පවා මාහිමිපාණන් වහන්සේ යහන්ගතව දෙසුමට සවන් දුන්හ. උන්වහන්සේ බැහැර සෙනසුනෙක වැඩ විසූ එක් අවස්ථාවෙක, මාහිමිපාණන් වහන්සේ මුලසුනෙහි නොමැතිව දේශනා පැවැත්වීම සම්බන්ධයෙන් පැහැදුනු

ප්‍රශ්නයක් නිසා එක් දේශනා වාරයක් මග හැරුණි. ඒ බැව් සැළවූ විට. නොකඩවාම දේශනාමාලාව පැවැත්විය යුතු බවත්, තමන් වහන්සේට ඒ දෙසුම් පටිගත කළ පසුව වුවද ඇසිය හැකි බවත්, උන්වහන්සේ වදාළහ. අප ගුරු දේවයන් වහන්සේගේ ඒ උදාර මුදිතා ගුණයට හා ධර්මකාමී ශාසන දයාවට නමස්කාර වේවා!

දෙසුම් 33 කින් පරිමිත මෙම දේශනා මාලාව පැවැත්වීමේදී අප අනුගමනය කළ විවරණ මාර්ගය අනුව හේතුසාධක වශයෙන් පෙළ අටුවා ආදියෙන් කොතෙකුත් උධෘත පාඨ ගෙනහැර දැක්වීමට සිදුවිය. ඒ අනුව එක්තරා බුද්ධිගෝචර රටාවක් මෙහි දැකිය හැකි නමුදු අප පරමාර්ථය වූයේ සද්ධර්මයේ සජීව ප්‍රායෝගික පක්ෂය ඉස්මතු කර දීමමය. ඇතැම් විට හුදු බුද්ධිවාදයක අතරමං වී සිටින උගතුන් කිසියම් ධර්මප්‍රබෝධයක් තුළින් ප්‍රතිපදාව වෙතට යොමුකරවා ගැනීමට මේ විවරණ මාර්ගය උපකාරවත් විය හැකිය. කෙසේ හෝ වේවා, යමෙකුට ධර්මරසය විඳිමින්ම දෙසුමකට සවන්දිය හැකිවන අයුරින් විවිධ උපමා, උපමා කථා, නිදර්ශන ආදියෙන් දෙසුම් පෙළ පණපෙවීමට උත්සාහවත් වීමු. බුදු පියාණන් වහන්සේ වදාළ පරිදිම, "මෙහි ඇතැම් නුවණැති පුරුෂයෝ උපමාවෙනිදු දෙසුමෙක අරුත මැනැවින් වටහා ගනිත්".

අසන්නවුන්ගේ අවධානය නොපිසිරෙන අයුරින් මුතු ඇට පෙළක් තුලක අවුණන්නාක් මෙන් ධර්ම කාරණා සාධක සහිතව ගොනු කර දැක්වීම දේශනාවක් තුළ දී කළ හැකි පහසු කාර්යයක් නොවේ. එබැවින් එවැනි ගැටලුසු තැන්වලදී හේතුසාධක කීපයක් පමණක් දැක්වීමෙන් සෑහීමකට පත්වීමට සිදුවිය. එහිලා වඩාත් සවිස්තර විවරණ විග්‍රහ අප අතින් ලියැවී පළවූ ග්‍රන්ථ කීපයක ඇතුළත් වී ඇත.[1]

දෙසුම් පෙළ නිමකොට සත්වසරකට පසු "නිවනේ නිවීම" නමින් එළිදැක්වෙන මෙම ග්‍රන්ථයෙන් යම් ශාසනාර්ථයක් ඉටු වේනොත් එයින් ජනිත කුශල සම්භාරය දෙසුම්පෙළට ඇරැයුම් කොට වදාළ අප ගුරුදේවයන් වහන්සේ වූ මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ අනුමෝදන්

---

1 * 1 Concept and Reality in Early Buddhist Thought - (1971)
* 2 Samyutta Nikaya - An Anthology Part II - (Wheel No. 183/185)
* 3 Ideal Solitude - Wheel No. 188
* 4 උත්තරීතර හුදෙකලාව - (දම්සක් අංක 172/173)
* 5 The Magic of the Mind - (1974)
6 Towards Calm and Insight-Printed for free distribution by J.Alwis
* Published by Buddhist Publication Society. P.O. Box 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61. මහනුවර

වන සේක්වා! ඒ දුර්ලභ ගුරු ඇසුර ලබාගැනීමට මහපැදූ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක අතිපූජනීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් වහන්සේටත් අතිපූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේටත් මෙම ධර්මදානමය කුශලය හිමිවේවා!

පටිගත වූ දෙසුම් 33 පිටපත් කිරීමේ භාරදූර කාර්ය මහත් පරිශ්‍රමයකින් ඉටුකළ හඳුරුදෙණියේ පියදස්සන හිමියන්ටද, සම්පූර්ණ ශුද්ධි ආදියෙන් පසුව එම අත්පිටපත මුද්‍රණය සඳහා සකස් කර දුන් පූජ්‍ය උඩවිරියගම ධම්මජීව, පූජ්‍ය මහයායේ ධම්ම සුනෙත්ත යන හිමිවරුන්ටද දෙසුම් පටිගත කිරීම පිටපත් කිරීම් ආදී කටයුතුවලට සහායවූ හැමදෙනා වහන්සේලාටද මෙම ධර්මදානමය පින පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිසම වේවා! එමෙන්ම, අවශ්‍ය අවස්ථාවලදී කැසට් පටි සපයාදීමෙන් හා ලිපි ද්‍රව්‍ය, ඡායා පිටපත් ලබාදීමෙන් අනුග්‍රහය දැක්වූ ඩඩ්ලි ප්‍රනාන්දු මහතා ප්‍රධාන ඩී. එච්. පී. ගුණවීර සහ සමාගමේ කාර්යමණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

අමිලවූ ධර්මය මිල කිරීමකින් නොපිරිහෙළා ධර්මකාමීන් අතට පත්කිරීම අපගේ අභිලාෂය විය. එහෙත් විශාල ග්‍රන්ථයක් බවට පත්වන මෙම දෙසුම් පෙළ එක්වරම බොහෝදෙනෙකුන් අතට පත් කිරීමේ දුෂ්කරතාව වැටහුණෙන් දෙසුම් 3 බැගින් වෙළුම් 11 ක් වශයෙන් එළි දැක්වීමට අදහස් කළෙමු. මේ අනුව යටත් පිරිසෙයින් දෙසුම් කිහිපයක් හෝ කියවීමට වැඩිදෙනෙකුට අවසථාව සැලසෙන අතරම ධර්මදානමය පුණ්‍ය කර්මයට බොහෝදෙනාගේ සහභාගීත්වයද ලැබෙනු ඇතැයි හඟිමු. එබැවින්, ග්‍රන්ථය නවමත් ශුද්ධිපත්‍ර අවස්ථාවේ පවතින නමුදු මෙසේ පළමු වෙළුම නිකුත් කිරීමට තීරණය කළෙමු. යථා කාලයේදී සම්පූර්ණ ග්‍රන්ථය පුස්තකාල මුද්‍රණයක් වශයෙන් අංග සම්පූර්ණව මුද්‍රණය කෙරෙනු ඇත. කෙසේ වෙතත්, "නිවනේ නිවීම" වෙළුම් එකොළොසම පිළිවෙළින් එකතු කරගන්නා පාඨකයින්ගේ පහසුව තකා අවසන් වෙළුම සමග උපමා ඉඟිවැලක් හා ගාථා ඉඟිවැලක් ද සහිත 'පදයතුරක්' (අනුක්‍රමණිකාවක්) නිකුත් කිරීමට බලාපොරොත්තු වෙමු. එම පදයතුර සකස් කිරීමේදී අපට සහාය වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් උපාලි ජයනෙත්ති මහතාට ඒ පින නිවන් දොර ඇරෙන යතුරක්ම වේවායි පතමු.

ග්‍රන්ථ මුද්‍රණයෙහිලා මුද්‍රණාලය හා අවශ්‍ය සම්බන්ධීකරණය පිළිබඳ සම්පූර්ණ වගකීම භාරගෙන විශේෂ කැපවීමකින් ග්‍රන්ථය එළිදැක්වීමට කටයුතු කරන මහාභාරකාර නැන්සන් ශ්‍රී. මාපා මහතාට මෙම ධර්මදානමය කුශලය ස්වකීය ධර්ම ප්‍රාර්ථනා ඉෂ්ට කරගැනීම පිණිස හේතුවාසනා වේවා! එසේම, වෙළුම් එකොළොසකින් නිමාවන ග්‍රන්ථයෙහි බරපැන, 'බර පැනයක්' නොවනු පිණිස 'ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් විශේෂ අරමුදලක් පිහිටුවීමෙන් පුරෝගාමීවූ පින්වත් ජී.ටී. බණ්ඩාර මහතාට එම

ආදර්ශවත් පරිත්‍යාගයෙන් ජනිත කුශලය පරම ශාන්තවූ 'නිවනේ නිවීම' පසක් කරගැනීමට උපනිශ්‍රය වේවායි! යි පතමු. මුද්‍රණ භාරයේ තීරණාත්මක අවසාන අදියර සඳහා පූර්ණ සහයෝගය දෙන කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ කාර්ය මණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමි විය යුතුව ඇත.

මෙයට
සසුන් ලැදි,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

**පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය**
**'පහන් කණුව'**
**කණ්දෙගෙදර**
**දේවාලේගම**

**(25 41) 1997 ජූලි 1**

## නිවනේ නිවීම පළමු වෙළුම - පස්වන මුද්‍රණය

මෙම පස්වන මුද්‍රණයේ මුද්‍රණ කටයුතු මැනවින් නිමකළ "කොලිටි ප්‍රින්ටර්ස්" සමාගමේ සී.ජයසෝම මහතා ඇතුළු සැමටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

සම්පාදක
(2550) 2006 දෙසැම්බර්

# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ "නිවනේ නිවීම" දේශනා මුද්‍රණය කොට, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයහට එම දහම් පොත් ලබාදීමේ මූලික අදහස අප තුළ ඇතිවී මුත්, මුද්‍රණය සඳහා වැය වන මුදල උපයා ගැනීම ප්‍රශ්නයක් විය. එය විසඳීම පිණිස අප කිහිප දෙනෙක් යෝජනා කළේ වැයවන මුද්‍රණ වියදම පමණක් අය කර ගැන්මට ප්‍රමාණවත් වූ මිලකට එම දහම් පොත් විකිණීමයි. එහෙත්, අපගේ එම යෝජනාව ගරු ඤාණනන්ද ස්වාමීන් වහන්සේ එකහෙලා ප්‍රතික්ෂේප කරමින් "ධර්මය මිල කරන්න බැහැ, එය අවශ්‍ය අයහට නොමිලේ ලබා ගැන්මට හැකිවිය යුතුයි..." කීහ.

එබැවින් උන්වහන්සේ අදහස් කළ පරිදි මුලින්ම මුද්‍රණය කල "නිවනේ නිවීම" දේශනා මාලාව සඳහා වියදම් ලබා ගැන්මේ වැඩ පිළිවෙලක් වශයෙන් රෝයල් ඉන්ස්ටිටියුට් හි අධිපති ජී.ටී.බණ්ඩාර මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් අරමුදලක් අරඹනු ලැබීය. එවකට මහා භාරකාර ධූරය දැරූ ශ්‍රී. මාපා මහතාගේ අදහසක් අනුව පිහිටුවන ලද එකී භාරයෙහි අරමුණ වූයේ මෙම පුණ්‍ය ක්‍රියාව ඉටුකර ගැනීම සඳහා දායක වීමට කැමති අය හට මුදලින් කෙරෙන තම පුණ්‍යාධාර එම භාරයට බැර කිරීමට අවස්ථාව සළසා දීමයි.

1997 වසරේදී ඇරඹුනු මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පූජ්‍ය ඤාණනන්ද හිමියන්ගේ දේශනා 33 කින් යුත් "නිවනේ නිවීම" වෙළුම් 11 කින් මුද්‍රණය කොට නොමිලේ බෙදා දීමට අමතරව පසළොස්වක පොහෝ දිනයන්හිදී පහන් කණුව සෙනසුන වෙත රැස්වෙන උපාසක උපාසිකාවන් සඳහා උන්වහන්සේ විසින් කෙරෙන ධර්ම දේශනා "පහන් කණුව ධර්ම දේශනා" නමින් මේ වන විට ග්‍රන්ථ 6ක් පළකොට තිබේ. එතැනින් නොනැවතී උන්වහන්සේගේ අනෙකුත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථද එසේම ධර්ම දාන වශයෙන් පළකිරීමට හැකිවීම ඊට දායක වූ අප සැමගේ ඉමහත් සතුටට හේතුවිය.

අති පූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ එම ධර්ම දේශනා අගයමින් එම සත්කාර්යය නොනවත්වා කරගෙන යෑම පිණිස දායක භවතුන්ගෙන් අප වෙත ලැබෙන පැසසුම් සහිත ප්‍රතිචාරය නිසාම ඒ අයගේ පහසුව පිණිස අප විසින් මෑතකදී "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ජංගම ගිණුම විවෘත කරන ලදී.

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමියන් විසින් පහදා දෙනු ලබන නිර්මල බුදු දහම ඔබ අතට පත් කිරීම අපගේ එකම අරමුණයි. ඊට ඔබගෙන් ලැබෙන දායකත්වය ඉමහත් කුශලයකි. අපට ඉමහත් ධෛර්යයකි.

මෙම වටිනා ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීමේ සම්පූර්ණ කාර්යභාරය ජී.ටී. බණ්ඩාර මහතා විසින් රෝයල් ඉන්ස්ටිටියුට් හි පින්වත් නිලධාරීන්ගේ සහායද ඇතිව වෙහෙස මහන්සි නොබලා ඉටුකර දීම ගැන අපගේ බලවත් ප්‍රසාදය මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතු වේ.

මෙයට,<br>
සදහම් ලැදි<br>
ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරකාර මණ්ඩලය

# ධම් ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම, "නිවනේ නිවීම" සහ "පහන් කණුව ධර්ම දේශනා" නමින් පළ වී ඇති දහම් පොත් තුළින් මේ වන විටත් ඔබ ඇතැම් විට කියවා තිබිය හැක.

එම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා හැකි පමණ මුද්‍රණය කොට නොමිලේ බෙදා දීම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අරමුණයි.

මෙතෙක් එම භාරය මගින් පළකොට ඇති ධර්ම ග්‍රන්ථ එකී ග්‍රන්ථ වල අවසාන පිටුවෙහි දක්වා ඇත.

මෙම මහඟු පුණ්‍ය ක්‍රියාව සඳහා දායක වීමට කැමති පින්වතුන්, පහත සඳහන් උපදෙස් පිළිපැදීම මැනවි.

1. චෙක්පත්/මුදල් ඇනවුම් මගින් එවන සියලු ආධාර "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ගිණුමට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකිය.
2. දිවයිනේ පිහිටි ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් ඔබගේ ආධාර මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කල හැක.
3. කෙසේ වුවද, ඔබගේ පහසුව පිණිස සියලු පුණ්‍යාධාර කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 191 හි පිහිටි රෝයල් ඉන්ස්ටිටියුට් ආයතනයේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය වෙනුවෙන් පිහිටුවා ඇති අංශයටද බාර දියහැක.
4. මෙම භාරය මගින් නිකුත් කැරෙන ධර්ම ග්‍රන්ථ මගින් ඔබගේ දායකත්වය වරින් වර දායක භවතුන්ගේ දැනගැන්ම සඳහා පළ කරනු ඇත.
5. ඔබ විසින් කරනු ලබන ආධාරය බැංකු ගිණුමට බැර කරන විට ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියෙහි ඡායා පිටපතක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් මෙම ධර්ම දානමය කටයුත්තට දායක වන ඔබගේ නම සහ දායක මුදල අප විසින් වරින් වර පළ කරන දායක ලැයිස්තුවෙහි ඇතුළත් කිරීම කළ හැකිය.

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්
අංක 191, හැව්ලොක් පාර
කොළඹ 05

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම් සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට නෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් තත් අයුරින් සොම්නස පළකළහ.

"ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරවූවෝ සඳුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්මදේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අභිනව පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, කහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉඳුඳු නොනැවතී, ශක්ති පමණින් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත්

මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතිනා තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

"සබ්බදානං ධම්මදානං ජිනාති"

මෙයට,

සසුන් ලැදි
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම

2000 ජූනි 05 (2544 පොසොන්)

# ග්‍රන්ථ සංකේත නිරූපණය

මහා. - මහා වග්ග පාළි

දී.නි. - දීඝ නිකාය

ම.නි. - මජ්ඣිම නිකාය

සං.නි. - සංයුත්ත නිකාය

අං.නි. - අංගුත්තර නිකාය

ඛු.නි. - ඛුද්දක නිකාය

ධ.ප. - ධම්මපද

උදා. - උදාන

ඉති. - ඉතිවුත්තක

සු.නි. - සුත්තනිපාත

ථෙර. - ථෙරගාථා

ථෙරී. - ථෙරීගාථා

මහානි. - මහා නිද්දෙස

චූ.නි. - චූලල නිද්දෙස

නෙත්ති - නෙත්තිප්පකරණ

සු.වි. - සුමඞ්ගලවිලාසිනී (දීඝ නිකාය අටුවාව)

ප.සූ. - පපඤ්චසූදනී (මජ්ඣිම නිකාය අටුවාව)

සා.ප. - සාරත්ථප්පකාසිනී (සංයුත්ත නිකාය අටුවාව)

මනො. - මනොරථපූරණී (අංගුත්තර නිකාය අටුවාව)

ධ.අ. - ධම්මපදට්ඨ කථා

ප.ජෝ. - පරමත්ථජෝතිකා

ජා.අ. - ජාතකට්ඨකථා

ප.දී. - පරමත්ථදීපනී

වි.ම. - විසුද්ධිමග්ග

බු.ජ. - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා

හේ.මු. - සයිමන් හේවාවිතාරණ මුද්‍රණය

# 28 වන
# දේශනය

# 28 වන දේශනය

'නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස'

'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං'

'මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම සියලු උපධීන් අත්හැරදැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය'

අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිම්පාණන්වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනාමාලාවේ විසිඅට වන දේශනයයි මේ.

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පළමුවැනි අංගය වන සම්මා දිට්ඨිය, දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග යන ආර්ය සත්‍ය හතරම පිළිබඳ ඥානය වශයෙන් හඳුන්වා තිබීමෙන් පෙනී යන්නේ නිරෝධය නැත්නම් නිබ්බානය පිළිබඳ යම් කිසි වැටහීමක්, ප්‍රතිපදාවට අත්‍යවශ්‍ය බවයි. මේ කියන සම්මා දිට්ඨිය ඇති වීමට ප්‍රත්‍ය දෙකක් උපකාර වන බව අංගුත්තර නිකායේ දුක නිපාතයේ සඳහන් වෙනවා. "ද්වෙමෙ භික්ඛවෙ පච්චයා සම්මා දිට්ඨියා උප්පාදාය, කතමෙ ද්වෙ, පරතො ච ඝොසො යොනිසො ච මනසිකාරො."[1] මහණෙනි, සම්මා දිට්ඨිය ඇතිවීමට මේ ප්‍රත්‍ය දෙකක් වෙයි. කවර දෙකක්ද, අනුන් වෙතින් ධර්ම ඝෝෂය අසන්නට ලැබීමත්, තමා තුළ කෙරෙන නුවණින් මෙනෙහි කිරීමත්."

'යොනිසො මනසිකාර' කියන වචනයට අපි සාමාන්‍යයෙන් නුවණින් මෙනෙහි කිරීම කියන සිංහල වචනය යෙදුවට මොකද ඊට වඩා ගැඹුරක් මේ පදයේ තිබෙනවා. "යොනිසො" කියල කියන්නේ හට ගැනීම අනුව, නිදානය අනුව, ප්‍රභවය අනුව මෙනෙහි කිරීමයි. 'යොනිසො මනසිකාර' කියන එකේ තේරුම ඒකයි. මේ යෝනිසෝ මනසිකාරය කියන එකේ අර්ථය හොඳට පැහැදිලි වෙන තැනක් තමයි අප කලින් දේශනයකදී පටිච්ච සමුප්පාදය පිළිබඳව විස්තර කරන අවස්ථාවක මහාපදාන සූත්‍රයෙන් උපුටා දක්වූව, විපස්සී බෝසතාණන් වහන්සේ පටිච්ච සමුප්පාදයේ අග කෙළවරේ සිට ක්‍රමයෙන් යෝනිසෝමනසිකාර ක්‍රමයෙන් විමසමින් ගිහිල්ල ඒ නියම ප්‍රභවයට පැමිණි ආකාරය. "කිම්හි නුඛො සති ජරාමරණං

හොති කිම්පච්චයා ජරාමරණං? ජාතියා ඛො සති ජරාමරණං හොති ජාති පච්චයා ජරා මරණං" ආදී වශයෙන් කුමක් ඇති කල්හි ජරාමරණය වෙයිද කුමක් ප්‍රත්‍යය කොටගෙන ජරාමරණය වෙයිද. ජාතිය ඇති කල්හි ජරාමරණය වෙයි. ජාතිය ප්‍රත්‍යය කොටගෙන ජරාමරණය වෙයි, ආදී වශයෙන් ජරා මරණයෙ ඉඳල ක්‍රමක්‍රමයෙන් ඉහළට යෝනිසෝමනසිකාරය විහිදුවල අවසානයේ අර විඤ්ඤාණ-නාම රූප කියන සංසාර වට්ටයට පැමිණි හැටි එදා ඒ අවස්ථාවල සාකච්ඡා කරල තිබුන. එතකොට මේ අනුව අපට හිතාගන්න පුළුවනි යෝනිසෝමනසිකාරය කියන එකේ ගැඹුරු අර්ථය සළකල බැලුවාම පටිච්චසමුප්පාදය ස්වසන්තානය තුළ දැකීමට අවශ්‍ය ආකල්පයක් ඇති කර ගැනීමයි. එතකොට මෙන්න මේ යෝනිසෝමනසිකාරය මතුකර ගැනීමට උපකාර වන යම් යම් මූල ධර්ම දනටමත් මැජික් දර්ශන, දාම් ක්‍රීඩා ආදී උපමා වලින් ඉදිරිපත් කරල තිබෙනව.

යමක් 'දෙයක්' වන්නේ, යමක වස්තු තත්ත්වය රඳා පවතින්නේ, ඒ දෙයින් කෙනෙකු තුළ හට ගැන්වෙන ප්‍රතික්‍රියා මතයි, ඇතිවන මනෝභාවයන් මතයි, යන මූල ධර්මය අපට පැහැදිලි වුනා, ඒ උපමා කථා වලින්. බාහිර ලෝකයේ අප තියෙන හැටියට සළකන නිමිති සංකේත ආදියට නිමිති තත්ත්වය, සංකේත තත්ත්වය, ලබා දෙන්නේ මේ පුද්ගල සන්තානයේම දීර්ඝ කාලයක් තිස්සේ අනුසය සහිතව මුල් බැස ගෙන තිබෙන රාග ද්වේස මෝහ යන කෙලෙස් බව ඒ මැජික් දර්ශන දාම් ක්‍රීඩා ආදී උපමා කථා වලින් සෑහෙන දුරට පැහැදිලි වෙන්න ඇති. සූචිලෝම සූත්‍රය යෝනිසෝමනසිකාරයට අදාළ කරුණු ඉදිරිපත් කරන සැටි සාකච්ඡා කරමින් සිටියදියි අපට පසුගිය දේශනය නවත්වන්න සිදු උනේ.

රාග, දෝස, අරති, රති ලෝමහංස නම් වූ ලොමු දැහැ ගැන්ම, මනො විතර්ක ආදිය කොතනින් හටගන්නේ ද කියල ඒ සූචිලෝම යක්ෂයා ඇසූ ප්‍රශ්නයට බුදු රජාණන් වහන්සේ දුන්න පිළිතුර ඒව "මෙතනින්" හට ගන්නා බවයි. "කුතො නිදානා, කුතොජා, කුතො සමුට්ඨාය" ආදී වශයෙන් ඒ යක්ෂයා ඇසූ ගාථාවෙ පද වලට බුදුරජාණන් වහන්සේ දුන්නු පිළිතුරු "ඉතො නිදානා, ඉතොජා, ඉතො සමුට්ඨාය". මේ "ඉතො" මෙතනින් කියල කිව්වෙ තමා තුළින් කියන අර්ථයෙන්. ඒක වඩා පැහැදිලි වෙනව ඊළඟට බුදුරජාණන්වහන්සේ දෙසූ ගාථාවෙන්. "සෙනහජා අත්ත සම්භූතා" -'අත්ත සම්භූත' කියන පදයෙන් ඒ කාරණය පැහැදිලි වෙනව. තමා තුළින් හටගත් කියන එකයි. මේ අත්ත සම්භූත ස්වභාවයට නිදර්ශන වශයෙන් බුදු රජාණන් වහන්සේ නුගගසේ අරළුත්, මාලුවා වැලත්, උපමා වශයෙන්

ඒ ගාථාවෙන් දක්වුව. "සෙනෙහජා අත්තසම්භූතා, නිග්‍රොධස්සෙව ඛන්ධජා" - නිග්‍රොධස්සෙව ඛන්ධජා- ඒ කියන්නේ නුගගසේ කඳෙන් එහෙම නැත්නම්, අතු වලින්, පහතට බහින අරළු පොළොවට සවි වෙල වැඩුනට පස්සෙ පළමු නුගගස මොකක්ද කියල හඳුන ගන්න බැරි තරමට ඒකෙ නිදානය, ප්‍රභවය, අප්‍රකට වෙනව. ඒ වගේම තමයි මාලුවා වැලත්. ගහක දෙබලයක පැලවෙන මාලුවා ඇටයක්, මාලුවා වැලක් වෙලා හැදෙන කොට ගහත් මැරනව. එපමණක් නොවෙයි, ඒ මාලුවා වැල ඒ ගස වසාගෙන පැතුරුනාට පස්සෙ කොහෙන් හටගත්තද කියල මූලක් හිතාගන්න බැරි තත්ත්වයක් තිබෙනව. මෙයින් පෙනෙනව අපට සාමාන්‍යයෙන් මේ "අත්ත සම්භූත" ස්වභාවය අප්‍රකටයි. මේව ඇතුළතින්ම හටගන්නා බව ප්‍රකට වෙන්නේ නැහැ, යෝනිසෝමනසිකාරයෙන්ම බැලුවොත් මිසක්. ඒක නිසා ඒක දැක ගැනීම ඉතාම අවශ්‍ය කාරණයක් බවත් බුදුරජාණන් වහන්සේ අවධාරණය කරනව. ඒ බව සූචිලෝම සූත්‍රයේ අවසාන ගාථාවෙන් කියැවෙනව. ඒක ප්‍රතිපදාවට අදාළ වූවක් බවත් පැහැදිලිව ප්‍රකාශ වෙනව.

"යෙ නං පජානන්ති යතො නිදානං - තෙ නං විනොදෙන්ති සුණොහි යක්ඛ
තෙ දුත්තරං ඔඝමිමං තරන්ති - අතිණ්ණපුබ්බං අපුනබ්භවාය"

"යෙ නං පජානන්ති යතො නිදානං" කියල කියන්නෙ අර කියාදුනු රාග දෝස මෝහ අරති රති ලෝමහංස මනෝවිතක්ක ආදී සියල්ලම, යම් තැනකින් හටගන්නව නම් ඒ හටගන්නා තැන, ඒ සියල්ලෙහි ප්‍රභවය, යම් කෙනෙක් හරියාකාරව තේරුම් ගනිත්ද "තෙ නං විනොදෙන්ති" ඔවුහු ඒ සියල්ලම දුරු කරත්. "සුණොහි යක්ඛ" අසව යක්ෂය. "තෙ දුත්තරං ඔඝමිමං තරන්ති, අතිණ්ණපුබ්බං අපුනබ්භවාය" - ඔවුහු පුනර්භවය නැති කිරීම පිණිස එතෙරවීමට දුෂ්කර වූ, මෙතෙක් එතෙර නොවූ, මේ සැඩ වතුරින් එතෙර වෙත්, කියන එකයි ඒ ගාථාවෙ අදහස.

මේ ගාථාවෙ "යතො නිදානං" යන පදය අටුවාවෙ තෝරන්නෙ සමුදය සත්‍යය, තණ්හාව යනුවෙන්. "අත්තසම්භූත" යන පදය අටුවාවෙ තෝරන්නෙ "අත්තනි සම්භූතා" තමා තුළ හටගත්, යනුවෙන්. නමුත් ඒ පදය ගැන වැඩි සැලකිල්ලක් යොමු කරල නෑ අටුවාව. මේ ගාථාවෙ ගැඹුරු අර්ථය මතු කර ගැනීමට නම් අපට මේ අත්තසම්භූත කියන පදය ඉදිරියට ගන්නට සිද්ධ වෙනව. ඒ පදය මේ සූචිලෝම සූත්‍රයට කලින් අප විවරණය කළ සංයුත්ත නිකායෙ කෝසල සංයුක්තයේ එන ගාථාවකත් සඳහන් උනා "ලොභො දොසො ච මොහො ච පුරිසං පාපචෙතසං - හිංසන්ති අත්ත සම්භූතා තචසාරංව සම්ඵලං" ලෝභයත් දෝසයත් මෝහයත් ඇතුළතින්ම

හටගෙන පාප සිතුවිලි ඇති පුද්ගලයාව වනසනව, විනාශ කරනව, නසනව, ඒ පුද්ගලයට හිංසා කරනව. උපමාව දෙන්නෙ කුමක්ද?, "තචසාරංව සමඵලං" උණබට වැනි පොතුහර ගසක් පීදුනාම එහි ඵලය ඒ ගසම විනාශ කරන්නාක් මෙනි. එතකොට එතනත් අත්තසම්භූත කියන පදය සඳහන් වෙනව. දැන් එතකොට අපි මේ 'අත්තසම්භූත' කියන පදයේ වැදගත් කම ගැන ගැඹුරට කල්පනා කරල බලන කොට, අපට පළමුවෙන්ම සිහිගන්ව ගන්න පුළුවනි මේ දේශනා පෙළ ආරම්භයේදීම අපි මහා නිදාන සූත්‍රයේ පටිච්ච සමුප්පාදය විග්‍රහ කරන තැන විඤ්ඤාණ - නාම රූප දෙක අතර පවතින 'අඤ්ඤමඤ්ඤ පච්චය' සම්බන්ධතාව - අන්‍යෝන්‍ය ප්‍රත්‍ය සම්බන්ධතාව - අප තේරුම් කරන්ට උත්සාහ කළේ දියසුළියක උපමාවක් ආශ්‍රයෙන්. දියසුළියක ක්‍රියාකාරිත්වයක් ආශ්‍රයෙන්. මෙන්න මේ අත්තසම්භූත කියන පදයේ බැලූබැල්මට තේරුම නම් "තමා තුළ හටගත්" එහෙම නැත්නම් ආත්මයේ හටගත් කියන එකයි සාමාන්‍ය තේරුම - බැලූබැල්මට අර්ථය. නමුත් ආත්මය හැටියට, තමා හැටියට, ඒකකයක් හැටියට, හිතන මේ ක්‍රියාකාරී කේන්ද්‍රස්ථානය ඇත්ත වශයෙන්ම - ද්වයතාවක් මත පදනම් වූවක්, ද්වයතාවක් අනුව පවතින - ද්වය කියන්නෙ දෙකක්- දෙකක් උඩ පවතින දෙයක් - මෙන්න මේ ආත්මය පිළිබඳ හැඟීම. ඒකයි විඤ්ඤාණ-නාම රූප අන්‍යෝන්‍ය ප්‍රත්‍ය සම්බන්ධතාව කියල ප්‍රකාශ කළේ කලින්නුත්. "විඤ්ඤාණ පච්චයා නාමරූපං - නාම රූප පච්චයා විඤ්ඤාණං" ඊට එහාට යන්නෙ නැහැ. අර විපස්සී බෝසතාණන් වහන්සේ යෝනිසෝමනසිකාරයෙන් තේරුම් ගත්තෙ ඒකයි. මෙතන තියෙන්නෙ එක්තරා විදියක එකතැනම කරකැවිල්ලක්. සංසාරයක්. එතකොට මෙන්න මේ ද්වයතාව අන්‍යෝන්‍යප්‍රත්‍ය සම්බන්ධතාවක් බව වටහා නොගැනීම තමයි මුළාව, අවිද්‍යාව. ඒක වටහා ගැනීම තමයි නියමාකාරයෙන් අර කෙලෙස්වල ප්‍රභවය තේරුම් ගැනීම. මේක වටහා නොගැනීම - හරියට අපි දාම් ක්‍රීඩා උපමාව නැවත මතක් කර ගන්නව නම් - පිල් බෙදීම වගේ. යාලුවෝ දෙන්න හවුල් වෙලයි අර දාම් පෙතත්, ඒකෙ ඉත්තත් එහෙමත් සකස් කර ගත්තෙ. නමුත් ක්‍රීඩාව ආරම්භ කරන්න නම් දෙන්න දෙපිලක් වෙන්න ඕන.

මේ පිල් බෙදීමෙන් පස්සෙ තමයි ඇත්ත වශයෙන්ම ජය පරාජය ගෙන දෙන ඒ ක්‍රීඩාව ආරම්භ වෙල, ඒ සියලු සංස්කාර වැඩිල, ජය පරාජය වශයෙන් ඒ දෙදෙනාට ඒවායේ ප්‍රතිවිපාක ආනිසංස ලබා ගන්න සිද්ධවෙන්නෙ. ඔන්න ඔය විදියෙ ධර්මතාවක් මේක යටින් තිබෙනව. එතකොට අත්තසම්භව කියන්නෙ, මේ අත්තසම්භව තත්ත්වයට පදනමවන මේ ද්වයතාව ඇත්ත වශයෙන්ම අන්‍යෝන්‍ය ප්‍රත්‍යය සම්බන්ධතාවක් බව වටහා නොගැනීම

තමයි අවිද්‍යාව. වෙනත් විදියකින් කියනව නම් මේ විඤ්ඤාණ නාම රූප දියසුළිය හටගැනීමට උපකාරවන සංස්කාර නිපදවන අවිද්‍යාව තමයි මේ කියන අඤ්ඤමඤ්ඤපච්චය සම්බන්ධතාව තේරුම් නොගැනීම. ඒ නිසා තමයි නාමරූප සංස්කාර සම්මර්ශනය කරන්නෙයි කියල ඔය විදර්ශනාවේදී උගන්වන්නේ. ඒක තේරුම් ගත්තාම තමයි මේ දෙකේ ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව කෙනෙකුට වැටහෙන්නෙ. ඔය විදියට අපට හිතාගන්න පුළුවනි. මෙන්න මේ විදියේ පිල්බෙදීමක් මේක යටින් තියෙනව. ඒ විදියට කල්පනා කරන කොට, අර අටුවාවෙ "යතො නිදානං" කියන පදය තෝරන්නෙ තණ්හාව හැටියට, නමුත් ඇත්ත වශයෙන් අපට ගන්න වෙන්නෙ අවිද්‍යාවයි. මේකෙ නිදානය, ඇත්තවශයෙන්ම, නොදැනීමයි. ඒ නිසාම තමයි බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාද ධර්මය දේශනා කරන අවස්ථාවෙ තණ්හාවත් ඉක්මවල එහාට ගියෙ. ගිහිල්ල අවිද්‍යාවයි මුල් තැන තැබුවෙ. මේක අටුවාචාරීන් වහන්සේලාත් බොහෝ විට ගැටලුවක් හැටියට ප්‍රකාශ කරනව. නමුත් නියම කාරණය කුමක්ද? අවිද්‍යාව තණ්හාවට වඩා ප්‍රාථමිකයි. මේ අපි ප්‍රාථමිකයි කියන වචනය යෙදුවේ මූලිකයි කියන එකට. තණ්හාවටත් එහාට හිත විහිදුවල බැලුවාම අවිද්‍යාව. ඒක නිසා තමයි "අවිජ්ජායත්වෙව අසෙස විරාගනිරොධා..." අවිද්‍යාව නැති කළ දාට තමයි අනිත් ඔක්කොම අනිත් පැත්තට හැරෙන්නෙ. එතකොට ඒ අවිද්‍යාව ප්‍රාථමිකයි.

වෙනත් විදියකටත් අපිට මේක තේරුම් කරන්න පුළුවනි. දැන් තණ්හාවට අරමුණ අල්ලා ගැනීම තමයි අපි "උපාදාන" කියල කියන්නෙ. ඇත්ත වශයෙන්ම 'අල්ලාගෙන ඉඳීම' වගේ. එතකොට තණ්හාවෙ අරමුණ අල්ලාගෙන සිටීමට හැකි දෙයක් කියන හැඟීම දෙන්නෙ අන්න අර ද්වයතාව පිළිබඳ ගැඹුරු අවබෝධයක් නැති කමයි. මේකෙ ඇත්ත වශයෙන්ම අල්ලාගන්න දෙයක් තියෙනව කියන හැඟීම යටි සිතේ තිබෙන නිසා තමයි අර තණ්හාවට උපාදාන වශයෙන් අල්ලාගෙන සිටීමට දෙයක් ලැබෙන්නෙ. වස්තු තත්ත්වයක් ඒ දෙයට ලැබෙන්නෙ. මෙන්න මෙහෙම කල්පනා කරල බැලුවත්, අපට පෙනෙනව මේ ද්වයතාව කියන කාරණය - මේකෙ යට තිබෙන අඤ්ඤමඤ්ඤපච්චයතාව තේරුම් නොගැනීම - ඇත්ත වශයෙන්ම මුළු මහත් සාංසාරික පැවැත්මට හේතුවන කාරණයයි. මේ අතතසම්භව කියන වචනය ගැන තව දුරටත් අපි තේරුම් ගන්න උත්සාහ කළොත් ඉතාමත්ම හොඳ වටිනා ගාථාවක් අපට හොයාගන්න පුළුවන් මහා පරිනිබ්බාන සූත්‍රයෙන්. ඒ ගාථාව මහා පරිනිබ්බාන සූත්‍රයේ පමණක් නොවෙයි අංගුත්තර නිකායෙ අට්ඨක නිපාතයෙත්, උදානයේ ජච්චන්ධවග්ගයේත් සඳහන් වෙනව.[2]

"තුලමතුලඤ්ච සම්භවං - භවසංඛාරමවස්සජ්මුනි
අජ්ඣත්තරතො සමාහිතො - අභින්දි කවචමිව අත්තසම්භවං"

ඒ ගාථාව බුදුරජාණන් වහන්සේ දේශනා කළේ, එතන සිද්ධිය වශයෙන් සඳහන් වෙන්නෙ - චාපාල චෛත්‍ය නම් ස්ථානයේදී බුදුරජාණන් වහන්සේ තව තුන්මාසයකින් තථාගත පරිනිර්වාණය වෙනව කියල ආයුසංස්කාරය හැර දැම්ම. ඒ අවස්ථාවෙ පෘථිවිය කම්පා උනා. ඒ භූමිකම්පාවෙන් පස්සෙ බුදුරජාණන් වහන්සේ උදාන ගාථාවක් වශයෙන් වදාළ ගාථාවයි මේ. මේ ගාථාව පෙරපර දෙදිගම උගතුන් බොහෝම ගැටලු ගාථාවක් හැටියට ප්‍රකාශ කරනව. ඒක තේරුම් කර ගන්න අමාරුයි. අටුවාචාරීන් වහන්සේලාත් ඒ විදියටම අර්ථ රාශියක් දෙනව මේ ගාථාව තේරුම් කරන්න ගිහිල්ල. විශේෂයෙන්ම අර ගාථාවෙ මුලින් සඳහන්වෙන "තුලං අතුලං" කියන පද දෙකට අටුවාචාරීන් වහන්සේලා විකල්ප අර්ථ රාශියක් දෙනව. සුමංගල විලාසිනියෙත් මනොරථ පූරණියෙත් ඒව සඳහන් වෙනව.[3]

පළමුවෙන්ම එක අර්ථයක් දෙන්නෙ "තුලං" කියල කියන්නෙ කාමාවචර කර්ම. "අතුලං" කියල කියන්නෙ මහග්ගත, රූපාවචර අරූපාවචර දෙකම. "අථවා" කියල ඊළඟට 'එහෙම නැත්නම්' කියල තව දෙවෙනි තේරුමක් දෙනව. - දෙවෙනි තේරුම හැටියට කාමාවචර රූපාවචර දෙකම "තුලං" කියන වචනයට අල්ලනව. "අතුලං" කියන පදයට අරූපාවචරය අල්ලනව. තුන්වෙනි අර්ථ ක්‍රමයට අනුව තුලං කියල කියන්නෙ අල්පවිපාක, විපාක ටිකක් ඇති, අතුලං කියල කියන්නෙ බොහෝ විපාක ඇති. හතර වෙනි තේරුමකුත් දෙනව. "තුලන්ති තුලෙන්තො තීරෙන්තො අතුලඤ්ච සම්භවන්ති නිබ්බාණඤ්චෙව භවඤ්ච" හතරවෙනි විග්‍රහයේදී තුලං කියන පදය කෘදන්ත පදයක් හැටියට අරගෙන විග්‍රහ කරන්නෙ. තුලං කියන්නෙ 'තුලනය කරමින් තීරණය කරමින්' කියන ක්‍රියා පදයක් හැටියට එතන දක්වනව- ක්‍රියා රූපයක් හැටියට. ඊළඟට අතුලං කියල කියන්නෙ නිබ්බාන. ඉතිං මේ හතරෙන් මොකක් තෝරගන්නවද කියන එක ගැටලුවක්. ඒ මදිවට නෙත්තිප්පකරණයෙ පඤ්ඤත්තිහාර විභංග නිද්දෙසයෙ[4] මේ ගාථාව විග්‍රහ කරන තැන ඊටත් වඩා වෙනස් අර්ථයක් දෙනව. "තුලන්ති සංඛාර ධාතු අතුලන්ති නිබ්බාන ධාතු" තුලං කියල කියන්නෙ සංස්කාර ධාතුව අතුලං කියල කියන්නෙ නිබ්බාන ධාතුව.

අපට පෙනෙන හැටියට මේ ගාථාවෙ අර්ථයට ළං වෙන්න සිදුවෙන්නෙ වෙනත් මාර්ගයකින්. මේ 'තුලං' 'අතුලං' කියන දෙපදය, අප මෙතෙක් මේ දේශනාමාලාවේදී ඉදිරියට ගත්තු අර ද්වයතාව පිළිබඳ මූල ධර්මය නියෝජනය කරන ඇඳුතු පදයක්. 'තුලං-අතුලං' කියන පද දෙකේ තිබෙනව 'සමාන-

අසමාන' කියන අර්ථය. 'සමාන - අසමාන' කියන එක යුගලයක්, ඇඳුතු පදයක්. එකිනෙකට විරුද්ධාර්ථවත් හැටියට පෙනෙන පද දෙකක්. "තුලං අතුලඤ්ච සම්භවං". එතකොට මෙන්න මේ 'තුලං අතුලං' කියන 'සමාන - අසමාන' කියන - ද්වයතාව උඩයි, අත්ත සම්භවය නම් වූ ඇතුළකින් හටගැනීම රඳා පවතින්නෙ. එකිනෙකට ප්‍රතිවිරුද්ධ බව - එහෙම නැත්නම් අර යාලුවෝ දෙන්න විරුද්ධ උනා වගේ දෙයක් දාම් ක්‍රීඩාවෙ. එහෙම නැත්නම් යමක පලු දෙකක්, එකකම අනිත් පලුව හැටියට සළකන්නත් පුළුවන්. එකිනෙකට ප්‍රතිවිරුද්ධ හැටියට සළකන්නත් පුළුවන්. ඔන්න ඔහොම තත්ත්වයක් මෙතන තියෙන්නෙ. එතකොට 'තුලං-අතුලං' කියන මේ 'බෑ-දෙක' -මේ ද්වයතාව-මතයි මේ ආත්ම සම්භවය, අත්තසම්භව නම් වූ මේ ක්‍රියාකාරීත්වය පවතින්නෙ. ආත්මය කියන හැඟීමේ - විපරීත අදහසේ - පදනම එතැනයි. මෙන්න මේ අදහස අපට තවත් පැහැදිලිව ප්‍රකාශ වෙනව සුත්ත නිපාතයේ ගාථා කීපයකින්ම. ඒකට නිදසුන් කව දක්වන්න පුළුවන්. මාගන්දිය සූත්‍රයේ සඳහන් වෙනව ගාථාවක්:

"සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය - මුසාති වා සො විවදෙථ කෙන,
යස්මිං සමං විසමං චාපි නත්ථි - ස කෙන වාදං පටිසංයුජෙය්‍ය"[5]

මෙතන බ්‍රාහ්මණ කියල කියන්නෙ රහතන් වහන්සේටයි. "සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය" ඒ බ්‍රාහ්මණ තෙම - ඒ රහතන් වහන්සේ කුමකට නම් සත්‍යයයි කියන්නේද?. "මුසාති වා සො විවදෙථ කෙන" කුමක් නම් මුසාව යැයි ගෙන විවාද කරන්නේද? එතකොට සත්‍යයත් නෑ මුසාවත් නෑ. මෙතනත් තියෙන්නෙ අර ද්වයතාවමයි. "යස්මිං සමං විසමං චාපි නත්ථි" යමකු තුළ සම - විසම කියන දෙකම නැද්ද" ස කෙන වාදං පටිසංයුජෙය්‍ය" එබඳු ඒ රහතන් වහන්සේ කවරකු සමඟ වාදයට පටලැවෙන්නේද?.

ඒ වගේම අපට තවත් ගාථාවක් හමුවෙනව සුත්ත නිපාතයෙ අත්ත දණ්ඩ සූත්‍රයේ :

"න සමෙසු න ඔමෙසු - න උස්සෙසු වදතෙ මුනි
සන්තො සො වීතමච්ඡරො - නාදෙති න නිරස්සතී"

එතන මුනි කියන්නෙත් රහතන් වහන්සේට. "න සමෙසු න ඔමෙසු-න උස්සෙසු වදතෙ මුනි" ඒ මුනිවරයා තමා සමයන් අතර තබා - තමාට සමාන අය අතර තබා සළකන්නේත් නැහැ. පහත් අය අතර තබා සළකන්නේත් නැහැ. උසස් අය අතර තබා සළකන්නෙත් නැහැ. ත්‍රිවිධ

මානයමයි මේ කියන්නේ. එහෙම පිටින්ම මානය නැති කිරීම නිසාම තමා සමයන් අතර සළකන්නෙත් නැහැ. හීන අය අතර ලා සළකන්නෙත් නැහැ. උසස් අය අතර ලා සළකන්නෙත් නැහැ. "සන්තො සො වීතමච්ඡරො" ශාන්ත වූ, පහකළ මසුරු බව ඇති, ඒ මුනිවරය "නාදෙති න නිරස්සති" මෙන්න හොඳ වචන දෙකක් මෙතෙන්දි අහුවෙනව-"නාදෙති න නිරස්සති" අපට මේකට කියන්න පුළුවන් "ඇදගන්නේත් නැහැ, විසිකරන්නේත් නැහැ. එකනත් පේනව අර ද්වයතාව. මේ අදහසම තුවටක සූත්‍රයේත් ප්‍රකාශ වෙනව. මේ "නාදෙති න නිරස්සති" කියන වචන ගැන විශේෂයෙන් සළකා බලනව නම් තුවටක සූත්‍රයේ, සුත්ත නිපාතයෙ, කියැවෙනව හොඳ ගාථාවක්. උපසමානුස්සතියට පවා වටිනා ගාථාවක්.

"අජ්ඣත්තමෙව උපසමෙ - නාඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය,
අජ්ඣත්තං උපසන්තස්ස - නත්ථි අත්තං කුතො නිරත්තං."[6]

"අජ්ඣත්තමෙව උපසමෙ - නාඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය" - භික්ෂුව අධ්‍යාත්මයම සංසිඳුවා ගන්නේය. අනිකකුගෙන් ශාන්තිය නොපතන්නේය. නොසොයන්නේය. "අජ්ඣත්තං උපසන්තස්ස" ඇතුළත සංසිඳුවා ගත්තහුට "නත්ථි අත්තං කුතො නිරත්තං" ඇදගත්තු දේකුත් නැත. විසිකළ දේකුත් නැත. මේ "අත්තං නිරත්තං" කියන පද දෙක අපට මීට කලින් අවස්ථාවකත් හමුවුනා දුට්ඨට්ඨක සූත්‍රයෙනුත්. "අත්තං නිරත්තං නහි තස්ස අත්ථි" කියල රහතන් වහන්සේට අත්තං නිරත්තං දෙකම නැතෙයි කියල. මෙන්න මේ අත්තං කියන පදය බොහෝ විට තෝරන්නෙ ආත්මය හැටියටයි. ඒ විදියට නිරුක්තිය දීම වැරදියි කියලයි අපේ හැඟීම. මක් නිසාද මේ අත්ත කියල මෙතෙන්ට එන්නෙ අර "නාදෙති න නිරස්සති" කියන එකෙන් පැහැදිලි වෙනව "දා" ධාතුවෙන් එන්නේ. ගැනීම, අරගැනීම කියන අර්ථය දෙන. එතකොට "ආ දාත්ත" කියන පදය එක්තරා විධියක අක්ෂර ලෝපයකින් "ආදාත්ත" ආත්ත වෙනව. ඊළඟ ඒ දීර්ඝ ස්වරය හ්‍රස්ව වීමෙන් - කෙටි වීමෙන් 'අත්ත' වෙනව. එතකොට ආදාත්ත ආත්ත- අත්ත. අන්න ඒක නිසා ආත්මය නොවෙයි මෙතන කියවෙන්නෙ. ඇදගත්ත දේ, අරගත්තු දේ, අල්ල ගත්තු දේ, කියන ඒ අදහසයි. එතකොට මෙන්න මේ "නාදෙති න නිරස්සති" ඇදගැනීම - විසිකිරීම කියන දෙක ගැන කල්පනා කරන කොට අපි කලින් අවස්ථාවක සඳහන් කළ අර ස්වයංක්‍රිය බව - අපි දිය සුළිය ගැන කථා කරන අවස්ථාවේදී එහෙම, ටිකක් නූතන විදියෙ උපමාත් ගත්ත. 'ඔටෝමැටික් යන්ත්‍රයක පවා ඔටෝ බවක් නැත." කියල අපි ප්‍රකාශ කළා. ඒ කියන්නෙ ස්වයංක්‍රිය යන්ත්‍රය කියල අපි ව්‍යවහාර කරන දේක පවා ඇත්ත වශයෙන් බලන කොට ස්වයං බවක් නැහැ. මක්

නිසාද අර ද්වයතාව අනුවයි ක්‍රියාත්මක වෙන්නෙ. දැන් ජල පොම්පයක් ගැන කල්පනා කරල බලන කොට ඒ පොම්පයේ ක්‍රියාකාරිත්වයේ පැති දෙකක් පමණයි ඇදගැනීමත් විසිකිරීමත්. අපි මේක ජලපොම්පයේ දෘෂ්ටි කෝණයෙන් ගත්තාම ඇදගැනීම් සහ විසිකිරීම්, ඒ ඇදගත්තු දේ වැටෙන තැන ගැන කල්පනා කරන කොට එවැනි වචනයි යොදන්න වෙන්නෙ. එතකොට මෙයින් පෙනෙනව අර ක්‍රියාකාරී කේන්ද්‍රස්ථානයක දෘෂ්ටි කෝණයෙන් බලන කොට තමයි ඇදගැනීමයි විසිකිරීමයි කියල සංකල්ප දෙක ඇති වෙන්නෙ. මෙතනම අපට පෙනෙනව මේකට මැදිවෙන මූලාව, මෝහය. ඔන්න දැන් ලෝභ ද්වේශ මෝහ කියන එක තේරුම් ගන්න පුළුවනි. ලෝභ දෝස මෝහ කියන ත්‍රිකෝණයේ මෝහ කෝණයේ ඉඳල විහිදෙන දෙක තමයි ලෝභයයි ද්වේශයයි. ඇදගැනීමයි විසිකිරීමයි කියල අපි ව්‍යවහාර කළාට, එකම ක්‍රියාකාරිත්වයක අංශ දෙකක් පමණයි. ඉතින් මේ හැම එකකින්ම අපට පෙනෙනව ද්වයතාව පිළිබඳ මහ ගැඹුරු ධර්මතාවක්. මේක අටුවාචාරීන් වහන්සේලා වැඩි සැලකිල්ලක් දක්වුවෙ නැති කාරණයක්.

වෙන එකක් තබා අපි කලින් අවස්ථාවක සඳහන් කළ, ධම්ම පදයෙ අමුතු විදියෙ ගාථාව - "යස්ස පාරං අපාරං වා - පාරාපාරං න විජ්ජති." බ්‍රාහ්මණ වග්ගයෙ සඳහන් වෙනව රහතන් වහන්සේට එතෙරකුත් නැහැ, මෙතෙරකුත් නැහැ, එතෙරමෙතෙර දෙකම නැහැ කියල. බැලුවාම මේක මහ පුදුම විදියෙ කියමනක්. ඔන්න ඔහොම තත්ත්වයක් තියෙන්නෙ. දැන් එතකොට මේ කළ විවරණය ආශ්‍රයෙන් අපට පුළුවන් අර අපි සඳහන් කළ ගාථාවට යම්කිසි පිළිගත හැකි අර්ථයක් දෙන්න.

"තුලමතුලඤ්ච සම්භවං - භව සංඛාරමවස්සජි මුනි" මුල් පදයේ අර්ථය ගන්න පුළුවන් මේ විදියට "තුලං අතුලං" - සමාන අසමාන කියන ඒ භේදය ඇති කරන්නාවූ භවසංස්කාරයන් මුනිවරයා හැර දැමීය. බුද්ධ මුනි වරයා 'තුලං-අතුලං' කියන ද්වයතාව හටගන්වන භවසංස්කාර අතහැර දැමීය. "අජ්ඣත්තරතො සමාහිතො- අභින්දි කවචමිව අත්ත සම්භවං" අධ්‍යාත්ම ශාන්තියෙහිම ඇලුනේ, සමාධිමත්ව සන්නාහයක් බිඳලන්නාක් මෙන් ආත්මසම්භවය බිඳ දැම්මේය. මෙන්න මේ සන්නාහය බිඳ දැමීම ඒ ගාථාව දේශනා කළ අවස්ථාවේදී සිදුවුන දෙයක් නොවෙයි. සම්බෝධිය ලැබූ අවස්ථාවෙම සිදුවූ දෙයක්. බෝධිමූලයේදීම සිදුවුන දෙයක් මෙතන මේ ප්‍රකාශ කරන්නේ. මෙහෙම ප්‍රකාශ කරන්නට හේතුව මොකක්ද? බුදු රජාණන් වහන්සේ ආයුසංස්කාරය හැරදම්මේ මාරයා කීප සැරයක්ම ඇවිටිලි කළාට පස්සෙයි. බැලූ බැල්මට මාරයාගේ ඇවිටිල්ලට අවනතව

වගේ බුදු රජාණන් වහන්සේ ආයු සංස්කාරය හැර දමල 'තුන් මාසෙකින් පස්සෙ තථාගත පරිනිර්වාණය වෙනව' 'කියල ප්‍රකාශ කළා. මේක බැලූ බැල්මට මාරයගෙ කීමට යටවීමක් වගෙයි. නමුත් මෙතෙන්දී මේ ගාථාවෙන් ප්‍රකාශ වන්නෙ ඇත්ත වශයෙන්ම මාරයට යට උනා නොවෙයි. මාරයගෙ සන්නාහය වන ආත්ම සම්භව සන්නාහය කලින්ම බිඳල දාල ඉවරයි. ඒක නිසා මාරයගෙ ග්‍රහණයට අහු වෙන්නෙ නැහැ කියන එකයි මෙතනින් ප්‍රකාශ වෙන්නෙ. මෙතන කියවෙන මේ භව සංස්කාරය අතහැරීම සමහර කෙනෙක් ඒ සූත්‍රයෙ ආයු සංස්කාර අතහැරීම කියන අදහසත් එක්ක සම්බන්ධ කරන්න බලනව. නමුත් මේ දෙක දෙකක්. භවසංස්කාර කියල කියන්නෙ භවය ගොඩනඟන සංස්කාර. ඒ භවය ගොඩ නඟන සංස්කාර බුදු රජාණන් වහන්සේ බෝධිමූලයේදීම හැර දැම්ම. අර විඤ්ඤාණ-නාමරූප සංසාර වට්ටය සිඳ දැම්ම. "ඡින්නං වට්ටං න වට්ටති" - අර 'දියසුළි', අර 'ජල පොම්ප', තවත් ක්‍රියා කරන්නෙ නැහැ, ඒ සන්තානයේ. එතකොට ආයු සංස්කාරය කියන්නෙ වෙනම දෙයක්. ආයු සංස්කාරය කියල මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් වෙන්නෙ අර සතර ඉද්ධිපාද භාවිතය නිසා බුදුරජාණන් වහන්සේට තමන් වහන්සේගේ ආයුෂය දීර්ඝකර ගැනීමට තිබුන ශක්තියයි. තිබුන හැකියාවයි. ඒ හැකියාවෙන් ප්‍රයෝජන ගන්නා හැටියට ආනන්ද ස්වාමීන් වහන්සේ නිසි අවස්ථාවේදී ආරාධනා නොකළ නිසා බුදු රජාණන් වහන්සේ චාපාල චෛත්‍ය නම් ස්ථානයේදී ඒ ශක්තිය අතහැරිය. ඒ අතහැරීම ඒ සූත්‍රයේම සඳහන් වෙනව හරියට අර යමක් වමාරා දැම්ම වගේ. "යං ඛො පනෙතං ආනන්ද තථාගතෙන වන්තං චත්තං මුත්තං පහීනං පටිනිස්සට්ඨං ඔස්සට්ඨො ආයුසංඛාරො" ආදී වශයෙන් ඡේදයක් සඳහන් වෙනව. ආනන්ද ස්වාමීන් වහන්සේ වෙලාව පැන්නට පස්සෙයි ආරාධනා කළේ, 'අනේ කල්පයක් වැඩ ඉන්න' කියල. එතකොට 'නැහැ දැන් වෙලාව පහුඋනා මක්නිසාද, ඒක මම දැන් වමාරලා දාලා ඉවරයි. ආයෙත් ජීවිතේ සඳහාවත් මම ඒ වමාරපු ආයු සංස්කාරය තවත් ගන්නෙ නැහැ ඇතුළට' කියල ප්‍රකාශ කළා. එතකොට ආයුසංස්කාරය වෙනමයි භව සංස්කාරය වෙනමයි. දැන් මෙන්න මේ විදියට තේරුවාම අපට පෙනෙනව අපි මෙතෙක් විස්තර කළ මේ ද්වයතාව අඤ්ඤමඤ්ඤ සම්බන්ධතාවක් බව වටහා නොගැනීම නිසයි මේ සියලුම ඇලුම් ගැටුම් මුළාවීම් ලෝකයේ ඇති වෙන්නෙ. අර දාම් ඇදීමට පිල් බෙදුනට පස්සේ තමන් යාලුවෝ දෙන්නෙක් බව අමතක වෙන්න වගේ තත්වයක් මෙතන තියෙන්නෙ. මහ සියුම් ගැටලුවක්. මෙන්න මේ ද්වයතාව, අවබෝධය තුළින්ම ජයගන්න ආකාරය බුදුරජාණන් වහන්සේ භාවනා මනසිකාර ක්‍රමවලින් නොයෙකුත් අවස්ථාවල දක්වල තිබෙනව. ඉතාම හොඳ නිදසුනක් තමයි සූත්‍රාගත ධාතුමනසිකාර ක්‍රමය.

මේ ගැන තරමක් දුරට අපි සඳහන් කරල තියෙනව ධාතු විභංග සූත්‍රය ගැන සාකච්ඡා කළ දේශනයේදී. නමුත් මේ අවස්ථාවේදීත් වඩාත් ප්‍රතිපදාවට එල්ල කරල මේ ධාතු මනසිකාර ක්‍රමය ගැන විග්‍රහ කරතොත් අපට පුළුවන් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ දේශනා කළ මහාහත්ථිපදෝපම සූත්‍රයෙන් ඒ අවශ්‍ය පාඨයත් උද්ධෘත වශයෙන් දක්වන්න. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඒ භික්ෂූන් වහන්සේලාට දේශනා කරනව "කතමා ච ආවුසො පඨවි ධාතු? පඨවිධාතු සියා අජ්ඣත්තිකා, සියා බාහිරා. කතමචාවුසො අජ්ඣත්තිකා පඨවි ධාතු? යං අජ්ඣත්තං පච්චත්තං කක්ඛලං ඛරිගතං උපාදින්නං සෙය්‍යථීදං කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨී අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං යං වා පන අඤ්ඤම්පි කිඤ්චි - අජ්ඣත්තං පච්චත්තං කක්ඛලං ඛරිගතං උපාදින්නං අයං වුච්චතාවුසො අජ්ඣත්තිකා පඨවිධාතු. යා චාවුසො අජ්ඣත්තිකා පඨවිධාතු යා ච බාහිරා පඨවිධාතු පඨවි ධාතුරෙවෙසා. තං නෙතං මම නෙසො හමස්මි නමෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා පඨවිධාතුයා නිබ්බින්දති පඨවිධාතුයා චිත්තං විරාජෙති[7] එහි අදහස: "ඇවැත්නි පඨවි ධාතුව නම් කවරේද? පඨවි ධාතුව ආධ්‍යාත්මිකද විය හැක්කේය. බාහිරද විය හැක්කේය, කිමෙක්ද ඇවැත්නි ආධ්‍යාත්මික පඨවි ධාතුව? 'අජ්ඣත්තං' කියන එක තමා පිළිබඳව කියල කියන්න පුළුවන්. 'පච්චත්තං' කියන එක තමාට විශේෂ වූ කියන අර්ථයෙන් ගන්ට පුළුවන්. මේවට සමහර විට පරිවර්තන ග්‍රන්ථවල බලනව නම් මීටත් වඩා අමාරු පදයි දක්වල තියෙන්නේ. අපි මේ ධර්මය තේරුම් ගන්න ඕන නිසා ටිකක් විස්තර කරන්න බලමු. 'අජ්ඣත්තං' තමා පිළිබඳ 'පච්චත්තං' තමාට විශේෂ වූ 'කක්ඛලං' රළු, 'ඛරිගතං' ගොරෝසු - රළුපරළු - උපාදින්නං - උපාදින්නං කියන එකේ නොයෙකුත් අර්ථ භේද තිබෙන්න පුළුවනි නමුත් වඩාත් සූත්‍ර අර්ථයට අනුව තේරුම් ගත්තොත්, තමාගේ සිරුරට අයත් සේ අල්වාගන්නා ලද කියල කියන්න පුළුවන්. උපාදින්නං - එනම් කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇට මිදුළු, වකුගඩු, හදවත, අක්මාව, බඩදිව, පපුමස, අතුනුබහන්, පැසුනු අහර, මළ, හෝ අනෙකුත් එවැනිම ඒ අජ්ඣත්තං පච්චත්තං ආදී වශයෙන් දක්වන්නට පුළුවන්, තවත් යම්කිසි දෙයක් තිබෙනව නම් ඒ සියල්ලම ආධ්‍යාත්මික පඨවිධාතු වශයෙන් සළකන්නට පුළුවනි. බාහිර පඨවිධාතුව කියන එක ගැන අමුතු විස්තර අවශ්‍ය නැති නිසාම සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරල නැහැ. ඒක ඕන කෙනෙකුට තේරුම් ගන්න පුළුවනි. සිරුරේ තිබෙන දේවල් හැර අනෙකුත් බාහිර දේවල්. මෙන්න මෙතන කියැවෙන මේ වාක්‍ය ඉතා වැදගත්. "යා චාවුසො අජ්ඣත්තිකා පඨවිධාතු යා ච බාහිරා පඨවි ධාතු

පඨවිධාතුරෙවෙසා". මෙන්න මේ වාක්‍යයයි ඉතාමත්ම වැදගත් වෙන්නෙ. ඇවැත්නි යම් මේ ආධ්‍යාත්මික පඨවිධාතුවක් වේද, යම් බාහිර පඨවි ධාතුවක් වේද, මේ දෙකම හුදු පඨවි ධාතුවමයි. මේ දෙකම එකයි කියන එකයි. "පඨවි ධාතු එව එසා" දෙකම ඇත්ත වශයෙන්ම පඨවි ධාතුවමයි. පඨවි ධාතුව හැටියට සළකන විට දෙකම එකයි. "තං න එතං මම" "න එසො හමස්මි" "න මෙසො අත්තා" ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං" අන්න එබඳු ඒ පඨවිධාතුව 'මෙය මගේ නොවෙයි' 'මෙය මම නොවෙමි' 'මෙය මගේ ආත්මය නොවෙයි' යනුවෙන් සම්‍යක් ප්‍රඥාවෙන්- මනා ප්‍රඥාවෙන්- දැකිය යුත්තේය. යථාභූත වශයෙන් ඇති තතු පරිදි දැකිය යුත්තේය. "එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා පඨවිධාතුයා චිත්තං විරාජෙති. "මෙසේ යථාභූත වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දැකල පඨවි ධාතුව පිළිබඳව කලකිරෙනව. නිබ්බිදාව ඇති කර ගන්නව. "පඨවි ධාතුයා චිත්තං විරාජෙති" පඨවි ධාතුවෙන් සිත් මෑත් කරගන්නව. මේ 'විරාජෙති' කියන පදයෙත් එක්තරා අර්ථ ඡායාවක් තිබෙනව. අපි කලින් අවස්ථාවකත් සඳහන් කළා, සාමාන්‍යයෙන් අපි නොඇල්ම කියන අදහසින් විරාග කියන පදේ තේරුන්නෙ. තවත් මේකෙ අර්ථ ඡායාවක් තියෙනව හරියට අර වර්ණයක් සේදීයාම, පාට මැකීයාම වගේ අර්ථයකුත් දෙනව. ඒකට නිදසුනක් අපි කලින් අවස්ථාවක සඳහන් කළා. "පීතියා ච විරාගා" ප්‍රීතියේ ගෙවී යාමක් කියල ගන්න පුළුවන්. 'අවිජ්ජා විරාගා' ආදී ඒ පද යොදන්නෙ අන්න අර විරාග කියන පදයෙ තියෙන විශේෂ අර්ථඡායාව නිසයි.

දැන් මෙතනදිත් අපට කියන්න පුළුවන් පඨවි ධාතුව සිතේ ඇඳිල තියෙනවනම් ඒ සායම මකා හැරීම වගේ දෙයක් මෙතනින් කෙරෙන්නෙ- නිබ්බිදාව මඟින්. එතකොට ඇතුළත පඨවි ධාතුවත් බාහිරව ඇති පඨවි ධාතුවත් එකක්ම හැටියට අර ගැනීමෙන් - හුදු පඨවි ධාතුව වශයෙන් සැළකීමෙන් සිදුවන්නේ කුමක්ද? තණ්හා මාන දිට්ඨි වලට ඇති පදනම බිඳ වැටෙනව. තණ්හා වශයෙන් යමක් අයත් කරගන්න දේ වෙනම තියෙන්න ඕන, මා වෙනම සිටින්න ඕන. "එතං මම" කියල කියන කොටම එතැනට ද්වයතාවක් උපන්‍යාස වශයෙන් යටින් තියෙනව. "එතං මම" කියල "මෙය මගේය" කියල - කියන කොට මා වෙනමයි මගේ දේ වෙනමයි. "එසො අහං අස්මි". ඒ මාන වශයෙන්. තණ්හාවට අර විදියට. මානය ගැන හිතනකොටත් ඒත් එහෙමයි. "එසො අහං අස්මි" මෙය මම වෙමි, දැන් කණ්නාඩියකින් මූන බලන කොට මේ මමය කියල කියන කොට, එතැන අර කණ්නාඩියෙ තියෙන පිළිබිඹුව එකක්, තමා කියල ගන්න එක වෙනමයි. ඔන්න ඔය විදියෙ මහ පුදුම පටලැවිල්ලක් මෙතන

තියෙන්නෙ. එතකොට මෙතනින් අපි බලාපොරොත්තු වෙන්නෙ ඒකෙ විරුද්ධාර්ථයයි. "එතං මම" කියල ගන්නෙ නැහැ. "එසො හමස්මි" 'මෙය මම වෙමි' කියල ගන්නෙත් නැහැ. "එසො මෙ අත්තා" 'මෙය මගේ ආත්මය' කියල ගන්නෙත් නැහැ. එහෙම නොගන්නෙ මක් නිසාද? අර දෙකම එකයි. මෙතන මනින්න බැහැ. මනින්න ඉඩක් නැහැ. වෙන් කරන්න ඉඩක් නැහැ. ඔන්න ඔය විදියට මෙයින් අපට පෙනෙනව මෙතනින් කෙරෙන්නෙ එක්තරා විදියකට පිල්බෙදීමක් නැති කිරීමයි. පිල්බෙදීම නැතිවෙනකොට දාම් ඇදීමකුත් නැහැ. ඇත්ත වශයෙන්ම 'උපාදින්න-අනුපාදින්න' දෙක අතර තිබෙන්නෙ එක්තරා විදියක දාම් ඇදීමක්. දාම් ඇදිල්ලක් තිබෙන්නෙ. 'උපාදින්න-අනුපාදින්න' කියල අපි ගත්තොත් ශරීරයට අයත් වූ පඨවි ආපො තේජො වායො කියන ධාතු හතරත් ශරීරයෙන් පිට තියෙන ආහාර පානාදියෙත් අවට වාතාවරණයෙ එහෙමත් තිබෙන පඨවි ආපො තේජො වායො කියන ඒ හතරත් ගත්තොත්, මේ දෙක අතර තියෙන්නෙ එක්තරා විදියක දාම් ඇදිල්ලක්. මේ දාම් ඇදිල්ල නිසා තමයි කායික වශයෙන් වා පිත් සෙම් කෝප එහෙම ඇති වෙන්නෙ. තුන් දොස් කිපීමක් ඇතිවෙන්නෙ. මානසික වශයෙන් ලෝභ දෝස මෝහ- රාග දෝස මෝහ ආදී වශයෙන් ඒ තුන්දොස් කිපීමකුත් සිදු වෙනව. මේ ඔක්කොම සිදු වෙන්නෙ මේ 'දෙක හැටියට' ගැනීමෙන්. අන්න ඒ කියන ද්වයතාව යට තියෙන අන්‍යෝන්‍ය ප්‍රත්‍යය සම්බන්ධතාව වටහා ගෙන මේ භේද සමහන් කිරීමයි එතකොට යෝගාවචරයාට කරන්ට වෙලා තිබෙන කාර්යය. මේ දෙක අතර තිබෙන මේ පරතරය අහක් කළාම ප්‍රශ්නයක් නැහැ. එතන කොටින්ම කියනවා නම් ප්‍රශ්නයක් නෑ. හිත උපේක්ෂාවෙ. දන් ධාතු මනසිකාරය උපේක්ෂාව වඩා ගැනීම සඳහා පාවිච්චි කරන බව අපි සාමාන්‍යයෙන් ප්‍රකාශ කරනව. නමුත් මේකෙ ඇතුළෙ තිබෙන අදහස මොකක්ද කියන එක කල්පනා කරන්නෙ නැහැ. මේ ශරීරයේ කෙස් ලොම් නිය දත් සම් ආදී ඒ එක් එක් දේවල් වලට අප දුන්න විශේෂ වැදගත් කමක්, විශේෂ වටිනාකමක් තිබෙනව. ශරීරයේ බාහිරව පෙනෙන සමහර දේවල් වලට අපි විශේෂ ඇල්මක් දක්වනව. පිරිසිදුව තබා ගන්න උත්සාහ කරනව. ඇතුළත තිබෙන දේවල් හංග ගෙනම ඉන්න උත්සාහ කරනව. බඩවැල් ආදිය අතුණු බහන් ආදිය. එතකොට මේ ඔක්කොම නිර්විශේෂ වශයෙන් ගත්තහම පඨවි, ඔක්කොම පඨවි, කියල ගත්තහම එතැන තියෙන්නෙ උපේක්ෂාවක්. අප හොඳ හැටියට මනාප හැටියට සළකන දේවල් වලට ඇලීමකුත් නැහැ. අසුචි ආදී දේවල් පිළිබඳව පටිඝයක් අමනාපයකුත් නැහැ. ඔන්න ඔය විදියටයි එතකොට ධාතුමනසිකාරයෙ නියම ගැඹුරු අර්ථය තිබෙන්නෙ. මේ ධාතු හතරට දාල ගත්තහම උපේක්ෂාවටයි හිත යොමු වෙන්නෙ.

මේක වඩාත් පැහැදිලිවෙනව සතිපට්ඨාන සූත්‍රයේ ධාතු මනසිකාර පබ්බයෙන්. "පුන ච පරං භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං යථාඨිතං යථා පණිහිතං ධාතුසො පච්චවෙක්ඛති අත්ථි ඉමස්මිං කායෙ පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු. සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා ගාවිං වධිත්වා චාතුම්මහාපථෙ බිලසො පටිවිභජිත්වා නිසින්නො අස්ස....." ආදී වශයෙන් ඒ ධාතු මනසිකාරය පිළිබඳව ප්‍රකාශ කෙරෙන්නෙ සතිපට්ඨාන සූත්‍රයේ. නැවතද ඒ මහණෙනෙම මේ කය, "යථා ඨිතං යථා පණිහිතං" මෙතැනත් වැදගත් වචන දෙකක්. කය 'ඔහේ තිබෙන හැටියටම.' මේව අණුදක්න ඇතුළට දාල පරමාණු විග්‍රහයක් නොවෙයි මෙතන කෙරෙන්නෙ, මේ තියෙන හැටියටම - "යථා ඨිතං යථා පණිහිතං" ශරීරය ඔහේ සිටි ආකාරයන්ම, පිහිටි ආකාරයෙන්ම, ධාතු වශයෙන් මෙනෙහි කරනව. ප්‍රත්‍යවේක්ෂා කරනව. මේ කයෙහි පඨවි ආපෝ තේජෝ වායෝ කියන ඒ ධාතු හතර තියෙනව. ඇත්ත වශයෙන් මෙතන කෙටියෙනුයි සඳහන් වෙන්නෙ. මේව අනිත් සූත්‍ර වල විස්තර වශයෙන් ප්‍රකාශ කෙරෙන නිසා, - මේවාට ශරීරයෙන් ගත යුතු නිදසුන්. එතකොට මෙන්න මේ ධාතු හතර හැටියට දකිනව. මෙතන උපමාවෙත් විශේෂත්වයක් තිබෙනව. හරියට අර ගවයින් මරන්නෙක් හෝ ඔහුගේ අත වැසියෙක් හෝ එළදෙනක් මරල කැබලි සිව් මහා සන්ධියක තබාගෙන විකුණන්න ලෑස්ති වෙල ඉන්න කොට අර ගව දෙනක කියන ඒ සංඥාව නැහැ. ඒ වගේම මේ මස් මොන දෙනකගෙන් ආවද, කොහෙන් ආවද, කියන හැඟීමකුත් නැහැ. මේව මස්කැබලි, කියන සංඥාව විතරයි තිබෙන්නෙ. අන්න ඒ විදියෙ නිර්විශේෂත්වයකින්, එකක් අනිකකින් වෙන් කරනොගෙන තනිකර ඒ ධාතු හතරටම දම්මාම හිත ඉබේටම උපේක්ෂාවටයි නැඹුරු වෙන්නෙ. උපාදින්න අනුපාදින්න අතර තිබෙන පිල් බෙදීම වගේම තවත් පිල් බෙදීමක් තිබෙනව. ඒකත් මෙන්න මේ සතිපට්ඨාන සූත්‍රයෙ අප කලිනුත් සාකච්ඡා කළා. ඒ පිල් බෙදීම තමයි තමා සහ අනුන් පිළිබඳ පිල් බෙදීම. ඒක නිසා තමයි ඔය ධාතු මනසිකාර පබ්බය අවසාන වෙනකොට "ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති", මෙසේ තමාගේ කයෙහි හෝ කය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ කයෙහි හෝ කය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේ සහ අනුන්ගේ කයෙහි හෝ කය අනුව බලමින් වාසය කරන්නේය. තමා සහ අනුන් කියන එකනත් පෙනෙන්නෙ අර දෙගොල්ලම එකයි කියන එක වගෙයි. අර ද්වයතාවට පහරයි දෙන්නෙ මෙතන. තමාගේ කියන්නේත් මේ ධාතු හතර, අනුන්ගේ කියන්නේත් මේ ධාතු හතර. "යථා ඉදං තථා එතං - යථා එතං තථා ඉදං"[8] කියන මූලධර්මය ප්‍රත්‍යක්ෂ වෙනතාක් තමයි

මෙන්න මේ කියන සම්මර්ශනය කෙරෙන්නෙ. 'මෙය යම්සේද එයත් එසේය, එය යම්සේද මෙයත් එසේය.' ඉතින් මෙයිනුත් අපට පැහැදිලි වෙනව - සතිපට්ඨාන සූත්‍රයේ තිබෙන මේ විග්‍රහයෙනුත් - අපේ සිත් පවතින්නේ නානත්වයේ ගැලිලයි. බාහිර ලෝකයේ වර්ණ අනුව අප ඒ ඒ දේට නම් දීල සංකල්ප හැටියට ඒව වෙන් වෙන් කරල දක්වනව. ඒක හිතට මහ වදයක්. ඒ නානත්ව සංඥාවෙන් සිත ඒකත්ව සංඥාවට ගෙන ඒමට පියවරක් හැටියට ගන්න පුළුවන් මේ ධාතු මනසිකාරය. මෙතැන තියෙන්නෙ ධාතු හතරක් පමණයි. හිත බොහොම සැහැල්ලුයි එතකොට. ඔන්න ඔය විදියට එතකොට සතිපට්ඨාන සූත්‍රයේත් අර ගැඹුරු අර්ථය අපට මතු කර ගන්න පුළුවනි. මෙයින් අපට පේනව මේ සූත්‍රාගත මනසිකාර ක්‍රමයේ මූලික පරමාර්ථය "ධාතුයො සුඤ්ඤතො පස්ස" කියන බුද්ධ අවවාදයට අනුව ධාතූන් ශූන්‍ය වශයෙන් සැළකීමයි. "ධාතූන් ශූන්‍ය වශයෙන් බලව" කියන ඒ බුද්ධාවවාදයට අනුව මේ ධාතූන්ගේ ශූන්‍යත්වය වටහා ගැනීමයි - මේ පඨවි ආපො තෙජෝ වායො කියන ධාතූන්ගේ ශූන්‍යත්වය වටහා ගැනීමයි, ඒ සූත්‍ර ධර්මයේ එන ධාතුමනසිකාර ක්‍රමයේ පරමාර්ථය.

නමුත් යම්කිසි හේතුවක් නිසා- සමහර විට භෞතික වාදයට නැඹුරුඋන භාරතීය දර්ශනවල බලපෑම නිසාදෝ - මෙන්න මේ කියාපු සරල ධාතු මනසිකාර ක්‍රමය වෙනුවට සංකල්ප විතර්ක මගින් මේ පඨවි ආපො තෙජෝ වායො ධාතු හතර හිතේ පැළපදියම් කර ගැනීමට කරන උත්සාහයක් වැනි ශාස්ත්‍රීය පර්යේෂණ යම් යම් නිකාය වල ඇති වෙන්න පටන් ගත්ත, නිකායයන් පැන නඟින කොට. ඉස්සෙල්ල බලාපොරොත්තු උනෙ මේ පඨවි ආදී ධාතූන් සිතෙන් මකා දැමීම. අතිදීර්ඝ කාලයක සිට, අනාදිමත් කාලයක සිට, සත්ත්ව සන්තානයේ ඇදිල තියෙන පඨවි ආපො තෙජෝ වායො කියන මේ භූතයන් හතර දෙනාගෙ රූප මකල හැරීමයි මුලින් තිබුන පරමාර්ථය. නමුත් පසු වෙන කොට හරියට අර භෞතිකවාදී දර්ශන වල පරමාණුවාදයට අනුව කෙරෙන විග්‍රහ වගේ මේව බෙදන්න පටන් ගත්ත-කෙස් පලන තර්ක. වාච්‍යාර්ථය අනුව බලන කොටත් - කෙස් පලන තර්ක වලින් මේ පඨවි ධාතුව සිතේම තව තවත් පැලපදියම් කරගන්න, හොඳට පින්තාරු කර ගන්න, දරුණු උත්සාහයක් බවට පත් උනා, මේ ශාස්ත්‍රීය පර්යේෂණ. මේ ගැන අපට ටිකක් කල්පනා කරල බලන්ට සිද්ධ වෙනව. සමහරවිට ආචීර්ණ කල්පයෙනුත් ටිකක් ඈත් වෙලා. මෙන්න මේක නිසා ඇත්ත වශයෙන්ම අර නිවන් මඟ ඇහිරෙන තත්ත්වයක් පවා ඇති වුනයි කියල කියන්න පුළුවනි.

බුදු රජාණන් වහන්සේගේ 'පර්යේෂණය' ඒ වගේ දෙයක් නොවෙයි. ධාතු හතර පිළිබඳ පර්යේෂණය ඒ විදියේ දෙයක් නොවෙයි. සංයුක්ත[9]

නිකායෙ නිදාන සංයුක්තයේ සඳහන් වෙනව බුදු රජාණන් වහන්සේ මේ පඨවි ආදී ධාතූන් හතර පිළිබඳව කළ පර්යේෂණයේ ප්‍රතිඵල. "පඨවි ධාතුයා අහං භික්ඛවෙ අස්සාදපරියෙසනං අචරිං. යො පඨවි ධාතුයා අස්සාදො තදජ්ඣගමං. යාවතා පඨවි ධාතුයා අස්සාදො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. පඨවි ධාතුයා අහං භික්ඛවෙ ආදීනවපරියෙසනං අචරිං. යො පඨවි ධාතුයා ආදීනවො තදජ්ඣගමං. යාවතා පඨවි ධාතුයා ආදීනවො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. පඨවි ධාතුයා අහං භික්ඛවෙ නිස්සරණ පරියෙසනං අචරිං. පඨවි ධාතුයා නිස්සරණං තදජ්ඣගමං. යාවතා පඨවි ධාතුයා නිස්සරණං පඤ්ඤාය මෙ තං සුදිට්ඨං" මේකෙ තේරුම- "මහණෙනි, මම පඨවි ධාතුවෙහි ආස්වාද පර්යේෂණයෙහි හැසිරුනා. ආස්වාදය සොයමින් ගමන් කළා." යො පඨවි ධාතුයා අස්සාදො තදජ්ඣගමං" පඨවි ධාතුවෙහි යම් ආස්වාදයක් වේද ඒක මම ලබා ගත්ත. 'යාවතා පඨවිධාතුයා අස්සාදො පඤ්ඤාය මෙසො සුදිට්ඨො' යම්තාක් පඨවිධාතුවෙහි ආසවාදයක් වේද ඒක මම ප්‍රඥාවෙන් අවබෝධ කර ගත්ත. ඒ වගේම "පඨවි ධාතුයා අහං භික්ඛවෙ ආදීනව පරියෙසනං අචරිං" මහණෙනි මම පඨවි ධාතුවේ ආදීනව සොයමින් ගියා. මේ මුළු මහත් සංසාරයේම කළ පර්යේෂණයක්, ඒක ජීවිතයක නොවෙයි. "යො පඨවි ධාතුයා ආදීනවො තදජ්ඣගමං" -පඨවි ධාතුවේ යම් ආදීනවයක් වේද මම ඒක ලබා ගත්ත. මම ඒක දැන ගත්ත. "යාවතා පඨවි ධාතුයා ආදීනවො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො" යම් තාක් පඨවි ධාතුවේ ආදීනව පක්ෂයක් වේද ඒක මම ප්‍රඥාවෙන් අවබෝධ කර ගත්ත. "පඨවි ධාතුයා අහං භික්ඛවෙ නිස්සරණ පරියෙසනං අචරිං" මහණෙනි මම පඨවි ධාතුවෙන් නික්මීම සොයාගෙන ගියා. "යං පඨවි ධාතුයා නිස්සරණං තදජ්ඣගමං" පඨවි ධාතුවෙන් නික්මීමක්, නිස්සරණයක් වේද එය මම ලැබ ගත්ත. "යාවතා පඨවි ධාතුයා නිස්සරණං පඤ්ඤාය මෙතං සුදිට්ඨං" පඨවි ධාතුවෙහි යම්තාක් නිස්සරණයක් වේද එය මම ප්‍රඥාවෙන් දැක ගත්ත."

ඔන්න ඕකයි බුදු රජාණන් වහන්සේ මේ ධාතු හතර පිළිබඳව කළ පර්යේෂණය. පඨවි ධාතුව වගේම අනෙක් ධාතූන් පිළිබඳවත් මේ විදියටම සඳහන් වෙනව, මේ සූත්‍රයේ. මෙතන මේ 'අස්සාද' කියල ප්‍රකාශ කළේ - ඒක ඒ සූත්‍රයේම සඳහන් වෙනව- පඨවි ධාතුව නිසා ඇතිවන සුඛ සෝමනස්ස දෙක. පඨවි ධාතුව කරණකොට ගෙන සැප සොම්නස් වේද අන්න ඒකයි ආස්වාදය - "අස්සාද" කියල ප්‍රකාශ කළේ. පඨවි ධාතුවේ යම් අනිත්‍යතාවක්, ක්ෂයවන, වැයවන, වෙනස්වන ස්වභාවයක් ඇද්ද එයයි ආදීනවය. නිස්සරණය හැටියට ප්‍රකාශ කළේ පඨවි ධාතුව පිළිබඳ ඡන්ද රාගය නැති කිරීමයි. ඡන්ද රාග ප්‍රහාණයයි. මෙන්න මේ පර්යේෂණයේ

ප්‍රතිඵල අනුවයි බුදුරජාණන් වහන්සේ අපට වෙන එකක් තබා සිවුපස පරිභෝගය පවා දක්වා වදාළේ. ඒක හොඳට ප්‍රකාශ වෙනව අරියවංස සූත්‍රයේ[10] එහෙම. සිවුපස පරිභෝගය පිළිබඳව එහෙම සඳහන් වෙන තැන පාඨ කීපයක් සඳහන් වෙනව" ලද්ධා ච පිණ්ඩපාතං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති" එතන අර අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො" කියන්නෙ තෘෂ්ණාවෙන් ලෝභයෙන් ගිජුකමෙන් නොබැඳී, එයින් තුමූළාව, එයට යට නොවී. එයින් අපට පෙනෙනව ඒකෙ ආස්වාද පක්ෂය. ඒ ආස්වාද පක්ෂයෙන් බේරෙන එකයි. ඊළඟට ආදීනව දස්සාවී" ඒකෙ ආදීනවත් තේරුම් අරගෙන-සාමාන්‍යයෙන් වැඩිපුර ආහාර ගැනීම පමණක් නෙවෙයි ඒ ආහාර නිසා ඇතිවිය හැකි තව නොයෙකුත් ආදීනව තියෙනව. ඒ වගේම "නිස්සරණපඤ්ඤො" - මේ ආහාරය ගන්නෙ ආහාරය නැතිකිරීම සඳහායි. වෙන විදියකින් කියනව නම් "ආහාරං නිස්සාය ආහාරං පජහථ" කියල ප්‍රකාශ කළා. ආහාරයම පිහිට කරගෙන ආහාරය අතහරින්නයි බුදු රජාණන් වහන්සේ අපට උපදෙස් දෙන්නෙ. අන්න ඒ විදියට "නිස්සරණපඤ්ඤො" ආහාරයෙන් මිදීම සඳහා ආහාර ගන්නෙ. මේකත් බැලුවාම, අර කලින් කියාපු ප්‍රහේලිකා කියමන් වගේ, ගැඹුරු අදහසක්.

මෙයින් අපට පේනව, මෙන්න මේ ධාතු මනසිකාරයේ මූලික අදහස කුමක්ද, පසු කාලයක මේක කොයි පැත්තට ද වැටුනේ කියල. සංඥාව කියන එක මිරිඟුවක්. මේ මිරිඟුව ඔස්සෙ දුවන්න වගේ සංකල්ප විතර්ක මඟින් මේ ධාතූන් හතර ඔස්සෙ සොයන්න යෑම ඇත්ත වශයෙන්ම භෞතික විද්‍යාඥයින්ට අයිති දෙයක්. මෙතන උවමනා කරන්නෙ මේ අති දීර්ඝ සංසාරයේ පඨවි ආපො ආදී මේ ධාතු හතර නිසා සත්ත්වයා තුළ ඇඳී තිබෙන රූප සංඥාවෙන් මිදීමයි. රූප සංඥාව මකා දැමීමටයි බුදු රජාණන් වහන්සේ හැම ක්‍රමයක්ම අපට උගන්වා වදාළේ. මේ පඨවි ආපො තෙජො වායො කියන මහා භූත ධර්ම හතර නිසා අප තුළ තිබෙනව එක්තරා රූප සංඥාවක්. ඒ රූප සංඥාව නිසා තමයි නිමිති ගන්නෙ. ඒ හතරම ඇත්ත වශයෙන්ම අනිත්‍යයි. නමුත් ඒව නිසා ඇති කර ගත්තු රූප සංඥාවල් අපේ සිත්වල පැලපදියම් වෙලා තියෙනව. ඉතාමත්ම ඈත සංසාරයේ ගත්තු නිමිති තමයි සමහර කෙනෙක් ඔය ඇලුම් හෝ ගැටුම් හැටියට අරගෙන දීර්ඝකාලයක් මේ සංසාරයේ වඩන්නෙ. වෙන විදියකින් කියනව නම් විතර්ක ප්‍රපංච. විතර්ක ප්‍රපංච වැඩෙන්න පටන් ගන්නෙ මෙන්න මේ රූප සංඥාව නිසයි. වෙන විදියකට කියනව නම් වර්ණ සණ්ඨාන ආදිය අනුව, ඒ කියන්නේ ඒවායෙ වර්ණය අනුව, හැඩරුව අනුව, අපි එකක් තව එකකින් වෙන් කරගෙන ඒකට නමක් එහෙමත්

දාගෙන ඇලුම් බැඳුම් වටිනාකම් ආදියෙන් ඒක තවත් සිතේ පැලපදියම් කරගෙන ඒ විදියෙ නිමිති ඇතිකර ගන්නව හිතේ. ඒවටම තමයි අර සඤ්ඤා අනුසය කියල කියන්නෙ. මධුපිණ්ඩික සූත්‍රයේ එහෙම සඳහන් උනා "සඤ්ඤා නානුසෙනති" කියල. රහත් සිතෙහි සංඥාවන් අනුසය වශයෙන් පවතින්නෙ නැහැ. නමුත් නොරහත් සිතෙහි යම්කිසි ප්‍රමාණයකට මේ සංඥා අනුසය වශයෙන් පවතිනව. සඤ්ඤා අනුසය පිහිට කරගෙනයි විතර්ක ප්‍රපංච වඩමින් තම තමන්ම සංසාරයේ දුක් වවාගන්නෙ. මෙන්න මේ නිමිති සිතින් ගිලිහී යාමට නම් මේ පඨවි ආදී ධාතූන් හතරේ අර ආදීනව පක්ෂය අවධාරණය කරන්ට සිද්ධ වෙනව. අන්න ඒක නිසා තමයි බුදු රජාණන් වහන්සේ බොහෝ අවස්ථාවල්වල - බොහෝ සූත්‍රවල - මේ පඨවි ආදී ධාතූන්ගේ අනිත්‍යතාව ගැන සංසයාට ප්‍රකාශ කළේ. අමුතු පරමාණු වාදයක් දේශනා කරන්න නොවෙයි ඒක කළේ.

දැන් මේකට ඉතාමත්ම හොඳ නිදසුනක් අපට සමහර සූත්‍ර වලින් දක්වන්නට පුළුවනි. බුදුරජාණන් වහන්සේ මේ පඨවි ආදී ධාතූන්ගේ අනිත්‍යතාව ප්‍රකාශ කළේ මේ භවනාටකයේ ඇති නිස්සාරත්වය තේරුම් කිරීමටයි. මේ භව නාටකයක් මවන රූප සංඥාව සත්ත්වයාගේ සිත්වලින් මකාහැරීමටයි. දැන් සංස්කාර කියන වචනය අපි නිතරම ව්‍යවහාර කරනව. නමුත් ඒකට තවත් අර්ථයක් අපි අර සිනමා නාට්‍ය දර්ශන ආදී උපමා දක්වන අවස්ථාවේ ප්‍රකාශ කළා. සංස්කාර කියල කියන්න පුළුවන් නාට්‍යයක සැරසිලි අර ඇඳීම් ආදී සියල්ලටම. එතකොට බුදුරජාණන් වහන්සේ මේ මහ පොළොවෙ කථාන්තරය සමහර සූත්‍ර වල දේශනා කරල තිබෙනව. ඒක නූතන විද්‍යාඥයින් කරන්න වගේ විද්‍යාත්මක ගවේෂණයක් නොවෙයි. මේ මහපොළොව ඇතිවුන හැටි, මේක විනාශ වෙන හැටි, එහෙම ප්‍රකාශ කළේ අපේ මේ රඟපෑම් වලට - මේ සංසාරයේ කරන රඟපෑම් වලට-වේදිකාව වශයෙන්, එහෙම නැත්නම් වේදිකා සැරසිලි වශයෙන්, තිබෙන මේ මහ පොළොවේ ඇති අනිත්‍යතාව පෙන්වාදීමෙන් ඒ ගැන නිබ්බිදා විරාගයක් ඇති කිරීමයි අදහස. මේ මහ පොළෝ වේදිකාවේ පෙන්නුම් කරන මේ නාටකයේ තියෙන සංස්කාර අපේ සිත් වලට බොහොම තදින් කා වදිනව. සඤ්ඤා අනුසය වශයෙන් කාවදිනව. ඒ නිසා තමයි මේ භවයක් වැඩෙන්නෙ, ක්‍රම ක්‍රමයෙන් භවයක් වැඩෙන්නෙ. අන්න ඒක කැඩීමටයි බුදු රජාණන් වහන්සේ යම් යම් සූත්‍ර වල මේ මහ පොළොවෙ කථාන්තරය අපට ඉදිරිපත් කරල තියෙන්නෙ.

දැන් හොඳ නිදර්ශනයක් අග්ගඤ්ඤ සූත්‍රය.[11] මේ අග්ගඤ්ඤ සූත්‍රයේ දක්වෙන හැටියට කල්පාරම්භයේදී ළදරු පොළොව-ළදරු පෘථිවිය

තනිකරම අන්ධකාරයේ ගැලුනු, ජලයෙන් වැසුනු එකක්. ඒ කාලයේ හිටියෙ ආභස්සර ලෝකයෙන් චුතව මේ පෘථිවියෙ පහළවුනු සත්ත්වයින් විශේෂයක්. ඔවුන්ට ස්ත්‍රී පුරුෂ භේදයක් නෑ. "මනොමයා පීතිභක්ඛා සයංපභා අන්තලික්ඛචරා" ආදී වශයෙන් දක්වනව. මනෝමය කයක් ඇති, ප්‍රීතිය ආහාර කරගත්, තමන්ගේම ශරීර ආලෝකයෙන් ගමන් කරන සත්ත්ව විශේෂයක් මුල් අවස්ථාවෙ හිටියෙ. මේ මහ පොළොවත් තනිකරම ජල පොළොවක් වගේ. වර්ෂ කෝටි ප්‍රකෝටි ගණනක් ගෙවුනට පස්සෙ මේ මහ පොළොවෙ රසවත් යොදය ඇති කිරි යොදයක් වැනි දෙයක් පහළ වුණු බව සඳහන් වෙනව. බුදු රජාණන් වහන්සේ සඳහන් කරනව. එතකොට මේ පොළොව දවුන්ත දී කිරි බඳුනක්, එහෙම නැත්නම් හිමකිරම බඳුනක් වගේ වෙන්න ඇති. මේ හිටපු සත්ත්වයන්ගෙන් කෙනෙක්, කුතුහලය වැඩි කෙනෙක් "අමෙහා කිමෙවිදං භවිස්සති" - "අපොයි මේ මොකක්ද" කියල ඇඟිල්ල ගහල ලෙවකෑව. ඔන්න ඉතින් රස තෘෂ්ණාව බැස ගත්ත, ඒ සත්ත්වයා තුළ. මේ තැනැත්ත මේක කරනව දකල අනිත් අයත් ඒ විදියටම ඇඟිල්ල ගහල ලෙව කෑව. බලනකොට මේක රසවත් දෙයක්. ඊළඟට දෝතින්ම අරගෙන කන්න පටන් ගත්ත. හරියට අර කෑදර දරුවකුට අහුවුන හිමකිරම බඳුනක් වගේ. ඔය විදියට කරන්න පටන් ගත්තහම මොකද උනේ? ශරීර ඕළාරික උනා. අන්න අර "කක්ඛලං බරිගතං" කියල කිව්ව වගේ කර්කශ වෙන්න පටන් ගත්ත, තෘෂ්ණාව වැඩෙන්න පටන් ගත්ත. ඒ අනුවම පරිසරයත් වෙනස් උනා, අර වගේම. අන්න ආදීනව පක්ෂය.

ඔය විදියට ආදීනව පක්ෂය පහළ වෙලා මහ පොළොව වැඩීගෙන වැඩීගෙන යන අතරෙ, සරල ජීවිතය වඩ වඩා සංකීර්ණ වෙන අතරෙ, තවත් වර්ෂ කෝටි ප්‍රකෝටි ගණනක් ගියාට පස්සෙ මහගල්කුළු ගිරිහෙල් කැනිකලා ගොඩනැගිලි ආදියෙන් ගැවසුන මේ දැන් තිබෙන විදියෙ මහපොළොවක් ඇති උනා. ඊ ළඟට බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායෙ සත්ත සුරියුග්ගමන සූත්‍රයේ[12] සඳහන් කරනව මේ විදියෙ මේ මහ පොළොවටත් යන කලදසාව. කල්ප විනාශ අවස්ථාව ළංවන විට සූර්ය මණ්ඩල දෙකක් - තුනක් - හතරක් - පහක් - හයක් - හතක් පායාගෙන එනකොට, මේ මුළු මහ පොළොව ඒ සියලු ගල්කුළු ගිරිහෙල් ආදිය සහිතව එකම ගිනි ජාලාවක් බවට පත්වෙලා, ගිනිගෙන දැවිල, ගිතෙල්, තෙල්, දැවුන තැනක් වගේ අළුවත් දැලිවත් ඉතිරි නොකොට එහෙම පිටින්ම විනාශ වෙලා යන බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. එතකොට මෙතන පරමාණුවාදයකටවත් ඉඩක් නැහැ. ඊළඟට අවසාන වශයෙන් බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ මේ දේශනාවෙ පරමාර්ථය.

"එවං අනිච්චා භික්ඛවෙ සංඛාරා. එවං අද්ධුවා භික්ඛවෙ සංඛාරා. එවං අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බ සංඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං" "මහණෙනි සංස්කාරයෝ මෙසෙයින් අනිත්‍යයහ. සංස්කාරයෝ මෙසෙයින් අස්ථිරයහ. සංස්කාරයෝ මෙසෙයින් ආස්වාදරහිතයහ. කෙතෙක්ද යත් මහණෙනි, ඔයත් ඇති සියලු සංස්කාරයන් ගැන කළකිරෙන්න, ඔයත් ඇති සියලු සංස්කාරයන් පිළිබඳව නොඇලෙන්න. ඔයත් ඇති සියලු සංස්කාරයන් ගෙන් මිදෙන්න."

අධෝලිපි

1. අං.නි. I බු.ජ. 18-170 පිට

2. දී.නි. II බු.ජ. 8-166 පිට

3. සු.වි. I (හේ. මු.) 386-7 පිටු, මනො I (හේ.මු.) 787 පිට

4. නෙත්ති බු.ජ. 39 - 92 පිට

5. සු.නි. බු.ජ. 25 - 266

6. සු.නි. බු.ජ. 25 - 290

7. ම. නි. I බු.ජ. 10 - 450 පිට

8. සු.නි. බු.ජ. 25 - 62 පිට

9. සං.නි. II බු.ජ. 14 - 266

10. අං.නි. II බු.ජ. 19 - 56 පිට

11. දී.නි. III බු.ජ. 9 - 144 පිට

# 29 වන
# දේශනය

# 29 වන දේශනය

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං'

'මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම සියලු උපධීන් අතහැරදැමීම, තණ්හාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය'

ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනාමාලාවේ විසිනව වන දේශනයයි මේ.

සංසාරගත සත්ත්වයින්ගේ භව නාටකයට පසුබිමක් වන පොළෝ වේදිකාව කල්පාරම්භයේ සිට කල්පාන්තය දක්වා ඉදිරිපත් කරන වේදිකා සැරසිලි වල අනිත්‍යතාව මතුකර දක්වීමට ගියවර දේශනයේදී අපි උත්සාහ කළා. අග්ගඤ්ඤ සූත්‍රයේ එන කල්පාරම්භය පිළිබඳ විස්තරයත් සත්තසූරියුග්ගමන සූත්‍රයේ එන කල්ප විනාශය පිළිබඳ විස්තරයත් එකිනෙකට යා කර ගෙන ප්‍රබල අනිත්‍ය සංඥාවක් සිතට කා වද්දා ගැනීමෙන් නිවනට දොර ඇරෙන නිබ්බිදාව මතුකර ගැනීම ගැනත් අපි සැළකිලිමත් උනා. මේ භව නාටකයේ අනිත්‍යතාව ඇඟවෙන, ඒ වගේම මේ ලෝකයේ 'මහ පොළොවේ' අනිත්‍යතාව පෙන්නුම්කරන, ඒ බුද්ධ දේශනාවලම ප්‍රතිරාවයක් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ දේශනා කළ මහා හත්ථිපදෝපම සූත්‍රයෙන් අපට අසන්නට ලැබෙනව.

"තස්සාහි නාම ආවුසො, බාහිරාය පඨවි ධාතුයා තාව මහල්ලිකාය අනිච්චතා පඤ්ඤායිස්සති, ඛයධම්මතා පඤ්ඤායිස්සති, වයධම්මතා පඤ්ඤායිස්සති, විපරිණාමධම්මතා පඤ්ඤායිස්සති, කිම්පනිමස්ස මත්තට්ඨකස්ස කායස්ස තණ්හුපාදින්නස්ස අහන්ති වා මමන්ති වා අස්මීති වා අථඛ්වස්ස නොවෙවෙත්ථ හොති"[1]

"ඇවැත්නි ඒසා මහත් වූ පඨවි ධාතුවේ පවා අනිත්‍යතාවක් දක්නට ලැබෙන්නේය. විනාශ වන ස්වභාවයක් දක්නට ලැබෙන්නේය. ගෙවීයන ස්වභාවයක් දක්නට ලැබෙන්නේය. වෙනස්වන ස්වභාවයක් දක්නට

ලැබෙන්නේය. සුළු කලක් පවතින "තණ්හාවෙන් අල්වා ගත්" මේ කය පිළිබඳව - මේ කයෙහි - "මමය මගේය" "වෙමි" යන ගැන්මෙක් ගැන කෙසේ වේද? කියනු කිම්ද? අනෙක් අතට එවැනි කියා ගැන්මකට සිතා ගැන්මකට ඉඩක් නැත්තේ වේ මැයි." ඒ සා මහත් වූ බාහිර පඨවි ධාතුවේ අනිත්‍යතාව තුළින්, මේ සා අල්ප වූ ආධ්‍යාත්මික පඨවි ධාතුවේ අනිත්‍යතාව දකීමෙන් අහංකාර මමංකාර මානානුසයන් දුරුකර ගැනීමට හැකි බව මේ දේශනා කොටසින් අපට පෙනී යනව. "අනිමිත්තංච භාවෙහි මානානුසයමුජ්ජහ". "අනිමිත්තය වඩව, මානානුසය දුරලව" යනුවෙන් බුදුරජාණන් වහන්සේ සුත්ත නිපාතයේ රාහුල සූත්‍රයේදී දේශනා කළේ මේ නිත්‍ය සංඥාවෙන් නිමිති මැකීයනකොට ඒ එක්කම මානානුසයත් ගෙවී යන නිසයි. බාහිර ලෝකයේ අනිත්‍යතාව විස්තර කරන සූත්‍ර දේශනා අයෝනිසෝමනසිකාරයෙන් ලෝකචින්තන බවට හරවා ගන්නේ නැතිව, යෝනිසෝමනසිකාරයෙන් ඒවා අපේ අධ්‍යාත්මය දෙසටම හරවා ගෙන, මේ ජීවිත නාට්‍යයේ ඇති නිස්සාරත්වය තේරුම්ගත යුතුව තිබෙනව.

අප එක් එක්කෙනාගේ ජීවිත නාට්‍යයේ මුල් ජවනිකාවල රඟපෑ නළුනිලියෝ කෝ දන්? ඒ සැරසිලි, ඒ පසුබිම් සැරසිලි, දන් කෝ? ඒ කිසිවක් නැතත්, ඒවා පිළිබඳ සංඥා අනුසය අපේ සිත් තුළ ඉතිරිව ඇති තාක් විතර්ක ප්‍රපංච ඇති කරගැනීමට බාදාවක් නැහැ. මේ විතර්ක ප්‍රපංච ඇති වන්නෙ අර අනිත්‍ය සංඥාවෙන් ඒ නිමිති ගෙවීගියේ නැති නිසයි. මුළු මහත් ලෝකයේම මේ අනිත්‍යතාව ගැන මෙනෙහි කරන කොට, අපේ මේ ජීවිත නාට්‍යයේ ඇති වස්තු- පුද්ගල - සිද්ධි වශයෙන් හඳුන්වන මේ සංස්කාර ගොඩ පිළිබඳව විරාගය ඇති වෙනව කියල කියන්නෙ ඒ නිමිති මැකී යාමයි. ඒක හරියට උපමාවකින් කියනව නම්, බොඳ වුන දිය සායම් චිත්‍රයක් බවට පත් වෙනව වගෙයි. ඒ විදියට අනිත්‍ය සංඥාව වඩන කොට, ඒ නිමිති ගෙවීයන කොට, යෝගාවචරයකුට ලෝකය පේන්නෙ හරියට බොඳ වුන දිය සායම් චිත්‍රයක් වගෙයි. දිය සායම් චිත්‍රයක් බොඳ වෙනකොට ඒ චිත්‍රයේ ඇති රූප එකිනෙක වෙන් කරගන්න බැරි තත්ත්වයක්, අපහසු තත්ත්වයක්, ඇති වෙනව. නානත්ත සංඥාවෙන් - අර වර්‍ණ හැඩ රුව ආදිය අනුව, සණ්ඨානාදිය අනුව - ඒ චිත්‍රයේ ඇති විවිධ රූප එකිනෙකින් වෙන් කරගන්ට බැරි තත්ත්වයක් පැන නඟිනව. ඒ නිසාම අර එකිනෙක මැනීම් වශයෙන් කරන මානානුසයන් ඉවත් වෙනව. පිල් බෙදීම්, ගැටීම් වලට හේතුවන මානානුසයන් එයින්ම ගෙවී යනව. මෙන්න මේක නිසා තමයි අර අනිත්‍ය සංඥාව ඉතාමත් වැදගත් භාවනා කර්මස්ථානයක් හැටියට බුදු රජාණන් වහන්සේ නිතර මතක් කරල දීල තිබෙන්නෙ. අනිමිත්ත සමාධිය විශේෂයෙන්ම බුදුරජාණන්

වහන්සේ වර්ණනා කළා, සංයුක්ත නිකායෙ ඛන්ධ සංයුක්තයේ. "තයො මෙ භික්ඛවෙ අකුසල විතක්කා. කාම විතක්කො, ව්‍යාපාද විතක්කො, විහිංසා විතක්කො. ඉමෙ ච ඛො භික්ඛවෙ තයො අකුසල විතක්කා ක්ව අපරිසෙසා නිරුජ්ඣන්ති. චතූසු වා සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තස්ස විහරතො අනිමිත්තං වා සමාධිං භාවයතො. යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව අනිමිත්තො සමාධි භාවෙතුං. අනිමිත්තො භික්ඛවෙ සමාධි භාවිතො බහුලීකතො මහප්ඵලො හොති මහානිසංසො."[2] "මහණෙනි මේ අකුසල විතර්ක තුනක් ඇත. කාම විතර්කය, ව්‍යාපාද විතර්කය, විහිංසා විතර්කය. මහණෙනි මේ අකුසල විතර්ක තුන කොතැනක නිරවශේෂ වශයෙන් නිරුද්ධ වෙත්ද? සතර සතිපට්ඨානයෙහි මැනවින් පිහිටි සිත් ඇතිව වාසය කරන්නහුට හෝ අනිමිත්ත සමාධිය වඩන්නහුට හෝ ය. කෙතෙක්ද යත්, මහණෙනි, මේ කාරණයම ඇති -ඔයත් ඇති - අනිමිත්ත සමාධිය වඩන්න. අනිමිත්ත සමාධිය වඩන ලද කල්හි, බහුල වශයෙන් කරන ලද කල්හි මහත් ඵල මහානිසංස වෙයි."

මේ සූත්‍ර කොටසින් අපට පෙනී යනව මේ කාම විතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක කියන මේ මිථ්‍යා සංකල්ප තුන සම්පූර්ණයෙන්ම, නිරවශේෂ වශයෙන්ම, නැති කර ගැනීමට ක්‍රම දෙකක් ඇති බව. පළමු වෙනි ක්‍රමය සතර සතිපට්ඨානයෙහි මැනවින් පිහිටි සිත් ඇති බව. දෙවෙනි ක්‍රමය අනිමිත්ත සමාධිය වැඩීම. අර "වා" කියන නිපාතය යොදල තියෙන්නෙ ඒ නිසයි. මෙයින් අපට පේනව අනිමිත්ත සමාධිය වැඩීමේදී නිමිති ගෙවී යන නිසාම අර විතර්කවලට සංකල්ප වලට ඉඩක් නැති වෙන බව. මේ නිමිති ගැනීමේ සංසාරික පුරුද්ද නිසයි අපට විතර්ක ප්‍රපංච ඇති වෙන්නෙ. නමුත් මේ විතර්ක ප්‍රපංචයන්ගෙන් සිත මුදා ගැනීමේ ප්‍රයත්නයටත් එක්තරා විදියක නිමිති ගැනීමක් අවශ්‍ය වෙනව. මේක නොකර බැරි තත්ත්වයක් මෙතන. අපි බොහෝ අවස්ථාවල සඳහන් කළා බුදු රජාණන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාවක් දේශනා කරන්ට හේතුවත්. මේ සමහර දේවල් ඇතුවත් බැරි, නැතුවත් බැරි, තත්ත්වයක් තිබෙනව. එතකොට මේ මධ්‍යම ප්‍රතිපදාවම අනුපූර්වී ප්‍රතිපදාවකුත් වෙනව. මධ්‍යම ප්‍රතිපදාවම අනුපූර්වී ප්‍රතිපදාවක් බවට පත් වෙන්නෙ මේක එක්තරා අනුපිළිවෙලකින් කළයුතු දෙයක් නිසයි. එක්තරා ක්‍රමානුකූලත්වයක් අනුව කරන්ට සිද්ධ වෙන දෙයක්. මේ පද දෙකෝම -මේ මධ්‍යම ප්‍රතිපදා, අනුපූර්වී ප්‍රතිපදා කියන පද දෙකේම - ගැබ්වෙන අර්ථය අපි වෙනත් වචන දෙකකින් කිව්වොත් මේ නිර්වාණගාමී ප්‍රතිපදාව ප්‍රායෝගික හා සාපේක්ෂ ප්‍රතිපත්ති උඩ යන්නක් - ඒ මූල ධර්ම උඩ ගමන් කරන්නක්. ප්‍රායෝගික කියන්නෙ යම්කිසි අර්ථයක් සළකා ගෙන, සාපේක්ෂ කියල කියන්නෙ

කිසිවක ඒකාන්ත වටිනා කමක් නැහැ. එකක් අනික අපේක්ෂා කරගෙනයි, අනිකට අපේක්ෂිතවයි, තව එකක් හා සම්බන්ධවයි වටිනාකම ලබන්නෙ. අර රථවිනීත ප්‍රතිපදාව ගැන කලින් අවස්ථාවක සඳහන් කරන කොට - අර කඩින් කඩ දුවන රථ හත - එකක් දුවන්නෙ අනික් එක බලාපොරොත්තුවෙන්. ඒක දුවන්නෙ අනික් එක බලාපොරොත්තුවෙන්. ඔන්න ඔහොම - සාපේක්ෂක භාවය- මේ මූල ධර්මය විස්තර කිරීමටයි ඒ විස්තරය කිව්වෙ. එතකොට එක්තරා විදියක නිම්ති භාවිතයක් අවශ්‍ය වෙනව මේ කියාදුනු නිමිති වලින් සිත මුදා ගැනීමේ ප්‍රයත්නයටත්. ඒක කෙරෙන්නෙ අර ප්‍රායෝගික සාපේක්ෂ මූල ධර්ම අනුවයි. ප්‍රායෝගික හා සාපේක්ෂ මූල ධර්ම අනුව කෙරෙන යෝගාවචරයගෙ මේ ප්‍රයත්නය තේරුම් කිරීමට මුල් දේශනාවකදීම අපි උපමාවක් යොදාගත්ත - අර දළි පිහිය මැදීමේ උපමාව.

ඒක නැවතත් අපි මතක් කර ගනිමු. ඒ දළි පිහිය මැදීමේ උපමාවෙන් අපි ඒ අවස්ථාවෙ පෙන්නුම් කරන්න උත්සාහ ගත්තෙ, පරාමර්ශනයත් සම්මර්ශනයත් අතර වෙනසයි. පරාමර්ශනය කියල කියන්නෙ දැඩිව අල්ල ගැනීමයි. සම්මර්ශනය කියල කියන්නෙ එක්තරා සියුම් ආකාරයකින් අල්ලා ගැනීම- යම්කිසි විශේෂ අර්ථයක් සඳහා. හොඳින් අල්ලා ගැනීම කියන තේරුම වගේ එතන. මේකටයි අපි දළිපිහියෙ උපමාවක් ගත්තෙ. පරාමර්ශනය ගැන කියනව නම්, දළි පිහිය තදින් අමෝරා ගෙන ඒක කරගලෙහි අතුල්ලන්න පටන් ගත්තොත් දළි පිහිය මොට වෙනව, මොට්ට වෙනව. එහෙම නැතිව, දළිපිහිය සුඛනම්‍ය ආකාරයකින් අල්ල ගෙන සීරුවෙන් කරගලේ ඇතිල්ලුවොත් දළිපිහිය මට වෙනව, මට්ටම් වෙනව. ඒ කියන්නෙ මැදෙනව මුවහත් වෙනව. මෙන්න මේ සංස්කාර සම්මර්ශනය ගැන කතා කරන කොට අපට සිහි ගැන්වෙන පද දෙකක් තිබෙනව. "විපස්සනා" "අනුපස්සනා" කියල. මේ විපස්සනා, අනුපස්සනා කියන පද දෙකත් අපට තේරුම් ගන්න පුළුවනි අර කලින් සඳහන් කළ ප්‍රායෝගික සාපේක්ෂ මූල ධර්ම හෙළිවෙන ආකාරයට.

මෙතෙන්දි අපි වඩුවෙක් ලීයක් යතුගාන හැටි බලමු. වඩුවෙක් ලීයක් යතු ගාගෙන යන අතරෙ විටින් විට ඒ ලීය අතට අරගෙන දකුණැස වහල වමැසින් එක්තරා විශේෂ බැලීමක් - එක්තරා අනුව බැලීමක් - කරනව. මේ බැලීමේ එක්තරා 'සාවඥ' බවකුත් තියෙනව. අවඥා සහිත බවක් තිබෙනව. මේක හරියට දක්ෂ වඩුවෙකු අදක්ෂයකුගෙ නිර්මාණයක් දෙස විචාරත්මකව, විචාරාක්ෂියෙන් බලන්න වගේ වැඩක්. නමුත් මේ වඩුව බලන්නෙ අර තමාම යතුගාන ලීය දිහාමයි. මොකද මෙහෙම බලන්නෙ? මේ බැලීම, වෙනත් විදියකින් කියතොත්, මේක අනුන්ගෙ ඇසින් බැලීමක්.

අනිකකුගෙ ඇසින් බැලීමක්. මේ තමා යතුගාන ලීය දෙස අනුන්ගේ ඇසින් බලන්නෙ- විචාරාක්ෂියෙන් බලන්නෙ- මේ විශේෂ බැල්ම කරන්නෙ, ඒ ලීයෙ ඇදකුද සොයා ගන්නයි. "මම මේක යතුගාන නිසා කොහෙද ඇද කුදයක්?" කියල ගත්තොත් මේ වැඩේ කවදාවත් හරියට කෙරෙන්නෙ නැහැ. අන්න ඒ නිසා තමයි එක ඇහැක් වහල, අනිත් ඇහෙන් අර විදියෙ බැල්මක් කරන්නෙ. අන්න ඒ විදියෙම දෙයක් තමයි මේ 'විපස්සනාව' කියන විශේෂ බැල්ම. අනුපස්සනාව කියල කියන අනු-අනුව බැල්ම.

මෙන්න මේ කාරණය අපට හෙළි වෙන හොඳ ගාථා ධර්මයක් ඉදිරිපත් කරගන්න පුළුවනි ථෙරගාථා පාළියේ එන මහා මොග්ගල්ලාන ථෙර ගාථාවෙන්.

"සුඛුමං පටිවිජඣනති - වාලගගං උසුනා යථා,
යෙ පඤචකඛනෙධ පසසනති - පරතො නොච අතතතො"[3]

'යම් කෙනෙක් මේ පංචස්කන්ධය තමා වශයෙන් නොව- "නොච අත්තතො" - අනුන් වශයෙන්- "පරතො" - බලත්ද ඔවුහු අශ්ව ලෝමයක් ඊ තලයකින් විදින්නාක් මෙන් සියුම් වූ නිර්වාණ ධාතුව පිළිවිද දකිත්, ප්‍රතිවේධ කරත්, විනිවිද දකිත්'. ඒ වගේම තවත් ගාථාවක් අපට සකුළා ථෙරී ගාථාවෙන් හමු වෙනව සකුළා ථෙරිය පිළිබඳව.

"සංඛාරෙ පරතො දිසවා - හෙතු ජාතෙ පලොකිතෙ
පහාසිං ආසවෙ සබෙබ - සීතිභූතාසමි නිබබුතා"[4]

'හේතූන්ගෙන් හටගත් බිඳී යන ස්වභාවය ඇති මේ සංස්කාරයන් "පරතො" අනුන් වශයෙන් දැක" පහාසිං ආසවෙ සබෙබ" සියලුම ආශ්‍රවයන් ප්‍රහාණය කළෙමි. "සීතිභූතාසමි නිබබුතා" සිහිල් වූවා වෙමි, නිවුනී වෙමි."

එතකොට මෙන්න මෙයිනුත් අපට පේනව - දැන් අර සක්කාය දිට්ඨිය විස්තර කරන සූත්‍රවල සඳහන් වෙන්නෙ" රූපං අත්තතො සමනුපස්සති, වෙදනං අත්තතො සමනුපස්සති" ආදී වශයෙන් රූපය ආත්මය වශයෙන් දකිනව, වේදනාව ආත්මය වශයෙන් දකිනව. ඒක අර අශ්‍රැතවත් පෘථග්ජනයගෙ ස්වභාවය. නමුත් ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා, විශේෂයෙන්ම යෝගාවචරයා, මේ "පරතො" බැල්ම පිහිට කර ගන්නව. විපස්සනාවේදී මේ පරතො බැල්ම පිහිට කර ගන්නව. ඒකෙන් තමයි 'වි-පස්සනාවක්' විශේෂ බැල්මක් වන්නෙ. අනුව බැලීමක් වෙන්නෙ. මේ අනුව බැලීම කියල කියන කොට, අපි මේක කලිනුත් අවස්ථාවක සඳහන් කළා, සතිපට්ඨාන සූත්‍රයේ තියෙනව බොහෝ දෙනාට ගැටලුවක් වෙන පාඨයක්. "කායෙ කායානුපස්සී විහරති" - නිතරම සඳහන් වෙනව. "වෙදනාසු වෙදනානුපස්සී විහරති" - මේක බැලූ බැල්මට, පරිවර්තනය කළාම

අමුතුයි. කයෙහි කය අනුව බලනව. මොකක්ද මේ අනුව බැලීම. මෙන්න මේ කියාදුනු අනුව බැලීමයි. අර වඩුවා කරන වැඩේ මේ කරන්නෙ - යෝගාවචර වඩුව කරන්නෙ. මේ සංස්කාර ලීයෙ ඇදකුද සොයාගන්න නම් අර විදියට බලන්න ඕන. "පරතො" බැල්මක් හෙලන්න ඕන. ඒකයි මේ "කායෙ කායානුපස්සී." 'මේ මගේ කය මේකෙ කොයින්ද වැරැද්දක්?' කියල බලන්න පටන් ගත්තොත් මේකෙ අනිත්‍ය දුඃඛ අනාත්ම කියන ඇද කුද පේන්නෙ නැහැ. ඒක නිසා මේ අනිත්‍ය දුඃඛ අනාත්ම කියන ඇද කුද දකීමට නම් අර කියාදුනු අර 'පරතො-බැල්ම' පිහිට කර ගන්න ඕන. එහෙම ඒ ඇද කුද බලාගෙන එක්තරා යතු ගෑමකුත් මේ යෝගාවචර වඩුව කරනව. ඒ පරතො බැල්මෙන් ඇදකුද සොයාගෙන ඊළඟට එක්තරා යතුගෑමකුත් කරනව. යතුගාල තමයි අරව ගෙවා දමන්නෙ-මතුවෙල තියෙනව නම් ඇද කුද ආදිය. තණ්හා මාන දිට්ඨි වශයෙන් අර ඉල්පිල තිබෙන, සංස්කාර වලින් - තනිකර සංස්කාර ගොඩක් 'සුද්ධ සංඛාර පුඤ්ජො'[5] අර වජිරා භික්ෂුණිය කිව්ව වගේ. නමුත් මේකෙන් මොකක්දෝ මතු වෙල තියෙනව තණ්හා මාන දිට්ඨි වශයෙන්. ඒව ගෙවල දාන්න නම් මේකට එක්තරා යතුගෑමක් කරන්න ඕන. දැන් අපි මේ යෝගාවචර වඩුව, මේ සංස්කාර ලීය යතුගාන සද්දෙට ටිකක් කන් දෙමු. "න එතං මම, න එසො හමස්මි, න මෙ සො අත්තා, න එතං මම, න එසො හමස්මි න මෙසො අත්තා" ඔන්න ඕකයි යතු ගෑම. මෙය මගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවෙයි, මෙය මගේ නොවෙයි, මෙය මම නොවෙමි මෙය මගේ ආත්මය නොවෙයි." ඔය "න" යන්නෙන් තමයි කෙලෙස් කැපෙන්නෙ. එතකොට මේ පාඨ සූත්‍ර දේශනා වල සඳහන් වෙන්නෙ නිකම් දෘෂ්ටි වශයෙන් ගැනීමට නොවන බව මෙයින් පෙනෙනව. යම්කිසි ප්‍රායෝගික සාපේක්ෂ අර්ථයක් අනුව යෝගාවචරයට ප්‍රයෝජනයට ගැනීමට මේ පද තුන යෙදිල තියෙන්නෙ. "න එතං මම, න එසො හමස්මි, න මෙසො අත්තා" එතකොට මෙන්න මේ විදියට යතුගාල ක්‍රම ක්‍රමයෙන් අර ඇද කුද එහෙම පිටින්ම ගෙවිල යන හැටියට, අර මතු වෙල තියෙන දේවල්, ඉල්පීම් නැතිවෙල යන ආකාරයට, කරන්නෙ එක්තරා විදියක සම්මර්ශනයක්. හොඳට මට කරන්න, මට්ටම් කරන්න වෙනව යෝගාවචර වඩුවට.

මේ කාරණය කියාගෙන යන කොට අපට මතක් කරගන්න පුළුවන් තව හොඳ වචනයක් තියෙනව. "උස්සද" කියන වචනය. මේ වචනය සමහර පැරණි සූත්‍රවල සඳහන් වෙනව. මේ වචනයේ අර්ථය එතරම් පැහැදිලි නැති වගෙයි පෙනෙන්නෙ. මේ "උස්සද" කියන වචනය ඊට සමාන "උත්සන්න" කියන වචනයත් එක්ක සංසන්දනය කරල බලන

කොට අපට පේනව "ඉස්සීම, ඉල්පීම, මතුවීම" කියන අර්ථය එතන තියෙනව. වෙනත් විදියකින් කියනව නම් 'උස්සද' කියන වචනයේ සාමාන්‍ය නිරුක්තිය අනුව අර්ථය ගන්න පුළුවන් අපට 'නෙරා යෑම', 'ඉල්පීම' 'මතුවීම', වැනි දෙයක්. ඇත්ත වශයෙන්ම තණ්හාවත් එක්තරා විදියක නෙරා යෑමක්. මානය එක්තරා විදියක ඉල්පීමක්. දිට්ඨිය එක්තරා විදියක මතුවී පෙනීමක්, මතුවීමක්. එතකොට මේ සංස්කාර ගොඩෙන් ඔන්න ඔය තුන මතු වෙලා තිබෙනව, සාංසාරික දෝස නිසා. ඒව එහෙම පිටින්ම යතුගාල, ක්‍රම ක්‍රමයෙන් ඇදකුද හොයමින් යතුගාලා, මට්ටම් කරන්නයි සිද්ධ වෙන්නෙ. මේ උස්සද කියන වචනය ගැන මේ කියාපු අර්ථය අපට මතු කර ගන්න පුළුවන් වටිනා ගාථාවක් සුත්ත නිපාතයෙ අට්ඨක වග්ගයෙ තුවටක සූත්‍රයෙන් අපට සොයා ගන්න පුළුවනි. උපසමානුස්සතියට පවා උපකාර කරගන්න පුළුවන් වටිනා ගාථාවක්.

"මජ්ඣෙ යථා සමුද්දස්ස - ඌමි නො ජායති ඨිතො හොති
එවං ඨිතො අනෙජස්ස - උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි"

'යම් සේ මුහුද මැද රළ හට නොගනීද, සිටියේ වෙයිද, තහවුරු වූයේ වෙයිද, එසේම සිටියකු - තහවුරු - වූවකු වන්නේය. නොසැලෙන්නෙකු වන්නේය. භික්ෂුව කොතැනකවත් උසසදයක් නොකරන්නේය. මතුවීමක්, ඉල්පීමක්, නෙරා යෑමක්, නොකරන්නේය.' එතකොට මේ ගාථාවෙනුත් අපට පේනව නොරහත් සිත සාමාන්‍යයෙන් වෙරළාසන්නයෙයි වැඩිපුර තියෙන්නෙ. මේ වෙරළේ තමයි මුදෙ රැළි රළ වෙලා, රළ රළගෙඩි වෙලා, හැපි හැපි බිඳිල මහා ගාලගෝට්ටියක් ඇති වෙන්නෙ. මුහුද මැද එහෙම නොවෙයි. රළත් නැහැ. රැළිත් නැහැ. ඉතාමත්ම නිශ්චලයි. සන්සුන්. තහවුරුයි. "ඨිති" ස්වභාවයක් තියෙනව. ස්ථාවර ස්වභාවයක් තියෙනව. සිත රහත් හින්ද. මෙයිනුත් අපට පේනව අර මතුවීම කියන අර්ථය 'උසසද' කියන වචනයේ තිබෙන බව. එතකොට යෝගාවචර වඩුවට කරන්න වෙන්නෙ අර තණ්හා මාන දිට්ඨි වශයෙන් තිබෙන නෙරායෑම්, ඉල්පීම්, මතුවීම්, එහෙම පිටින්ම ගෙවිල යන තාක් යතුගෑමයි, "න එතං මම" ආදී වශයෙන්. එතකොට ඔය විදියට යතු ගාමින් ක්‍රම ක්‍රමයෙන් මේ යෝගාවචර වඩුව තනිකර මේක 'සුද්ධ සංඛාර පුඤ්ජයක්' කියල වැටහෙන තාක්ම, තණ්හා මාන දිට්ඨි එහෙම පිටින්ම ගෙවී යන තාක්ම, අර විපස්සනාව, අනුපස්සනාව උපකාර කර ගන්නව.

මේ විදියට යතුගාන අවස්ථාවේදී පවා අර සාපේක්ෂ මූල ධර්මය, නැත්නම් අර අනුපූර්ව ප්‍රතිපදාව හා සම්බන්ධ අදහස් ටික මේකට එකතු වෙන ආකාරය අපට පැහැදිලි වෙන ඉතාමත්ම වටිනා සූත්‍රයක් තමයි දීඝ

නිකායෙ සක්කපඤ්හ සූත්‍රය.[7] මේ යතු ගෑමේදී විතර්ක ප්‍රපංච ආදිය ක්‍රමානුකූලවයි - එක්තරා ක්‍රමයකට අනුකූලවයි - සිනිඳු කරන්න පුළුවන් වෙන්නෙ. ඒක උපමාවකට අනුව කියනව නම්, අර වඩුවකු අර ලීය යතු ගාන අතරෙ, විටින් විට තමන්ගෙ යතු කැටයට තට්ටු කරල, ඒ ලීය සිනිඳු වෙන්ට සිනිඳු වෙන්ට යතු කැටයත් සකස් කරනව. වෙනස් කරනව. සමහර විට ඊට වඩා සියුම්, වෙන යතු කැටයක්, අතට ගන්නව. එහෙම නැත්නම් ඒ යතු කැටයට තට්ටු කරල තව ටිකක් තලේ හරි ගස්ස ගන්නව. ඔන්න ඔය විදියෙ අනුපූර්වී ප්‍රතිපදාවක් අනුවයි අපට මේ විතර්ක ප්‍රපංච ක්‍රම ක්‍රමයෙන් ගෙවන්න සිද්ධ වෙන්නෙ. අර නිමිති ආදියත් ගෙවා දාන්න සිද්ධ වෙන්නෙ. මේ කාරණය ඉතාමත්ම හොඳින් පැහැදිලි වෙනව දීඝ නිකායෙ සක්කපඤ්හ සූත්‍රයෙන්. ඒ සූත්‍රයේ දී ශක්‍ර දේවේන්ද්‍රය බුදු රජාණන් වහන්සේගෙන් ප්‍රශ්න මාලාවක් අහනව. කොයි තරම් වැදගත් ප්‍රශ්නද කියතොත්, ඒ ප්‍රශ්න මාලාව අවසානයේ ශක්‍ර දේවේන්ද්‍රය සෝවාන් ඵලයට පත් වුන බව සඳහන් වෙනව. ඒ ප්‍රශ්න මාලාවෙ, මේකට අදාළ පළමු වෙනි ප්‍රශ්නය හැටියට ගත්තොත්, බුදුරජාණන් වහන්සේගෙන් ශක්‍රය විමසනව:

"ඡන්දො පන මාරිස කිං නිදානො කිං සමුදයො කිං ජාතිකො කිං පභවො. කිස්මිං සති ඡන්දො හොති? කිස්මිං අසති ඡන්දො න හොති" නිදුකාණෙනි ඡන්දය කුමක් නිසා, කුමක් හේතු කරගෙන, කුමකින් ඇතිවන, කුමකින් උපන්, කුමකින් හටගන්නා, දෙයක්ද? කුමක් ඇති කල්හි ඡන්දය වේද? කුමක් නැති කල්හි ඡන්දය නොවේද? "ඊට බුදුරජාණන් වහන්සේ දෙන පිළිතුර, "ඡන්දො ඛො දෙවානමින්ද විතක්කනිදානො විතක්ක සමුදයො විතක්ක ජාතිකො විතක්ක පභවො. විතක්කෙ සති ඡන්දො හොති විතක්කෙ අසති ඡන්දො න හොති." දේවේන්ද්‍රය ඡන්දය විතර්කය නිසා ඇති වන්නක්. විතර්කය හේතු කොට ගෙන, විතර්කය නිසා, විතර්කයෙන් උපන්, විතර්කයෙන් හටගන්නා දෙයක්. විතර්කය ඇති කල්හි ඡන්දය වේ. විතර්කය නැති කල්හි ඡන්දය නොවේ." ඊළඟට ඒ විදියටම ශක්‍ර දේවේන්ද්‍රයා අසන ප්‍රශ්නය "මේ විතර්කය කුමක් නිදාන කරගෙන, කුමක් නිසා හටගන්නා, කුමක් ප්‍රභව කොටගෙන ඇතිවන, දෙයක්ද" කියල අර විදියටම ප්‍රශ්න කරනව. ඒකට බුදු රජාණන් වහන්සේ දෙන පිළිතුර "විතක්කො ඛො දෙවානමින්ද පපඤ්ච සංඛා නිදානො" මේ විතර්කයට නිදාන හේතුව. 'පපඤ්චසඤ්ඤා සංඛා.' ඒ වචනය අපි මධු පිණ්ඩික සූත්‍ර විග්‍රහයේදී බොහොම දුරට සාකච්ඡා කළ වචනයක්. අර තණ්හා මාන දිට්ඨි ආදී විතර්ක සම්බන්ධ අදහසක් තමයි මේ ප්‍රපංච කියන වචනයෙන් හැඟෙන්නෙ. වැඩි විසිරී යෑමක්. එතකොට ඒ විදියේ ප්‍රපංච සංඥාවෙන්

ඇති කර ගත්තු 'සංඛා' - 'සංඛා' කියල කියන්නෙ හිඟීම් හැඳිනීම් ප්‍රඥප්ති - මෙන්න මේ ප්‍රඥප්ති මුල් කර ගෙනයි විතර්ක ඇති වෙන්නෙ කියන පිළිතුරයි බුදු රජාණන් වහන්සේ දෙන්නෙ. ඊළඟට ශක්‍ර දේවේන්ද්‍රය අසන ප්‍රශ්නය:

"කථං පටිපන්නො පන මාරිස භික්ඛු පපඤ්චසඤ්ඤා සංඛා නිරොධ සාරුප්පගාමිනී පටිපදං පටිපන්නො හොති" - නිදුකාණෙනි කෙසේ පිළිපන් භික්ෂුව ද ප්‍රපංච සංඥා සංඛ්‍යා නිරෝධ කිරීමට සුදුසු වූ ප්‍රතිපදාවට බැස්සය කියල කියන්න පුළුවන් වන්නෙ, කෙසේ ගමන් කරන භික්ෂුවකටද? අන්න එතෙන්දි බුදු රජාණන් වහන්සේ දෙන පිළිතුර ඉතාමත්ම වැදගත්, අපට මේ කියාපු අනුපූර්ව ප්‍රතිපදා ආදී ඒ අදහස තේරුම් ගැනීමට. බුදු රජාණන් වහන්සේ පිළිතුරු දෙනව" සොමනස්සම්පහං දෙවානමින්ද දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. දොමනස්සම්පහං දෙවානමින්ද දුවිධෙන වදාමි සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. උපෙක්ඛම්පහං දෙවානමින්ද දුවේධෙන වදාමි සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි." දේවින්ද්‍රය මම සොම්නසද සේවනය කටයුතු, සේවනය නොකටයුතු, වශයෙන් දෙවැදෑරුම් කොට වදාරමි. දේවේන්ද්‍රය මම දොම්නසද සේවනය කටයුතු, සේවනය නොකටයුතු, වශයෙන් දෙවැදෑරුම් කොට වදාරමි. දේවේන්ද්‍රය මම උපේක්ෂාවද සේවනය කටයුතු, සේවනය නොකටයුතු, වශයෙන් දෙවැදෑරුම් කොට වදාරමි." ඊළඟට ඒක තවදුරටත් විස්තර කිරීම් වශයෙන් බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කරනව. "තත්‍ථ යං ජඤ්ඤා සොමනස්සං ඉමං ඛො මෙ සොමනස්සං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්තීති එවරූපං සොමනස්සං න සෙවිතබ්බං. තත්‍ථ යං ජඤ්ඤා සොමනස්සං ඉමං ඛො මෙ සොමනස්සං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තී ති එවරූපං සොමනස්සං සෙවිතබ්බං. තත්‍ථ යඤ්චෙ සවිතක්කං සවිචාරං යඤ්චෙ අවිතක්කං අවිචාරං යෙ අවිතක්කෙ අවිචාරෙ සෙ පණීතතරෙ." ඒ වගේ අර්ථය - එහිලා, අර කියාපු සොම්නස් දොම්නස් උපේක්ෂා කියන කරුණු තුන පිළිබඳවම ඊළඟට බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කරනව - එහිලා, ඒ කාරණය පිළිබඳව, මේ සොම්නස් සෙවුනා කල්හි මා තුළ, මගේ, අකුසල ධර්මයෝ වැඩෙත් කුසල ධර්මයෝ පිරිහෙත් යයි දන්නේ ද, අන්න එබඳු ඒ සොම්නස සේවනය නොකට යුත්තේය. අනෙක් අතට යම් සොම්නසක් පිළිබඳව, මේ සොම්නස සේවනය කරන කල්හි මගේ අකුසල ධර්මයෝ පිරිහෙත්, කුසල ධර්මයෝ වැඩෙත් යයි දනගන්නේද එබඳු ඒ සොම්නස සේවනය කළ යුතුය. ඇසුරු කළ යුතුය. ඊළඟට ඒ විදියට තේරුම් කරල දෙනව අකුසල පැත්තට යොමුවුන සොම්නසත් කුසල පැත්තට යොමු වුන සොම්නසත් දෙවැදෑරුම් බව.

ඊළඟට එතැනත් ප්‍රභේද දෙකක් දක්වනව, එතෙන්දිත්. ඒ කියන්නෙ ඊළඟට අපට ඉතිරි වෙන්නෙ කුසල් පක්ෂයේ වූ සොම්නසයි. ඒ කුසල් පක්ෂයේ වූ සොම්නස පිළිබඳවත් දෙවැදෑරුම් බවක් පෙන්නුම් කරනව. "තත්‍ර යඤ්ච සවිතක්කං සවිචාරං යඤ්ච අවිතක්කං අවිචාරං යෙ අවිතක්කෙ අවිචාරෙ සෙ පණීතතරෙ" ඒ කුසල් පිළිබඳවූ සොම්නසෙත් - යම් සොම්නසක් විතර්ක සහිතද විචාර සහිතද, යම් සොම්නසක් විතර්ක විචාර රහිතද, ඒ දෙක අතරින් විතර්ක විචාර රහිත සොම්නසම ශ්‍රේෂ්ඨයි. වඩා ප්‍රණීතයි. මෙයින් අපට හැඟෙනව අර විතර්ක රහිත සොම්නස තමයි වඩා නිවනට ළඟ. ඒකයි අපට ගන්නට පුළුවන් නිගමනය. ඊළඟට ඒ විදියටම, ඒ සොම්නස ගැන ප්‍රකාශ කළා වගේම, බුදුරජාණන් වහන්සේ දොම්නස ගැනත් ප්‍රකාශ කරනව. දොම්නසත් අර විදියට කුසල් අකුසල් වශයෙන් දෙවිදියකට බෙදල දක්වල අකුසල් පැත්ත ඉවත් කරල කුසල් පැත්තට සොම්නසයි ගත යුත්තෙ. ඒ කුසල් සොම්නසේත් අර විදියෙ යම් කුසල් පක්ෂයෙ සොම්නසක් විතර්ක විචාර සහිතද, ඒක පැත්තකට කරල විතර්ක විචාර රහිත - විතක්ක විචාර නැති - සොම්නසට තැන දෙනව. ඒකයි නිවනට මඟ. ඒ මාර්ගයේ ගියොත් තමයි නිවනට ළං වෙන්නෙ. එහෙම ප්‍රකාශ කරන ඒ සූත්‍ර කොටස අවසන් කරන්නෙ බුදු රජාණන් වහන්සේ "එවං පටිපන්නො මාරිස භික්ඛු පපඤ්ච සඤ්ඤා සංඛා නිරොධ සාරුප්ප ගාමිනී පටිපදං පටිපන්නො හොති." මෙන්න මේ විදියට පිළිපන් භික්ෂුවයි පපඤ්ච සඤ්ඤා සංඛා නිරෝධයට ගැලපෙන ගමන් මාර්ගයට පිළිපන්නේ වෙන්නෙ.

එතකොට මේක ඉතාමත්ම ප්‍රායෝගික වටිනාකමක් ඇති සූත්‍රයක්. සමහර විට මෙතන පොඩි ගැටලුවක් මතුවෙන්න ඉඩ තියෙනව. අපි අර කලින් මේ දේශනා මාලාවේ මධුපිණ්ඩික සූත්‍රය[8] සාකච්ඡා කරන අවස්ථාවේ ඒ සූත්‍රයේ සඳහන් උනා "යං විතක්කෙති තං පපඤ්චෙති යං පපඤ්චෙති තතො නිදානං පුරිසං පපඤ්චසඤ්ඤා සංඛා සමුදාචරන්ති" ආදී වශයෙන් උද්ධෘතපාඨයක්. එහෙම අපි කලින් දක්වූවට, එතැන කියැවෙනව යමක් විතර්ක කරයිද එයම ප්‍රපංච කරයි. යමක් ප්‍රපංච කරයි ද එය කරණකොට ගෙන වකුටු විසෙදෑයෘ රූපයන් පිළිබඳව පපඤ්ච සඤ්ඤා සංඛාවන් ඒ කියාදූ පුද්ගලයාව අභිභවනය කරනව, මැඩලනව කියල. එතකොට ඒ සූත්‍රයත් මේ සූත්‍රයත් අතර බැලූ බැල්මට පරස්පර විරෝධිතාවක් පේනව. එකිනෙකට නොගැලපෙන බවක්. මක් නිසාද? ඒ සූත්‍රයේ - කලින් සඳහන් කළා - ඡන්දයට හේතුව නිදානය හැටියට දක්වූවෙ විතර්කයයි. ඊළඟට විතර්කයට හේතුව, නිදානය, ප්‍රභවය හැටියට දක්වූවෙ පපඤ්චසඤ්ඤා සංඛා - බැලූ බැල්මට මෙතන අර ක්‍රමයට වඩා වෙනස්. නමුත් මෙතන

පරස්පර විරෝධීතාවක් නැහැ. බුදුරජාණන් වහන්සේගේ දේශනාවල එහෙම පරස්පර විරෝධී තැන් නැහැ. ඒකට හේතුව කුමක්ද? මේ විතර්ක කිරීමට ගන්නෙත් අර ප්‍රපංච සංඥාවෙන් නිපදවා ගත්තු ලෝක ප්‍රඥප්තිමයි. "යං විතක්කෙති තං පපඤ්චෙති" කියල කියන තැන ඒ විතර්ක කිරීමට උපකාර කර ගන්නෙ අර ලෝක සම්මත ප්‍රඥප්ති. එතකොට ප්‍රපංච කිරීමෙන් වන්නෙ ඒව තවදුරටත් ලියලා වැඩිල ඒවට යට වෙනව අවසානයේ. මධුපිණ්ඩික සූත්‍රයේ "පපඤ්ච සඤ්ඤා සංඛා සමුදාචරන්ති" කියල ප්‍රකාශ කළේ ඒ විතර්ක සඳහා උපකාර කර ගත්තෙත් පපඤ්ච සඤ්ඤා සංඛාමයි. නමුත් ඒව වැඩී ගියාට පස්සෙ ඒ පපඤ්ච සඤ්ඤා සංඛාවලටම යට වෙනව. වෙන විදියකින් කියනව නම් මෙතන තියෙන්නෙ එක්තරා විදියක චක්‍රාකාර සම්බන්ධතාවක්. අමුතු විදියෙ චක්‍රයකටයි වැඩ කරන්නෙ. විතර්ක ඇතිකර ගැනීමටත් පපඤ්චසඤ්ඤා උපකාර කර ගන්නව. ඊළඟට පපඤ්ච සඤ්ඤා සංඛා උපකාර කරගෙන ඒ ප්‍රඥප්ති වල උපකාරයෙන් විතර්ක කරගෙන යන කොට අන්තිමට වෙන්නෙ අර පපඤ්ච සඤ්ඤා සංඛා ලියලා වැඩෙනව. පපඤ්චසඤ්ඤාසංඛා වලට යටවෙනව ඊළඟට. විතක්ක නිසා පපඤ්චසඤ්ඤා සංඛා, පපඤ්චසඤ්ඤාසංඛා නිසා විතක්ක. ඔන්න ඔහොම එක්තරා විදියක චක්‍රාකාර ස්වභාවයක් තියෙනව. දැන් අපට හිතාගන්න පුළුවන් ආශ්‍රවයන්, මත්ද්‍රව්‍ය ආදිය හැදීමේදීත් මුහුන් වගේ යම්කිසි දෙයක් ඉදිරිපත් කර ගන්නව. ඒ මුහුන් දැම්මට පස්සෙ කලක් ගියාට පස්සෙ ඒකත් මත් ද්‍රව්‍යයක් බවට පත් වෙනව. ඔන්න ඔය විදියෙ ස්වභාවයක් තියෙන්නෙ. මේ මහා සාංසාරික ගැටලුවේ මහාභයානක තත්ත්වයක් මෙතනින් පෙන්නුම් කරන්නෙ. චක්‍රාකාර සම්බන්ධතාවක්.

එතකොට මේ චක්‍රාකාර සම්බන්ධතාව බිඳීමටත් එක්තරා ක්‍රමානුකූල වැඩපිළිවෙලක් අවශ්‍යවෙනව. ඒ වැඩ පිළිවෙලයි අර සක්ක පඤ්හ සූත්‍රයේ දක්වල තිබෙන්නෙ. මේක ආවට ගියාට -කලබලේට - කරන්න පුළුවන් දෙයක් නොවෙයි. සීරුවෙන් කළ යුත්තක්. ඒක නිසා තමයි ඉතාම ගොරහැඩි රළු තත්වයේ ඉඳලම, ක්‍රම ක්‍රමයෙන් සියුම් කර ගෙන යන ආකාරයක්, අර සොමනස්ස, දොමනස්ස ආදිය ගැන විස්තර කරන අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළේ. සෝමනස්සයත් දෙවැදෑරුම්. ඒක අකුසල් පැත්තට වෙන්නත් පුළුවන් කුසල් මාර්ගයට යන්නත් පුළුවන්. ඒකෙදි අකුසල් මාර්ගය ඉවත් කරල කුසල් මාර්ගයට බැහැල යනව. විතර්ක විචාර උපකාර කරගන්ට වෙනව. ඒව නැතුව බැහැ. නමුත් එක්තරා දුරකට ගියාට පස්සෙ විතර්ක විචාර අත්හැරල අවිතක්ක අවිචාර පැත්තෙන් නිවනට ළංවෙනව. ඔන්න ඔය කාරණයයි - එතකොට මේ අනුපුබ්බ පටිපදාවට අදාළ ඔය කාරණයයි - මෙයිනුත් අපට හෙළි වෙන්නෙ. දැන්

එතකොට මෙයින් අපට පෙනී ගියානම්, මේ විතක්ක, පපඤ්ච, පපඤ්ච සඤ්ඤා සංඛා ආදී වචනවල එක්තරා ගැඹුරු විදර්ශනාත්මක වටිනාකමක් පෙනී ගියානම්, අර අරහත්ත ඵල සමාධිය අවිතක්ක සමාධිය නමින් යම් යම් සූත්‍ර වල හඳුන්වා තිබීම ගැටලුවක් වෙන්න හැටියක් නැහැ. බොහෝ දෙනෙකුට ඒක ගැටලුවක් වගේත් පේනව. අවිතක්ක සමාධිය කියල පදයක් යෙදෙනව මේ අරහත්ත ඵල සමාධිය පිළිබඳව. නිදසුනක් වශයෙන් කියනව නම් උදාන පාළියේ ජච්චන්ධවග්ගයෙ සුභූති සූත්‍රයේ සඳහන් වෙනව සුභූති නමැති රහතන් වහන්සේ නමක් බුදු රජාණන් වහන්සේ සමීපයෙහි පර්‍යඞ්කය බැඳගෙන කය ඍජු කරගෙන අවිතක්ක සමාධියට සමවැදිල වැඩ හුන් බවක්. ඒක දැකල බුදු රජාණන් වහන්සේ එක්තරා උදාන ගාථාවකුත් වදාළා. ඒ ගාථාව :

"යස්ස විතක්කා විධූපිතා - අජ්ඣත්තං සුවිකප්පිතා අසේසා
තං සඞ්ගං අතිච්ච අරූප සඤ්ඤී - චතුයෝගාතිගො න ජාතිමෙති"

ඉතාමත්ම ගැඹුරු අර්ථයක් ඇති ගාථාවක්. නමුත් ඒ අර්ථයට බහින්න කලින් මෙතන මේ 'අවිතක්ක සමාධිය' කියන එකට අටුවාව දුන්න විස්තරය ගැනත් යමක් කියන්න සිද්ධ වෙනව.

අටුවාව තෝරන හැටියට, අවිතක්ක සමාධි කියන්නෙ - දෙවෙනි ධ්‍යානයේ ඉඳල ඉහළට සියලුම රූපාවචර ධ්‍යානත් අරූපාවචර සමාධීත් මේකට අයිතිය. ඒ හැම සමාධිම මේ අවිතක්ක සමාධි කියන එකෙන් හැඟෙනව කියල. ඒ කියන්නෙ අර සමථයට අනුව ගිය අර්ථ පිරික්සීමක් මෙතන තියෙන්නේ. ඊළඟට ඒ එක්කම කියනව අටුවාව "ඉධ පන චතුත්ථජ්ඣාන පාදකො අරහත්තඵල සමාධි අවිතක්ක සමාධීති අධිප්පෙතො"[10] නමුත් මෙතනදී චතුර්ථ ධ්‍යානය පාදක කරගත් අරහත්තඵල සමාධිය අවිතක්ක සමාධිය නමින් හැඳින්වෙනවය. ඒ විදියටයි අටුවාව තෝරන්නෙ. නමුත් අපට කියන්න සිද්ධවෙන්නේ, මේ පපඤ්ච විතක්ක ආදි පද පිළිබඳව මෙතෙක් කළ මේ සාකච්ඡාව පසුබිම් කරගෙන බලනකොට, මෙතන මේ අවිතක්ක සමාධි කියල කියන්නෙ අර දෙවෙනි ධ්‍යානයෙ ඉඳල ඉහළට යන ඒ කතාව නොවෙයි, තනිකර සමථයට සීමාවූ අර්ථයක් නොවෙයි, විදර්ශනාවට අදාළ අර්ථයක්. සමථයෙන් කෙරෙන්නෙ විතර්ක විචාර තාවකාලිකව සමනය කිරීමක්. විදර්ශනාවෙන් කෙරෙන්නෙ විතර්ක විචාරවල මුල එහෙම පිටින්ම ශුද්ධ කරල ඒව ගෙවා දමීමක්. ඒව නැතිකර දමීමක්. ඒව විනාශ කිරීමක්. සමුච්ඡේද ප්‍රහාණයක් වගේ දෙයක්. අන්න ඒ අදහසිනුයි ඒ 'අවිතක්ක සමාධිය' අරහත්ත ඵල සමාධියක් වන්නේ.

දැන් එතකොට මේක තවදුරටත් පැහැදිලිකර ගැනීමට ගාථාවේ අර්ථයට බහිමු. ඒ ගාථාවත් අපි පදෙන් පදේ අරගෙන විස්තර කරනකොට තේරුම් ගැනීම වඩාත් පහසු වෙනව. පළමුවැනි පදය "යස්ස විතක්කා විධූපිතා." එතැනදීත් අටුවාව කියන්නෙ "යමකු තුළ විතර්කයන්" - විතර්ක කියන එක තේරන්නෙ සියලු මිථ්‍යා සංකල්ප, කාම විතර්ක ආදී සියලු මිථ්‍යා සංකල්ප විතක්ක නමින් හැඳින්වෙනවය. "විධූපිතා" කියන වචනය තේරන්නෙ අමුතුම විදියකට. "අරියමග්ගඤාණෙන සන්තාපිතා සුසමුච්ඡින්නා" ආර්ය මාර්ග ඥානයෙන් තවන ලද. එහෙම නැත්නම් දවන ලද, ඒ වගේම "සුසමුච්ඡින්නා" සම්පූර්ණයෙන්ම කපා හරින ලද කියන අර්ථයකුත් දීල තියෙනව. නමුත් ඒ විධූපිත කියන වචනයේ ඉතාමත්ම ගැඹුරු තේරුමක් තිබෙන බව අපි කලින් අවස්ථාවක - කලින් දේශනාවකදී - සඳහන් කරල ඇති.[11] විශේෂයෙන්ම අර "සන්ධූපෙති, විධූපෙති" කියන පද දෙකක් එකට යෙදිල තිබුන තැනකදී අපි ඒක විග්‍රහ කළේ 'ධූප' කියන්නෙ - ධූප කියල කියන්නෙ සුවඳ දුම් ආදී දුම් වර්ග-ඒවයෙන් කෙරෙන කෘත්‍ය දෙකක් තිබෙනව. ආරාධනා කිරීම, විරාධනා කිරීම. ඒ කියන්නෙ ළං කරගැනීමටත්, එලවා දැමීමටත්, දෙකටම අපි දුම් ගස්වනව. කට්ටකුමංඩල් සුවඳ දුම් ආදිය අපි සමහරවිට ළංකරගන්නව දේවාරාධනා වගේ ආරාධනා කිරීම්වලට. ඊළඟට යකුන් එහෙම පලවා හැරීමේදී දුම්මලවගේ සමහර දුම් ගහල පලවා හැරිනව. ඔන්න ඔය අර්ථ දෙකයි. එතකොට, "විධූපිතා" පලවා හරිනවා, කියන අර්ථය ගන්න පුළුවන්. විතර්කයන් විධූපනය කිරීමක් මෙතන කියැවෙන්නෙ. එතකොට යමකු තුළ විතර්කයන් විධූපනය කරන ලද්දේද, දුමවා හරින ලද්දේද, කියන එකයි මේ පදයේ අර්ථය හැටියට ගන්න තියෙන්නේ.

ඊළඟට දෙවෙනි පදය ගනිමු. 'අජ්ඣත්තං සුවිකප්පිතා අසෙසා." මෙතෙන්දි "සුවිකප්පිතා" කියන වචනය අටුවාව තේරන්නෙ "සුසමුච්ඡින්නා" කියන වචනයෙන්. නමුත් මෙතෙන්දි 'ඇතුළතින් මැනවින් කපාගන්නා ලද' කියන අර්ථයයි. මේ විකල්ප සංකල්ප, ආකල්ප, ප්‍රකල්ප, කල්පනා ආදී පද රාශියක්ම ඉතාම පැරණි ධාතුරූපයක් වන "කෲප්" ධාතුවෙන් එනව. මේ "කෲප්" ධාතුවෙන් එන වචනවල තියෙන්නෙ "කැපීම, සකස්කිරීම" යන අර්ථයයි. එතකොට මේ සුවිකප්පිතා කියන්නෙ ඇතුළතින්ම මැනවින් කපාගන්නා ලද විතර්කයන්. දැන් එතකොට මේ පද දෙක අපට පද පිළිවෙලට නගන්න වෙන්නෙ "යස්ස අජ්ඣත්තං සුවිකප්පිතා විතක්කා අසෙසා විධූපිතා" යමකු තුළ, ඒ කියන්නෙ රහතන් වහන්සේ කෙනෙකු තුළ, ඇතුළතම මැනවින් කපාගන්නා ලද විතර්කයෝ නිරවශේෂ වශයෙන් දුමවාහරින ලද ද, පලවා හරින ලද ද, කියන අර්ථයයි මෙතන ගත යුත්තෙ.

ඊළඟට ඉතිරි දෙපදය ගැන අපි බලමු. "තං සඞ්ගං අතිච්ච අරූපසඤ්ඤී - චතුයොගාතිගො න ජාතිමෙති" "තං සඞ්ගං අතිච්ච අරූපසඤ්ඤී" කියන පදය අටුවාව තෝරන්නෙ "සඞ්ගං" කියන්නෙ ඇලීම කියන අර්ථයයි. ඒ ඇලීම කියන්නෙ කුමක් ද කියන එක අටුවාව තෝරන්නෙ රාගාදී කෙලෙස් ඇලීම හැටියට. නමුත් මේ "සඞ්ගං" කියන ඒ ඇලීම විතර්කයන් පිළිබඳ ඇලීමයි. විතර්ක සංකල්ප ආදියට ඇති ඇලීමයි මෙතන මේ කියවෙන ඇලීම. එතකොට ඒ විතර්කයන් පිළිබඳ වූ ඒ ඇලීම "අතිච්ච" ඉක්මවා "අරූප සඤ්ඤී" මේක ඊටත් වඩා ගැඹුරු පදයක් - අරූප සඤ්ඤී කියන එක. අටුවාව මේ පදය තෝරන්නෙ අමුතුම ආකාරයකට. "රූප්පන සංඛාතස්ස විකාරස්ස අභාවතො අරූපන්ති ලද්ධනාමං නිබ්බානං" රූප්පන කියල කියන්නෙ වෙනස්වීම කියන අර්ථයෙන්, රූප්පන නම් වූ වෙනස්වීමක් නිවනෙහි නැති නිසා නිවනට 'අරූප' කියන නමක් තිබෙනවය, අන්න ඒ විදියෙ 'අරූප' නම් වූ නිවන අරමුණු කරගත්තු මාර්ගඵල සංඥාව ඇති කියන අර්ථයයි මේ 'අරූප සඤ්ඤී' කියන පදයේ තියෙන්නෙ කියල ඒ විදියටයි අටුවාව තෝරන්නෙ. නමුත් මෙතන ගන්න වෙන්නෙ අපට - 'අරූප සඤ්ඤී' කියන වචනය විග්‍රහකළ හැකි දෙයාකාරයක් තියෙනව. අරූප - සඤ්ඤී කියල බෙදල දක්වන්නත් පුළුවන්. 'අ - රූප සඤ්ඤී' කියල විග්‍රහ කරන්නත් පුළුවන්. මෙතන 'අ' යන්න යොදන්නෙ "න" කියන නැති බව ඇඟවීමටයි. -න රූප සඤ්ඤී, කියන එක වගේ. එතකොට පළමුවැනි අර්ථය ගත්තොත් 'අරූප සඤ්ඤාව ඇති' දෙවෙනි අර්ථය ගත්තොත් 'රූප සඤ්ඤාව නැති.' මේ දෙක එකක් නොවෙයි. මෙතන සියුම් අර්ථ භේදයක් තියෙනව. "අරූප සඤ්ඤාව" ඇති කිව්වොත් එක අර්ථයක්. "රූප සඤ්ඤාව නැති" කිව්වොත් වෙන අර්ථයක්. මෙතෙන්දි අපට ගන්න වෙන්නෙ අර අටුවාවෙ ගත්ත වගේ 'අරූප සංඥාව ඇති' කියන එක නොවෙයි. නිවනට 'අරූප' කියල නමක් තියෙනව කියල එහෙම ගැනීමක් නොවෙයි. මෙතන ගන්න වෙන්නෙ රූප සඤ්ඤාව නැති. මීට දේශනා කීපයකට කලින් අපි සඳහන් කළා මේ විතර්ක වලට උපකාර වන - නිමිති ගැනීම් ආදියට උපකාරවන - මූලික කාරණයක් කියල රූප සංඥාව. ඒකට නිදසුන් වශයෙන් අපි දක්වූව සංයුක්ත නිකායෙ ජටා සූත්‍රය. කීප වරක්ම උද්ධෘත කරල දක්වන්න සිද්ධඋනා. "යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති - පටිඝං රූප සඤ්ඤාච එත්ථ සා ඡිජ්ජතෙ ජටා." යම් තැනෙක නාමයත් රූපයත්, පටිඝයත්, රූප සංඥාවත් සම්පූර්ණයෙන්ම උපරෝධනය කෙරේද, වළක්වාලනු ලැබේද, එතැන මේ අන්තො ජටා බහිජ්ජටා අවුල කපා හරිනු ලැබේ. එතකොට අන්න ඒ රූප සංඥාව ගැනයි මේ ගාථාවෙ කියැවෙන්නෙ. ඒ රූප සංඥාව නැති මේ අර්හත්වයේ දී කෙරුණේ අර අරූප සංඥාවක් ළං කර

ගැනීම නොවෙයි. රූප සංඥාවෙන් මිදීමයි. මක් නිසාද අපි කලින් අවස්ථාවකදී සඳහන් කළා අරූපය තුළත් රූපය ගැබ් වෙලා තිබෙනව. රූපයේම හෙවනැල්ලක් තමයි අරූපය. ඒක නිසා මෙතන කියැවෙන්නෙ අරූපය නොවෙයි. ඊට වඩා ගැඹුරු අර්ථයක් තියෙනව, රූප සංඥාවෙන් මිදීමෙ. මක් නිසාද රූප සංඥාව හේතුකරගෙන තමයි අර නිත්‍ය සංඥාව අනුව නිමිති ගැනීමක් තිබෙන්නෙ. රූප සංඥාව නිසාම තමයි අර පටිඝයක්, ගැටීමක් තිබෙන්නෙ. මේ සංසාර ගැටලුවට මූලික හේතුව ඒකයි. එක්තරා ගැඹුරු තේරුමක් මෙතන තියෙන්නෙ. අන්න ඒ රූප සංඥාව නැතිවුන බවයි මේ 'අරූප සඤ්ඤා' පදයෙන් ගන්න තියෙන්නෙ. "තං සඞගං අතිච්ච අරූපසඤ්ඤී" - ඒ විතර්කයන්ට ඇති ඇල්ම ඉක්මවන රූප සංඥාව ඉක්මවූ ඒ රහතන් වහන්සේ. අවසාන පදයයි දැන් අපට ඉතිරි වෙලා තියෙන්නෙ. "චතුයොගාතිගො න ජාතිමෙති." චතුයෝග කියල කියන්නෙ කාම, භව, දිට්ඨි, අවිජ්ජා කියල කියන බන්ධන - බැමි හතර. මේ 'යෝග' හතරම ඉක්මෙව්ව රහතන් වහන්සේ. මේ සුභූති ස්වාමීන් වහන්සේ, "චතුයොගාතිගො න ජාතිමෙති" ඒව ඉක්මවූ නිසා උපතකට එන්නෙ නැහැ. උපත කියන සංකල්පයකට ඉඩක් නැහැ. දැන් එතකොට මෙයින් අපට පැහැදිලි උනා මේ අවිතක්ක සමාධි කියන වචනයේ එක්තරා ගැඹුරු අර්ථයක් තිබෙන බව.

මේ විතර්කයන් විධූපනය කිරීම ගැන කල්පනා කරල බලන කොට, මේ විතර්ක කියල කියන්නෙ ඇත්ත වශයෙන්ම මාර සේනාවක්. ඔන්න ඔතෙන්දි තමයි අපට මේ යෝගාවචර ජීවිතයට ඉතාමත්ම වැදගත් ප්‍රශ්නයක් වන මේ විතර්ක පිළිබඳ ප්‍රශ්නයට හොඳ පිළිතුරු ලැබෙන්නෙ. මාර සේනාවයි මේ විතර්ක කියල කියන්නෙ. අපි සාමාන්‍යයෙන් මාර සේනාව කියන එක ඕළාරික අර්ථයෙන් ගන්නව නිතරම. නමුත් සමහර සූත්‍ර වල - පධාන සූත්‍රයේ එහෙම - මේ විතර්කයනුත් මාර සේනාව හැටියටයි හඳුන්වල දීල තියෙන්නෙ. පධාන සූත්‍රයේ කියවෙනව "කාමා තෙ පඨමා සෙනා, දුතියා අරති වුච්චති, තතියා ඛුප්පිපාසා තෙ - චතුත්ථී තණ්හා පවුච්චති ......[11] ආදී වශයෙන්. මාරයා අමතල බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කරනව "තුඹේ පළමු වැනි සේනාව කාමයයි. දෙවැනි සේනාව අරතියයි. තුන්වැනි සේනාව කුසගින්න හා පිපාසයයි. හතරවැනි සේනාව තණ්හාවයි ආදී වශයෙන්. ඔය විදියට සේනාව හඳුන්වනව. මෙතන මේ කියවෙන කාමයන් අපි සාමාන්‍යයෙන් හිතන්නෙ වස්තු කියල. නමුත් මෙතන කියැවෙන්නෙ කාමයන් පිළිබඳ සිතිවිලි. කාමයන් පිළිබඳ විතර්කයන්මයි ඇත්ත වශයෙන්ම, ගැඹුරු අර්ථයෙන් සැළකුවාම කාමයන් හැටියට සැළකෙන්නෙ. ඒ බව හොඳින් හෙළිවෙන හොඳ ගාථාවක් සංයුක්ත නිකායෙ සඳහන් වෙනව.

"න තෙ කාමා යානි චිත්‍රානි ලොකෙ - සංකප්පරාගො පුරිසස්ස කාමො,
තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ - අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං"[12]

"න තෙ කාමා යානි චිත්‍රානි ලොකෙ" ලෝකයේ විසිතුරු දේවල් නොවෙයි කාමයෝ. "සංකප්පරාගො පුරිසස්ස කාමො" සංකල්ප රාගයයි මිනිසකුට කාමය වන්නෙ. "තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ" - විසිතුරු දේ ලෝකෙ ඔහේ තිබෙනව. ඒව තිබෙනව තව දුරටත්. "අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං" නමුත් ධීරයන්ට, ප්‍රාඥයින්ට, කරන්ට තියෙන එකම වැඩේ කුමක්ද? ඒව පිළිබඳ ඡන්දය - අර කලින් ශක්‍ර දේවේන්ද්‍රයාත් ප්‍රකාශ කළා ඡන්දය තියෙන්නේ විතර්කය උඩය කියල. එතනින් අපට ඡන්දයත් විතර්කයට සම්බන්ධ බව තේරෙනව - ඒ කාමයන් පිළිබඳ ඡන්දයයි ධීරයන්, ධීර පුද්ගලයින්, දුරු කරන්නේ, හික්මවාගන්නෙ. එයිනුත් අපට පේනව මේ කාම කියන වචනය ගැඹුරු අර්ථයෙන් බලන කොට, අර වස්තු කාමය නොවෙයි මෙතන තියෙන්නෙ. ඒ කාම වස්තූන් හැම එකක්ම පිළිබඳ විතර්කයන්. විතර්කයන් පිළිබඳ ප්‍රශ්නයටයි අපි අවසාන වශයෙන් එන්නෙ. ඒකටම තව නිදසුනක් ගත්තොත් - "ඛුප්පිපාසා" කියල කියනව. මාරයාගේ සේනාවෙ කොටසක් තමයි බඩගින්නයි පිපාසයයි. මේ බඩගින්නයි පිපාසයයි කියන දේවල්ම නොවෙයි මෙතන මේ මාර සේනාව. බඩගින්න පිපාසය නිසා ඇති වෙන විතර්ක. "කිංසු අසිස්සාම කුවංව සෙස්සං"[3] ආදී වශයෙන්, 'මොනවද මං කන්නෙ? කොහෙද නිදන්නෙ?' ආදී වශයෙන් ඇති කර ගන්න විතර්ක, එහෙම නැතිනම් ඒව නැති කම නිසා ඇති වන විතර්ක තමයි මාර සේනා. නිකම්ම කුසගින්නයි පිපාසයයි නොවෙයි. ඔන්න ඔය විදියට අපට පේනව විතර්ක පිළිබඳ ප්‍රශ්නය මෙතන වැදගත් බව. ඒ වගේම කලින් අවස්ථාවක අපි උදාන පාළියෙන් උපුටා දැක්වූව උදාන පාළියෙ බෝධි වග්ගයෙ තුන්වැනි සූත්‍රයෙ ගාථාවක්.

"යදා හවෙ පාතුභවන්ති ධම්මා - ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
විධූපයං තිට්ඨති මාරසෙනං - සූරියොව ඔභාසයමන්තලික්ඛං"

බුදුරජාණන් වහන්සේ සම්බෝධිලාභයෙන් පස්සෙ පළමුවෙනි සතියෙ පර්යංකයෙන් වැඩ ඉඳල හත්වෙනි දවසෙ රාත්‍රියෙ අවසාන යාමයෙ පටිච්චසමුප්පාද ධර්මය අනුලොම ප්‍රතිලොම වශයෙන් දෙයාකාරයටම සම්මර්ශනය කරන අවස්ථා පිළිබඳ උදාන ගාථාවක් මේක. "යදා හවෙ පාතුභවන්ති ධම්මා - ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස" - යම් අවස්ථාවක කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව ධ්‍යාන වඩන්නාවූ රහතන් වහන්සේට - ඒ බ්‍රාහ්මණයාට - ධර්මයෝ පහළ වෙත්ද,- ඒ කියන්නෙ ප්‍රත්‍යයධර්මයෝ වැටහෙත්ද, "විධූපයං තිට්ඨති මාර සෙනං" - ඒ අවස්ථාවේ ඒ රහතන්

වහන්සේ මාරසේනාව පලවා හරිමින් සිටිනව. "සූරියොව ඔභාසයමන්තලික්ඛං" අහස ආලෝකවත් කරන සූර්යයා වගේ. ඔන්න එතකොට අපට ගලපන්න පුළුවන් දන්, මෙතෙක් කියාපු කාරණා අනුව, අර කියාපු මාරසේනාව පලවා හැරීම කුමක්ද කියල. අර පටිච්ච සමුප්පාද ධර්මය අනුලෝම පටිලෝම වශයෙන් මෙනෙහි කිරීම. ඒව ගැන හුඟක් දුරට අපි සාකච්ඡා කරල තියෙනව. ඒ පටිච්ච සමුප්පාද න්‍යාය අනුව කල්පනා කරල බලන කොට මෙන්න මේ විදියෙ දෙයක්: "අස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, අස්මිං අසති ඉදං න හොති ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති" මෙය ඇති කල්හි මෙය වෙයි. මෙය ඇතිවීමෙන් මෙය ඇති වෙයි. මෙය නැති කල්හි මෙය නොවෙයි. මෙය නැතිවීමෙන් මෙය නැති වෙයි. මෙන්න මේ ධර්ම න්‍යායයට එකඟව, මේ ධර්ම න්‍යාය මෙතනට කිට්ටු කරන කොට, මේ එක එක ප්‍රත්‍ය ධර්මයන් ගෙවිල යනව. අන්න ඒ ගෙවී යාමෙන් තමයි අර විතර්කයන් නැතිවෙල යන්නෙ. විතර්කයන් විධූපනය වන්නෙ. මේ හැම එකකම ඇතුළත එකිනෙකට සම්බන්ධව තිබෙන අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, ආදී වශයෙන් ඒ ප්‍රත්‍ය සම්බන්ධතාව - අර ජෝඩු ජෝඩු වශයෙන් ගැලපිල තිබෙන, ඒ ධර්මයන් අතර, ඒ ධර්මයන් මැදින් තිබෙන, ඒ ධර්මයන් හා සම්බන්ධ, ප්‍රතීත්‍ය සමුත්පාද ධර්ම න්‍යායය - දිහා අර විදියට අනුලෝම ප්‍රතිලෝම වශයෙන් බලන කොට, අර එකකවත් ගන්න දෙයක් නැහැ. ඒ හැම එකකම විතර්ක ගෙවිල යනව. ඒව මැකිල යනව අර ඇතිවීම් නැතිවීම් එකවර දකින කොට. විනිවිද දැකීමක්. ඒකෙන්ම තමයි මාර සේනාව පලවා හරින්නෙ. "විධූපයං තිට්ඨති මාරසෙනං" අන්න එතකොට ඒකෙනුත් අපට පේනව මේ මාර සේනාව විධූපනය කරන්නෙ විතර්ක විධූපනය කිරීමෙන්. නැවතත් අපි මේ අවිතක්ක කියන වචනයට එමු -අවිතක්ක සමාධිය.

අර කියාපු සූත්‍රයේ පමණක් නොවෙයි මේ අවිතක්ක සමාධිය ගැන සඳහන් වෙන්නෙ. සාරිපුත්ත ථෙර ගාථාවෙත් සඳහන් වෙනව ඒ වගේ හොඳ ගාථාවක්.

"අවිතක්කං සමාපන්නො - සම්මා සම්බුද්ධසාවකො,
අරියෙන තුණ්හීභාවෙන - උපෙතො හොති තාවදෙ"[15]

'අවිතර්කයට සම වැදුන සම්මා සම්බුද්ධ ශ්‍රාවක තෙම එකෙණෙහිම ආර්ය තුෂ්ණීම්භාවයෙන් යුක්ත වූවෙක් වෙයි.' මේ අවිතක්ක සමාධිය කියල කියන්නෙ අරහත්ත ඵල සමාධියටයි. ආර්යතුෂ්ණීම්භාවය කියලයි කියන්නෙ. සමථයේදී කියනව වගේ අර දෙවෙනි ධ්‍යානය, විතර්ක විචාරයෙන් මිදුන දෙවෙනි ධ්‍යානය ගැන නොවෙයි, මෙතන කියන්නෙ. නියම

ආයතීතුණ්ණිම්භාවය නම් අරහත් ඵල සමාධියයි. විතර්ක පිළිබඳ ප්‍රශ්නයෙන් සම්පූර්ණයෙන්ම මිදුන. අන්න ඒකයි අවිතක්ක සමාධිය. එපමණක් නොවෙයි තවත් ගාථාවල සඳහන් වෙනව. විමලා ථෙරී ගාථාවෙ සඳහන් වෙනව.

"නිසින්නා රුක්ඛමූලම්හි - අවිතක්කස්ස ලාභිනී"[16]

කියල ඒ රහත්තෙරණිය "මම අවිතක්කය ලබාගෙන ගසක්මුල ඉඳගෙන සිටියෙමි." කියල සඳහන් වෙනව. එතැන කියැවෙන අවිතක්කයත් අරහත්තඵල සමාධියයි. එපමණක් නොවෙයි සංයුක්ත නිකායෙ මාර සංයුක්තයෙ "ධීතරො" සූත්‍රයෙ එනව රහතන් වහන්සේගේ ගුණ සමූහයක් සඳහන්වෙන දීර්ඝ ගාථාවක්.

'පස්සද්ධකායො සුවිමුත්තචිත්තො
අසංඛරානො සතිමා අනොකො
අඤ්ඤාය ධම්මං අවිතක්කඣායී ....."[17]

තව දිගට යනව ඒ ගාථාව. රහතන් වහන්සේගේ ගුණ සමුදායක්. "පස්සද්ධ කායො" සන්සුන් කය ඇත්තේ, "සුවිමුත්තචිත්තො" මැනවින් මිදුන සිත ඇත්තේ, "අසංඛරානො" සංස්කාර රැස් නොකරන්නේ, "සතිමා" සතිමත් වූයේ, "අනොකො" විඥානය කොතැනකවත් පැලපදියම් නොවූයේ "අඤ්ඤාය ධම්මං" නිර්වාණ ධර්මය වටහාගෙන, "අවිතක්කඣායී" අවිතර්ක ධ්‍යානය වඩනව. එතන කියන අවිතක්ක ධ්‍යානයත් මේකයි. එතකොට අවිතක්ක සමාධි ආදී පද වලින් මේ අරහත්තඵල සමාධිය හඳුන්වල තියෙන්නෙ යම්කිසි විශේෂ අර්ථයකින්. දැන් මේ කාරණා වලින් අපට පෙනී යනව විදර්ශනාවට අදාළ පදයක් මේ අවිතක්ක සමාධිය කියල කියන්නෙ. තනිකර සමථයට අයිති, අර දෙවෙනි ධ්‍යානය කියන අර්ථය නොවෙයි. මක්නිසාද මේ විතර්කය සම්පූර්ණයෙන්ම ජයගන්න පුළුවන් වන්නෙ අර යටින් තිබෙන පපඤ්චසඤ්ඤා සංඛා ප්‍රහාණය කළාමයි. බුදුරජාණන් වහන්සේ මේ අරහත්ත ඵල සමාධියට සම වැදුන අවස්ථාවක් ගැන උදානපාළියෙ සමහර තැනක සඳහන් වෙනව. "අත්තනො පපඤ්චසඤ්ඤාසංඛා පහාණං පච්චවෙක්ඛමානො නිසින්නො හොති"[18] කියල තමන් වහන්සේ පපඤ්ච සඤ්ඤා සංඛා ප්‍රහාණය කළ බව ප්‍රත්‍යවේක්ෂා කරමින් වැඩ හුන්නයි කියල. එතකොට පපඤ්ච සඤ්ඤා සංඛාවක් - ඒ කියන්නෙ ප්‍රපංච සංඥාවෙන් ඇතිකර ගත්තු ලෝක සම්මත ප්‍රඥප්ති ආදිය- ඒවයින් සිත මුදාගත්ත නම්, ඒ අවස්ථාවේදි අර ඇතුළත විතර්කවලට යටවීමක් කෙරෙන්නෙ නැහැ. විතර්ක ඇති වෙන්නෙ නැහැ. නිමිති ගැනීමක්

නැහැ. අන්න ඒ අර්ථය පැහැදිලි කිරීමටයි අවිතක්ක ඣාන, අවිතක්ක සමාධි ආදී පද යෙදිල තියෙන්නෙ.

තවදුරටත් අපි නිදසුන් දක්වනව නම් මේකට, සංයුක්ත නිකායෙ සගාථක වග්ගයෙ එන සංයෝජන සූත්‍රයෙ[19] දේවතාවෙක් අහනව ප්‍රශ්නයක්.

"කිංසු සංයොජනො ලොකො - කිංසු තස්ස විචාරණං,
කිස්සස්ස විප්පහානෙන - නිබ්බානමිති වුච්චති"

'ලෝකයට ඇති සංයෝජනය, හැකිල්ල, බැම්ම, කුමක්ද? ලෝකය ඇදගෙන යන්නෙ, හසුරුවන්නෙ, ඇවිද්දවන්නෙ, කුමක්ද?, කුමක ප්‍රහාණයෙන්ද නිවනයයි කියනු ලබන්නෙ. නිබ්බානයයි කියල කියන්නෙ කුමක් ප්‍රහාණය කළාමද?'

ඒකට බුදු රජාණන් වහන්සේ දෙන පිළිතුර :

"නන්දි සංයොජනො ලොකො - විතක්කස්ස විචාරණං
තණ්හාය විප්පහානෙන - නිබ්බානමිති වුච්චති"

ලෝකයට ඇති හැකිල්ල - අර මොකක් හරි අමුණන කොක්ක වගේ දෙයක් තමයි මෙතන කියන මේ සංයෝජනය - ඒක තමයි නන්දි. නන්දි කියල කියන්නෙ තුටුවීම, සතුටුවීම. යමක් පිළිබඳව සතුටු වෙන්න පටන් ගත්තාම එතැන ඉඳල විතර්ක වැඩෙනව. එතකොට "නන්දි සංයොජනො ලොකො- "විතක්කස්ස විචාරණං" විතර්කය තමයි ලෝකය ඇදගෙන යන්නෙ. "තණ්හාය විප්පහානෙන" තෘෂ්ණාව සම්පූර්ණයෙන්ම ප්‍රහාණය කිරීමෙන් නිවන යැයි කියනු ලැබේ. මේ අනුවත් අපට පෙනෙනව විතර්කය කියන වචනය විදර්ශනාවට කොයි තරම් වැදගත් පදයක්ද කියල. ඊළඟට තවත් කාරණයක් අපට මෙතෙන්දි ප්‍රකාශ කරන්න පුළුවනි. සුත්ත නිපාතයෙ එන සුන්දරික භාරද්වාජ සූත්‍රයේ සඳහන් වෙනව රහතන් වහන්සේ කෙනෙකුන් පිළිබඳව -

"භවාසවා යස්ස වචීඛරා ච - විධූපිතා අත්ථගතා න සන්ති"[20]

එතැනත් විධූපිතා කියන වචනය සඳහන් වෙනවා. ඒ විමුක්ත පුද්ගලයා- මුනිවරයා - පිළිබඳව, ඒ පුද්ගලයා තුළ භවාශ්‍රවයනුත්, "වචීඛරා" වචීඛරා කියන පදය අටුවාවල තෝරන්නෙ එරුස වචන හැටියට. ටිකකට කල්පනා කරල බැලුවොත් භවාශ්‍රව හා එරුස වචනය රහතන් වහන්සේ තුළ නැති කරලයි කීවාම එතැන මොකක්දෝ නොගැලපෙන බවක් පෙනෙනව. මක්නිසාද? භවාශ්‍රව කියල කියන්නෙ මහා උත්කෘෂ්ට මට්ටමකින් ගත්තු ගැඹුරු ධර්මකාරණයක්. එරුස වචනය කියල කියන්නෙ කටුක එරුස

කියන අදහස නෙ. "කකබලා, එරුසා" නමුත් මෙතනත් ගැඹුරු අර්ථයක් තියෙන්නෙ. "වචීබරා" කියල කියන්නෙ "වචී" - වචනය, සම්පූර්ණයෙන්ම මේ වාගේ ව්‍යවහාරය යට තියෙන රොඩ්ඩ, ක්ෂාරය, වචීබරා. විතර්ක වලට පදනම් වන අර පපඤ්ච සඤ්ඤා සංඛා ආදී වශයෙන් තිබෙන ලෝකප්‍රඥප්ති සමූහයයි මෙතන "වචීබරා" කියල කියන්නෙ. එතකොට රහතන් වහන්සේ තුළ භවාශ්‍රවයනුත් නෑ අර 'වචීරොඩ්ඩ' - වාග්ව්‍යවහාරය පිළිබඳව තියෙන රොඩ්ඩ - ඒකත් නෑ. "විධූපිතා" එය විධූපනය කරල අර මාර සේනාව වගේ පලවා හැරල - දුම්මල ගහල එළවල. "අත්ථගතා" එය කෙළවරයි. "න සන්ති" ඒව තවත් නැහැ. එරුස වචනය නැති බවක් අමුතුවෙන් කියන්න දෙයක් නැහැ රහතන් වහන්සේට.

එතකොට "භවාසවා යස්ස වචීබරා ච-විධූපිතා අත්ථගතා න සන්ති"

ඔය විදියට අර්ථ ගන්න කොට, හැම එකකින්ම අපට පේනව විශේෂයෙන්ම යෝගාවචර ජීවිතයට ඉතාමත්ම අදාළ වූ කාරණයක් තමයි මේ විතක්ක පපඤ්ච ආදී වචන. ඒකයි අපට සූත්‍ර දේශනාවලින් මතුකර ගන්න පුළුවන් වෙන්නෙ.

ඒ වගේම අරහත්තඵල සමාධිය අවිතක්ක සමාධි නමින් හැඳින්වීමෙන් පෙනෙනව මේ විතර්කයන් ජය ගැනීම සාමාන්‍යයෙන් සමථයෙන් කරනව වගේ තාවකාලික ජය ගැනීමක් නොවන බව. ඊට වඩා මේ විතර්කයන්ට යටින් පිහිටි ලෝකප්‍රඥප්ති පිළිබඳ-ලෝක ප්‍රඥප්තිවල තිබෙන සාපේක්ෂක ස්වභාවය, ඒවායේ තිබෙන මිථ්‍යා ස්වභාවය, ඒවා යටින් තිබෙන නිත්‍ය සංඥාව, ආදී හැම එකක්ම ඉක්මවල, නිමිති මකල දාල මුළු ලෝකයම බොඳවූ දිය සායම් චිත්‍රයක් බවට පත් කරගෙන, අර නානත්ත සංඥාවෙන් සිත මුදාගෙන, ඒකත්ත සංඥාවවත් අල්ලගන්නෙ නැතිව, එහෙම පිටින්ම විමුක්ත වූ සිතක් ඇති වීමටයි මේ අවිතක්ක සමාධි කියන පදය යෙදිල තියෙන්නෙ.

අධෝ ලිපි

1. ම.නි. I බු.ජ. 10 - 450 පිට
2. සං.නි. III බු.ජ. 15 - 158 පිට
3. ථෙර බු.ජ. 28 - 264 පිට
4. ථෙරී බු.ජ. 29 - 30 පිට
5. සං.නි. I බු.ජ. 13 - 246 පිට
6. සු.නි. බු.ජ. 25 - 290 පිට
7. දී.නි. III බු.ජ. 8 - 396 පිට
8. ම.නි. I බු.ජ. 10 - 272 පිට
9. ඛු.නි. I බු.ජ. 24 - 272 පිට
10. ප.දී. (හේ.මු.) 6 - 245 පිට
11. සු.නි. බු.ජ. 25 - 128 පිට
12. සං.නි. I බු.ජ. 13 - 42 පිට
13. සු.නි. බු.ජ. 25 - 304 පිට
14. ඛු.නි. I බු.ජ. 24 - 134 පිට
15. ථෙර. බු.ජ. 28 - 230 පිට
16. ථෙරී. බු.ජ. 29 - 24 පිට
17. සං.නි. I බු.ජ. 13 - 230 පිට
18. ඛු.නි. I බු.ජ. 24 - 284 පිට
19. සං.නි. I බු.ජ. 13 - 72 පිට
20. සු.නි. බු.ජ. 25 - 138 පිට

# 30 වන
# දේශනය

# 30 වන දේශනය

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං'

'මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැරදැමීම, තණ්හාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය'

ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනාමාලාවේ තිස් වන දේශනයයි මේ.

ප්‍රායෝගික හා සාපේක්ෂ මූලධර්ම මත සකස්වුනු අනුපුබ්බ පටිපදාවකින්, ක්‍රමානුකූල වැඩ පිළිවෙලකින්, මාර සේනාවක් වැනි විතර්කයන්ගේ ග්‍රහණයෙන් හිත මුදා ගන්නා හැටි මීට කලින් පවත්වන්නට යෙදුනු දේශනාවේදී සාකච්ඡා කෙරුන. තණ්හා මානදිට්ඨි ක්‍රමක්‍රමයෙන් තුනීකරගනිමින් නිප්පපඤ්ච තත්ත්වයට පත්වන රහතන් වහන්සේගේ අර්හත්ඵල සමාධිය අවිතක්ක සමාධිය යනුවෙන් හැඳින්වෙන්නෙ මක් නිසාද යන්නත් තේරුම් ගැනීමට අපි උත්සාහ කළා. මේ අවිතක්ක සමාධිය නියම ආර්යතුෂ්ණීම් භාවයයි. අර සමථ භාවනාවේදී විතක්ක විචාර තාවකාලිකව සංසිඳීම වැනි දෙයක් නොවෙයි. ඊට වඩා ගැඹුරින්, විනිවිද යන නිබ්බේධිකා ප්‍රඥාවෙන්ම, මාර සේනාව ලත් තැන ලොප්කර නිහඬ කර ලීමයි.

දීඝ නිකායේ සක්ක පඤ්හ සූත්‍රය ආශ්‍රයෙන් පපඤ්ච සඤ්ඤා සංඛා නිරෝධයට ක්‍රමයෙන් නැඹුරු වන ප්‍රතිපදාවක් එදා අපි කෙටියෙන් ඉදිරිපත් කළා. සේවනය කළ යුතු - ඇසුරු කළ යුතු - සොම්නසක්, දොම්නසක් සහ උපේක්ෂාවකුත්, සේවනය නොකළයුතු සොම්නසක්, දොම්නසක් සහ උපේක්ෂාවකුත් ඒ සූත්‍රයෙන් ප්‍රකාශ කෙරුන. මේ දෙවැදෑරුම් සොම්නස දොම්නස සහ උපේක්ෂාව ගැන පැහැදිළි විස්තරයක් අපට ලැබෙන්නෙ මජ්ඣිම නිකායෙ සළායතන විභංග සූත්‍රයෙන්.[1] ඒ සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ සත්ත්වයින්ගේ සිතිවිලි ගමන් කරන මාර්ග තිස්හයක් "ඡත්තිංස සත්ත පදා" නමින් හඳුන්වා දෙමින් විස්තර කරනව. "ඡත්තිංස සත්ත පදා

- සත්ත්වයින්ගේ සිකිවිලි ගමන් කරන මාර්ග - අඩිපාරවල්. මේ තිස්හය හඳුන්වල තියෙන්නෙ මේ විදියටයි.

"ඡ ගෙහසිතානි සොමනස්සානි, ඡ නෙක්ඛම්මසිතානි සොමනස්සානි, ඡ ඡ ගෙහසිතානි දොමනස්සානි ඡ නෙක්ඛම්මසිතානි දොමනස්සනි, ඡ ගෙහසිතා උපෙක්ඛා ඡ නෙක්ඛම්මසිතා උපෙක්ඛා"

ඒ කියන්නෙ ගෙහසිත - ගෘහය ආශ්‍රිත වූ - සොම්නස් හයයි. නෙක්ඛම්මය පිළිබඳවූ සොම්නස් හයයි. ඒ වගේම ගෙහසිත දොම්නස් හයයි, නෙක්ඛම්මසිත දොම්නස් කයයි, ගෙහසිත උපෙක්ඛා හයයි නෙක්ඛම්මසිත උපෙක්ඛා හයයි. මේ හය හය වශයෙන් දක්වල තියෙන්නෙ රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියන ඉන්ද්‍රියාරම්මණ හය අනුවයි. දන් ඒ ගෙහසිත සෝමනස්ස හය හඳුනා ගැනීමට අපි එයින් එකක් අර මුලින් කියවුන ඇස පිළිබඳ කාරණය - ඒ සූත්‍රය - අනුව තේරුම් ගන්න බලමු. ඒක විස්තර කරල තියෙන්නෙ මෙහෙමයි. "චක්ඛු විඤ්ඤෙය්‍යානං රූපානං ඉට්ඨානං කන්තානං මනාපානං මනොරමානං ලොකාමිසපටිසංයුත්තානං පටිලාභං වා පටිලාභතො සමනුපස්සතො පුබ්බෙ වා පටිලද්ධපුබ්බං අතීතං නිරුද්ධං විපරිණතං සමනුපස්සතො උප්පජ්ජති සොමනස්සං, යං එවරූපං සොමනස්සං ඉදං වුච්චති ගෙහසිතං සොමනස්සං"

ඒ කියන්නෙ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ මනරම් වූ ලොකාමිසය හා සම්බන්ධ වූ ඇසින් දැකිය හැකි යුතු රූපයන්ගේ දකින්නට ලැබීම - ලැබීමක්-ලාභයක්, හැටියට සළකන්නහුට හෝ පෙර දකින්නට ලැබී දන් නැති වී ගිය, ඉක්මගිය, වෙනස්වී ගිය, එබඳු රූපයක් සිහි කරන්නහුට හෝ ඇතිවන්නා වූ සොම්සනයි. යම් එබඳු සොම්සනක් වේද එයට ගේහසිත සෝමනස්සයයි කියනව.

ඊළඟට නෙක්ඛම්මසිත සෝමනස්සය හඳුන්වල තියෙන්නෙ මෙහෙමයි. "රූපානං ත්වෙව අනිච්චතං විදිත්වා විපරිණාම විරාග නිරොධං, පුබ්බෙ චෙව රූපා එතරහි ච සබ්බෙ තෙ රූපා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො උප්පජ්ජති සොමනස්සං, යං එවරූපං සොමනස්සං ඉදං වුච්චති නෙක්ඛම්මසිතං සොමනස්සං." මේ නෙක්ඛම්මසිත සෝමනස්සය විදර්ශනාව ආශ්‍රයෙනුයි තෝරල තියෙන්නෙ. ඒ කියන්නෙ රූපයන්ගේම අනිත්‍යතාව, විපරිණාම - විරාග - නිරෝධ ස්වභාවය දනගෙන තේරුම් අරගෙන - පෙරවූ රූපත්, දන් මේ රූපත් යන මේ සියලුම රූප අනිත්‍යයි දුක්ඛයි විපරිණාම ස්වභාවයි කියල මෙසේ යථාභූත වශයෙන්, තත්වූ පරිද්දෙන්, සම්‍යක් ප්‍රඥාවෙන් දකින්නහුට ඇතිවන සොම්නස විදර්ශනාවෙන් ලැබෙන එක්තරා සොම්නසක්. අන්න එබඳු

සොම්නසට නෙක්ඛම්ම සිත සෝමනස්සයයි කියනව. ඊළඟට ගෙහසිත දෝමනස්සය හඳුන්වල තියෙන්නෙ මෙහෙමයි. "චක්ඛුවිඤ්ඤෙය්‍යානං රූපානං ඉට්ඨානං කන්තානං මනාපානං මනොරමානං ලොකාමිස පටිසංයුත්තානං අප්පටිලාභං වා අප්පටිලාභතො සමනුපස්සතො පුබ්බෙ වා අප්පටිලද්ධ පුබ්බං අතීතං නිරුද්ධං විපරිණතං සමනුපස්සතො උප්පජ්ජති දොමනස්සං. යං එවරූපං දොමනස්සං ඉදං වුච්චති ගෙහසිතං දොමනස්සං" එතන වෙනස තියෙන්නෙ ඉෂ්ට වූ, කාන්ත වූ, මනාප වූ, ලෝකාමිසය හා සම්බන්ධ වූ, ඇසින් දැකිය යුතු යම්කිසි රූපයක් දකින්නට නොලැබීම, නොලැබීමක් හැටියට සළකන්නහුට - ඒ වගේම අතීතයේ දී එසේ දකින්ට නොලැබුණු අවස්ථාවක් ගැන සිහිපත් කරන්නහුට ඇතිවන දොම්නස. අතීතයේ මෙහෙම එකක් මට දකින්න ලැබුනෙ නැහැ නේද, කියල අන්න ඒ විදියේ දොම්නසක්. ඒක ගේහසිත දෝම්නස්සය. ඊළඟට නෙක්ඛම්මසිත දෝමනස්සය, තේරුම් කරන්නෙ මෙහෙමයි. ඒකත් අර විදර්ශනාමය වශයෙන් "රූපානං චෙව අනිච්චතං විදිත්වා විපරිණාම විරාග නිරොධං පුබ්බෙ චෙ ච එතරහි ච සබ්බෙ තෙ රූපා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මාති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුත්තරෙසු විමොක්ඛෙසු පිහං උපට්ඨාපෙති, කුදාස්සු නාමාහං තදායතනං උපසම්පජ්ජ විහරිස්සාමි යදරියා එතරහි ආයතනං උපසම්පජ්ජ විහරන්තීති ඉති අනුත්තරෙසු විමොක්ඛෙසු පිහං උපට්ඨාපයතො පිහා පච්චයා දොමනස්සං යං එවරූපං දොමනස්සං ඉදං වුච්චති නෙක්ඛම්මසිතං දොමනස්සං"

ඒක ටිකක් විස්තර කළ යුතු දෙයක්. ඒක දිගට තියෙනව. දිග කොටසක් එතැන කියැවෙනව, අර විදර්ශනාව වශයෙන් බලනකොට. ඒකයි, මෙතන ඒ කියන්නෙ රූපයන්ගේම අනිත්‍යතාව තේරුම් අරගෙන - අනිත්‍යතාව පමණක් නොවෙයි 'විපරිණාම විරාග නිරොධං' ඒවායේ වෙනස්වන ස්වභාවය, විරාග නිරෝධ ස්වභාවය, ඒක දැකල, ඒක තේරුම් අරගෙන, පෙර තිබූ රූපත් දැන් තිබෙන ඒවාත් යන මේ සියලුම රූප අනිත්‍යයි දුක්ඛයි විපරිණාම ස්වභාවයි කියල - පිහා කියල කියන්නෙ ආසාව, බලාපොරොත්තුව- ආසාවක් බලාපොරොත්තුවක් තබාගැනීම, අනුත්තර විමෝක්ෂයන් පිළිබඳව ආශාවක් තබාගන්නව. කොහොමද ඒ ආශාව තබාගන්නෙ. "කුදාස්සු නාම අහං තදායතනං උපසම්පජ්ජ විහරිස්සාමි යදරියා එතරහි ආයතනං උපසම්පජ්ජ විහරන්ති" ආර්යයන් වහන්සේලා දැන් යම් ආයතනයකට එළඹ වාසය කරත්ද කවදානම් මම ඒ ආයතනයට එළඹ වාසය කරන්නෙම්දැයි මෙසේ අනුත්තර විමෝක්ෂයන් පිළිබඳව බලාපොරොත්තුවක් ආශාවක් තබන්නහුට ඒ ආශාව නිසා, ඒ බලාපොරොත්තුව නිසා, දොම්නසක් ඇතිවෙනව, මට ඒක තාම ලැබුනෙ

නැහැ නේද කියල. අන්න එබඳු ඒ දොම්නසට නෙක්ඛම්මසිත දෝමනස්සය යැයි කියල කියනව.

දැන් මෙතන විස්තර කළ යුතු වචන දෙක තුනක් තිබෙනව. මෙතන අනුත්තරේසු විමොක්ඛෙසු කියන්නෙ අර අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත කියන ඒ විමෝක්ෂ තුනයි. නිවන ගැන කථාකරන කොට අපි ඒවා ගැන විස්තර සහිතව ප්‍රකාශ කරල තියෙනව. ඊළඟට ඒවගේම ආයතනය කියල මෙතන කියැවෙන්නෙ උදානපාළියෙන් අපි අර නිබ්බාන පටිසංයුක්ත සූත්‍ර විවරණය කරන අවස්ථාවේදී ඒ ඉදිරිපත්වුන වැදගත් සූත්‍රයක තිබුන- "අත්ථි භික්ඛවෙ තදායතනං යත්ථ නෙව පඨවී න අපො" ආදී වශයෙන්.[1] අන්න ඒ "අත්ථි භික්ඛවෙ තදායතනං" කියාපු ඒ ආයතනයයි. මොකක්ද? අපි ඒක තේරුම් කළේ සළායතන නිරෝධ තත්ත්වය -භවනිරෝධ තත්ත්වය- හැටියටයි. සළායතනයන්ගේ නිරෝධය ප්‍රත්‍යක්ෂ කරගත්තු තත්ත්වයයි, ඒ නිබ්බාන පටිසංයුක්ත සූත්‍රයෙන් කියැවෙන්නෙ. අන්න ඒකයි මෙතන ආයතන නාමයෙන් දක්වල තියෙන්නෙ. එතකොට ආර්‍යයන් වහන්සේලා එළඹ වාසය කරන්නෙ මොන ආයතනයටද? ඇස් කන් නාසාදි ආයතනයන් නොවෙයි මෙතැන කියන්නෙ. සළායතන නිරෝධ තත්ත්වයමයි. ඒකම ආයතන නාමයෙන් හඳුන්වල තියෙනව එබඳු ඒ නිබ්බානපටිසංයුක්ත සූත්‍රවල. උදාන පාළියේ ඒ සූත්‍රයේමත් සඳහන් වෙල තිබෙනව අපට හමුඋනා "අප්පතිට්ඨං, අප්පවත්තං, අනාරම්මණං" කියන පද තුන. අපි ඒක විග්‍රහ කළේ අර විමොක්ඛ තුන ආශ්‍රයෙන්. "ප්‍රතිෂ්ඨාවක් නැති" "පැවැත්මක් නැති" "අරමුණක් නැති" කියල කිව්වෙ ඔය විමෝක්ෂ තුනමයි. අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත කියන විමෝක්ෂ තුන. ඒ වගේම දැන් මෙතන අමුතුවෙන් විස්තර කරන්න පුළුවන් අර "පිහා" කියන වචනය. "ස්පෘහා" - 'පිහා' කියල කියන්නෙ ආශාව, බලාපොරොත්තුව. අපි කලින් සඳහන් කළා නිවන ගැන කියන කොට තණ්හාව, ආසාව, කියන වචන ගැන. ඒව යෙදීම ගැන මැලි වෙන්න ඕනෑ නැහැ. මැලිවීම අවශ්‍ය නැහැ. එබඳු ඒ ආශාවන් නිසා දොම්නසක් ඇතිවෙන බවත් ඇත්තයි. නමුත් ඒක අර ගෙහසිත දෝමනස්සයට වඩා උසස්. ඒක ඊට වඩා හොඳයි. නිවන පිළිබඳව ඇතිකර ගත්ත දොම්නස. ඒකයි මෙතන මේ ඒකට තැනක් දීල තියෙන්නෙ. නෙක්ඛම්මසිත දෝමනස්සය.

හොඳයි දැන් එතකොට කියැවුනා - ගේහසිත සෝමනස්සය කියැවුනා. නෙක්ඛම්මසිත සෝමනස්සය කියැවුනා. ගේහසිත සෝමනස්සය කියැවුනා. නෙක්ඛම්මසිත දෝමනස්සය කියැවුනා. ඊළඟට ගෙහසිත උපේක්ෂාව තේරුම් කරල තියෙන්නෙ මෙහෙමයි. "චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජති උපෙක්ඛා බාලස්ස මූළ්හස්ස පුථුජ්ජනස්ස අනොධිජිනස්ස අවිපාකජිනස්ස අනාදීනව

දස්සාවිනො අස්සුතවතො පුථුජ්ජනස්ස උප්පජ්ජති උපෙක්ඛා,යා එවරූපා උපෙක්ඛා රූපං සා නාතිවත්තති තස්මා සා උපෙක්ඛා ගෙහසිතාති වුච්චති." ඇසින් රූපයක් දකල බාලවූ මුළාවූ පෘථග්ජනයාට, "අනොධිජිනස්ස" කියල කියන්නෙ කෙලෙස්සීමාවල් නොදිනූ, "අවිපාකජිනස්ස" කියන්නෙ කර්මයෙ විපාක පක්ෂය ජය නොගත්. "අනාදීනවදස්සාවිනො" කියන්නෙ පංචකාම ආදියෙහි ආදීනව නොදක්නාවූ, අශ්‍රැතවත් පෘථජනයාට උපේක්ෂාවක් ඇතිවෙනව, ඇහින් රූපයක් දකල."යා එවරූපා උපෙක්ඛා රූපං සා නාතිවත්තති" එබඳු ඒ උපේක්ෂාව රූපය ඉක්මවා යන්නෙ නැහැ. රූපය ඉක්මවා පවතින්නෙ නැහැ. මේ රූපය ඉක්මවා පවතින්නෙ නැහැ කියල කියන්නෙ, රූපය ජයගන්න බැහැ එබඳු උපේක්ෂාවකට. ඒක අඥාන උපෙක්ෂාව. ඒක අර බිත්තියක් ඉස්සරහට හිහිල්ල තියෙනව වගේ ඔහේ නැවතිල තියෙනව. රූපය ජය ගැනීමක් ඒකෙන් කෙරෙන්නෙ නැහැ. අන්න ඒ රූපය ඉක්මවා පැවතීමට සමත් නොවන නිසා එබඳු ඒ අඥාන උපේක්ෂාව ගේහසිත උපේක්ෂාව හැටියට හඳුන්වල තියෙනව. ඊළඟට නෙක්ඛම්මසිත උපේක්ෂාව හඳුන්වන්නෙ මෙහෙමයි. ඒකත් අර කලින් කියාදුන් සම්මර්ශන ක්‍රමයමයි. එකම පාඨයයි දිගටම සඳහන් වෙන්නෙ. "රූපානං තෙවව අනිච්චතං විදිත්වා, විපරිණාම විරාග නිරොධං පුබ්බෙ චෙව රූපා එතරහිච සබ්බෙ තෙ රූපා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො උප්පජ්ජති උපෙක්ඛා. යා එවරූපා උපෙක්ඛා රූපං සා අතිවත්තති. තස්මා සා උපෙක්ඛා නෙක්ඛම්මසිතාති වුච්චති" අර කියාදුන් සම්මර්ශනයමයි. මෙතන වෙනසකට තියෙන්නෙ ආකල්පයේ වෙනසයි. ඒ ඒ අවස්ථානුකූලව සොම්නසකුත් අර කියාදුන් සම්මර්ශනයෙන්ම ලබාගත්ත. අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් දැන ගැනීමයි. ඒ වගේම දොම්නසකුත් ලබාගන්න ඉඩ තියෙනව. දැන් මෙතන කියැවෙන උපේක්ෂාවත් ඇතිකරගන්න පුළුවන් රූපයන්ගේම අනිත්‍යතාව තේරුම් ගැනීමෙන්. ඒවායේ විපරිණාම විරාග නිරෝධ ස්වභාවය තේරුම් අරගෙන යථාභූත වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දක්නහුට ඇතිවෙනව එක්තරා උපේක්ෂාවක්. අන්න එතැන කියනව "යා එවරූපා උපෙක්ඛා රූපං සා අතිවත්තති" කියල. අඥාන උපේක්ෂාව වගේ නොවෙයි. රූපය ඉක්මවා පවතිනව. රූපය ජයගන්න පුළුවනි ඒ උපේක්ෂාවට. අන්න ඒක නිසා ඒකට නෙක්ඛම්ම සිත උපේක්ෂාව කියල කියනව.

දැන් එතකොට අපි ඇසට අරමුණුවන රූප පිළිබඳවයි, නිදර්ශන වශයෙන් දක්වූවෙ. මේ විදියටම තමයි තිස්හයම. අර ඉන්ද්‍රිය ආරම්මණ තිස්හයම. බුදුරජාණන් වහන්සේ දක්වල තිබෙනව. ඒ තිස්හය බුදු රජාණන් වහන්සේ

හඳුන්වන්නෙ සත්ත්වයන්ගේ සිතිවිලි ගමන් කරන මාර්ග නමින්. මේ මාර්ග තිස්හය ඔස්සේ කෙනෙකුන් අනුක්‍රමයෙන් නිවනට යොමුකරන ක්‍රමය - ඊට උපකාර කරගන්නා සිද්ධාන්තය බුදුරජාණන් වහන්සේ මේ සළායතන විභංග සූත්‍රයේදී ඉදිරිපත් කරල තියෙන්නෙ, කෙටි පාඨයකින්: "තත්‍රිදං නිස්සාය ඉදං පජහථ" - එහිලා මෙය ඇසුරු කරගෙන මෙය හැර දමව. "ඉදං නිස්සාය" මෙය ඇසුරු කරගෙන, "ඉදං පජහථ" මෙය හැර දමව. මෙය ඇසුරු කරගෙන මෙය හැර දමව. අර " අස්මිං සති ඉදං හොති" ආදී වශයෙන් පටිච්ච සමුප්පාද ධර්මය ගැන කිව්ව වගේ ඒකට ටිකක් නෑ සබඳකමක් පෙන්නුම් කරනව මෙතැනත්. 'මෙය ඇසුරු කරගෙන මෙය හැර දමව', සිද්ධාන්ත ස්වභාවයක් මෙතන තියෙනව. මූල ධර්මයක් වගේ. ඒකත් පටිච්ච සමුප්පාද ධර්මයේම ප්‍රතිඵලයක්. ප්‍රතිපදාවට ළංකර ගත්තහම ඒක, එකක් උපකාර කරගෙන වෙන එකක් අත හරිනව. එක්තරා විදියක නොඇල්මකින් යුතු ප්‍රතිපදාවක් එතන යන්නෙ. "ඉදං නිස්සාය ඉදං පජහථ." ඒ සිද්ධාන්තය අනුව බුදු රජාණන් වහන්සේ ඊළඟට දක්වනව අවස්ථා හතරකින් අර කියාපු සිතිවිලි මාර්ග තිස්හය ඔස්සෙ කෙනෙකුන් නිවන කරා ගෙනයන ආකාරය. මහ පුදුම විදියකට එතැන දක්වන්නෙ. පළමුවෙනි අවස්ථාව- අපි මේ කාලයේ භාවිතාවන අළුත් වචනයකින් කියනව නම්, පළමුවෙනි අදියර - ඒ නිර්වාණගාමී අනුපූර්ව ප්‍රතිපදාවෙ පළමුවෙනි අදියර හැටියට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරන්නේ මේකයි.

"නෙක්ඛම්මසිත සොමනස්ස" හය උපකාර කරගෙන "ගෙහසිත සොමනස්ස" හය අතහරිනව. ඉක්මවා යනව. "තත්‍ර භික්ඛවෙ යානි නෙක්ඛම්මසිතානි සොමනස්සානි තානි නිස්සාය, තානි ආගම්ම ඡ, ගෙහසිතානි සොමනස්සානි තානි පජහථ තානි සමතික්කමථ. එවමෙතෙසං පහානං හොති එවමෙතෙසං සමතික්කමො හොති" ඒ කියන්නේ නෙක්ඛම්මසිත සෝමනස්ස හය - අර ඉන්ද්‍රිය හය අනුවයි හයක් හැටියට දක්වල තියෙන්නෙ - ඒ හය උපකාර කරගෙන ගේහසිත සෝමනස්ස හය පලවා හරිනව. ඒව ඉවත් කරගන්නව. ඒව ඉක්මවනව. ඊළඟට ඒ විදියටම නෙක්ඛම්මසිත දෝමනස්ස හය පිහිට කරගෙන ගේහසිත දෝමනස්ස හයත් තල්ලු කරනව. ඉවත් කරනව. ඒව ඉක්මවනව. ඊළඟට නෙක්ඛම්ම සිත උපේක්ෂා හය උපකාර කරගෙන ගේහසිත උපේක්ෂා හය ඉවත් කරනව. ඔන්න පළමු වෙනි අදියර. පළමු වෙනි අදියර ඉවර වෙනකොට මොකක්ද ඉතිරි වෙන්නෙ? ගේහසිත ඒව ඔක්කොම ඉවරයි. නෙක්ඛම්මසිත සෝමනස්ස හයයි, නෙක්ඛම්මසිත දෝමනස්ස හයයි, නෙක්ඛම්ම සිත උපේක්ෂා හයයි පමණයි ඉතිරි වෙන්නෙ. ඒ පළමු වෙනි අවස්ථාව අවසාන වෙන විට.

ඊළඟට කියවෙනව දෙවෙනි අදියරේදී - අරිටත් වඩා සියුම් කිරීමක් කරන්ට උත්සාහ කරනව. ඒ කියන්නේ දැන් ඉතිරිවෙල තියෙන්නෙ නෙක්ඛම්ම සිත සෝමනස්ස, දෝමනස්ස, උපේක්ෂා කියන ඒවයි. ඒව අතරිනුත් ඊළඟට ප්‍රකාශ කරනව "යානි භික්ඛවෙ ඡ නෙක්ඛම්මසිතානි සොමනස්සානි තානි නිස්සාය තානි ආගම්ම ඡ නෙක්ඛම්මසිතානි දොමනස්සානි තානි පජහථ" ඒ කියන්නෙ නෙක්ඛම්ම සිත සෝමනස්ස හය උපකාර කරගෙන නෙක්ඛම්ම සිත දෝමනස්ස හය දුරලනව. ඉක්මවනව. ඊළඟට ඒ නෙක්ඛම්මසිත උපේක්ෂාව පිහිට කරගෙන නෙක්ඛම්මසිත සෝමනස්සයත් ඉවත් කරනව. මෙයින් අපට පෙනෙන්නෙ නෙක්ඛම්මසිත වශයෙන් බලන කොට ඒ තුනම එක මට්ටමක තබන්න පුළුවන්. නෙක්ඛම්ම සිත සෝමනස්සයත් දෝමනස්සයත් උපේක්ෂාවත් ලබාගත්තෙ එකම විදියේ සම්මර්ශන මාර්ගයකින්. නමුත් ආකල්ප වශයෙන් බලන කොට දෝමනස්සයට වඩා ප්‍රණීතයි, වඩා සියුම්, සෝමනස්සය, සෝමනස්සයට වඩා ප්‍රණීතයි, සියුම්, උපේක්ෂාව - ප්‍රඥාවට ළඟ නිසා. අන්න ඒක නිසා දෙවෙනි අදියරේදී කරන්නෙ අර නෙක්ඛම්ම සිත ඒව අතරිනුත් වඩාත් සියුම් කරනව. ක්‍රමක්‍රමයෙන් සියුම් කිරීමක් මෙතනින් කෙරෙන්නෙ. ඔන්න ඊළඟට දෙවෙනි අදියර අවසාන වෙන කොට ඉතිරි වෙන්නෙ මොකක් ද, නෙක්ඛම්ම සිත උපේක්ෂා හය විතරයි. එතෙන්දි ඉතිරි වෙන්නෙ නෙකඛම්ම සිත උපේක්ෂාව විතරයි. සෝමනස්සයෙන් දෝමනස්සය පලවා හැරිය. උපේක්ෂාවෙන් සෝමනස්සය පලවා හැරිය. එතකොට ඉතිරි වෙන්නෙ උපේක්ෂාව විතරයි.

ඊළඟට තුන් වෙනි අදියර. තුන්වෙනි අදියරේ දී බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනව අර උපේක්ෂාවෙත් ප්‍රභේද දෙකක්. "අත්ථි භික්ඛවෙ උපෙක්ඛා නානත්තා නානත්තසිතා, අත්ථි භික්ඛවෙ උපෙක්ඛා එකත්තා එකත්තසිතා." නා නා අරමුණු ගත්තු - ඒ කියන්නෙ විවිධ අරමුණු ගත්තු විවිධත්ව ස්වරූපයක් ඇති උපේක්ෂාවකුත් තිබෙනව. එකම අරමුණ ගත් ඒකත්ව ස්වරූපයේ උපේක්ෂාවකුත් තියෙනව. මොකක්ද මේ නානත්ව උපේක්ෂාව? ඒක පෙන්නුම් කරන්නෙ අර බාහිර ඉන්ද්‍රිය පහ පිළිබඳ උපේක්ෂාව. ඇස, කණ, නාසය, දිව, කය කියන බාහිර ඉන්ද්‍රිය පිළිබඳව ඇති කරගත්ත උපේක්ෂාව. නානා ආරම්මණ අනුව ඒ ඒ අවස්ථා අනුව ඇති කරගන්නා උපේක්ෂාව. ඊළඟට ඒකත්තසිත උපේක්ෂාව තෝරුම් කරන්නෙ අරූපධ්‍යාන ආශ්‍රයෙන්, ඒ කියන්නෙ ආකාසානඤ්චායතනනිස්සිතා උපෙක්ඛා, විඤ්ඤාණඤ්චායතන නිස්සිතා උපෙක්ඛා, ආකිඤ්චඤ්ඤායතන නිස්සිතා උපෙක්ඛා, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන නිස්සිතා උපෙක්ඛා කියන තනිකර සිත පිළිබඳ වූ සියුම් උපේක්ෂා තත්ත්වයට ඒකත්තසිත උපේක්ෂාව කියල කියනව. ඔන්න දැන් මේ දෙක අතුරින් - නානත්තසිත උපේක්ෂාවත්

ඒකත්තසිත උපේක්ෂාවත් කියන ප්‍රභේද දෙක අතුරින් - බුදුරජාණන් වහන්සේ ඊළඟට පෙන්නුම් කරනව, මේ ඒකත්ත සිත උපේක්ෂාව පිහිට කරගෙන නානත්තසිත උපේක්ෂාව පලවා හරින හැටි. උපේක්ෂා වශයෙන් බලන කොට දෙකම හොඳයි. නමුත් නානත්තසිත උපේක්ෂාව පහළ පන්තියේ. ඒක ඕළාරිකයි. ඒකත්තසිත උපේක්ෂාව ඊට වඩා ප්‍රණීතයි. සියුම්. ඒක නිසා අර නානත්තසිත උපෙක්ඛාව ඒකත්තසිත උපෙක්ඛාව මගින් ඉවත් කරනව. ඉක්මවනව. ඔන්න තුන්වෙනි අදියරත් අවසානයි. හතරවැනි අදියරේදී ඉතිරි වන්නේ ඒකත්තසිත උපේක්ෂාව විතරයි. අර ආකාසානඤ්චායතන ආදී ප්‍රණීත ධ්‍යාන තත්ත්වයෙන් ලබාගත්තු උපේක්ෂාව තියෙන්නෙ. මෙතෙන්දිත් එක්තරා දෙයක් කරනව. මොකක්ද? එතැන තමයි ගැඹුරුම කොටස. "අතම්මයතං භික්ඛවෙ නිස්සාය අතම්මයතං ආගම්ම යායං උපෙක්ඛා ඒකත්තා ඒකත්තසිතා තං පජහථ තං සමතික්කමථ එවමෙතිස්සා පහාණං හොති එවමෙතිස්සා සමතික්කමො හොති" "මහණෙනි අතම්මයතාව පිහිට කරගෙන අතම්මයතාව ඇසුරු කරගෙන - අර ඒකත්තසිත උපේක්ෂාවත් අතහරුව. ඉක්මවව. මෙන්න මේ විදියටයි ඒ ඒකත්තසිත උපේක්ෂාව අතහැරීම, ඉක්මවීම"

මේ අතම්මයතාව කියන එක අපි කලින් දේශනා වලදී සෑහෙන පමණ සාකච්ඡා කරල තියෙනව. ඒක ධර්මයේ එක්තරා සැඟවුන වචනයක්. "අතම්මයතා" - ඒක විග්‍රහ වශයෙන් බලනකොට අර 'තම්මයතා' ආදී වශයෙන් කියන්නෙ 'එයින්ම හටගත්', කියන එකයි. අපි අර රන්මය . රිදීමය ආදී වචන ආශ්‍රයෙන් තේරුම් කළා, 'එයින්ම හටගත්'. යමක් එයින්ම හටගත් තත්ත්වය වගේ වෙන්නෙ කොහොමද? දැන්, ලබාගත්තු යම්කිසි තත්ත්වයක් - අපි හිතමු ආකාසානඤ්චායතනය වගේ තත්ත්වයක් කෙනෙක් ලබාගත්ත කියල - දැන් ඒ ධ්‍යානලාභියා කල්පනා කළොත් "එසො අහං අස්මි" 'මේ තත්ත්වය තමයි මම, 'මෙය මම වෙමි' කියල එහෙම හඳුන ගත්තොත්, අන්න එතැන තියෙන්නෙ තම්මයතාව. ඒක උපාදාන වශයෙන් අල්ලා ගැනීමක්, වෙන විදියකින් කියනව නම් මඤ්ඤනාවක්. මඤ්ඤනා වශයෙන් අල්ලා ගැනීමක්. අන්න ඒ නිසා එබඳු ඒ ඒකත්තසිත උපේක්ෂාව පවා අල්ල ගන්නෙ නැහැ. කුමක් පිහිට කරගෙනද? අර අතම්මයතා කියන මූල ධර්මය පිහිට කරගෙන. "තම්මයතා" කියල කියන්නෙ උපාදාන වශයෙන් - එහෙමත් නැත්නම් යම් දෙයක් පිළිබඳව අස්මිමානයක් ඇති කර ගැනීමෙන්, මෙය මම වෙමි, කියල ගැනීමෙන් - එය අල්ලා ගැනීම. "අතම්මයතා" කියල කියන්නෙ එසේ අල්ලා නොගැනීම - එල්බ නොගැනීම. එය සාමාන්‍ය ඇතිව - නැතිවන දෙයක් හැටියට සැළකීමයි. මේ අතම්මයතා සිද්ධාන්තය මුල් කරගෙන අර

ඒකාන්ත සිත උපේක්ෂාව පවා ඉක්මවන ආකාරය හොඳට පැහැදිලි වෙනව, මජ්ඣිම නිකායේම සප්පුරිස සූත්‍රයෙන්. ඉතාම පැහැදිලි පාඨයක් සඳහන් වෙනව. "සප්පුරිසො ච ඛො භික්ඛවෙ ඉති පටිසංචික්ඛති, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියාපි ඛො අතම්මයතා වුත්තා භගවතා 'යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති අඤ්ඤථා' ති, සො අතම්මයතං එව අන්තරං කරිත්වා තාය නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියා නෙව අත්තානුක්කංසෙති න පරං වම්භෙති, අයම්පි භික්ඛවෙ සප්පුරිස ධම්මො" ඒ සප්පුරිස සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ සත්පුරුෂයෙකුගේ ලක්ෂණ. සත්පුරුෂය කියල මෙතන යොදල තියෙන්නෙ ආර්යපුද්ගලයා පිළිබඳවයි. ඒ ආර්යපුද්ගලයා අර සාමාන්‍ය ධ්‍යානලාභියා බලන විදියට නොවෙයි තමන්ගේ ධ්‍යාන තත්ත්වය දෙස බලන්නෙ. අමුතු දෘෂ්ටි කෝණයකින්. අන්න ඒ සත්පුරුෂයාගේ දෘෂ්ටි කෝණයයි මේ සූත්‍රයෙන් ප්‍රකාශ කරන්නෙ. එතකොට සත්පුරුෂ තෙමේ නුවණින් සලකා බලයි, කල්පනා කරයි. වෙන එකක් තබා නෙවසඤ්ඤානාසඤ්ඤායතන කියන ඒ උසස් තත්ත්වය පිළිබඳව - ඒ සමාපත්තිය පිළිබඳව - පවා අතම්මයතාව භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලදී. නොඇල්ම - එහෙම නැත්නම් - අල්වා නොගැනීම, අතම්මයතාව. කොයි වචනවලින් ද? බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ පාඨය අපි කලිනුත් ප්‍රකාශ කරල තියෙනව. "යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති අඤ්ඤථාති." යම් යම් දෙයකින් මඤ්ඤනාවක් ඇතිකර ගනියි ද? මඤ්ඤනාවක් කියල කියන්නෙ මමත්වය අනුව ගිය හැඟීම්. යම් යම් දෙයක් පිළිබඳව මමත්වය අනුව ගිය හැඟීම් ඇතිකර ගන්නවද, එසේ ඇති කර ගැනීම නිසාම ඒක වෙනස් වන ස්වභාවයකට පත්වෙනව. ඒක 'දෙයක්' වෙනව. 'දෙයක්' උන නිසාම ඒක 'අන් - දෙයක්' වෙනව. අන්න ඒ ධර්මතාව, ඒක, සිහිපත් කර ගන්නව අර සත්පුරුෂ පුද්ගලයා. එහෙම තේරුම් ගැනීම නිසාම, ඒ සමාපත්ති තත්ත්වය නිසා අත්තුක්කංසන පරවම්භන වශයෙන් - තමා හුවා දක්වීම් අනුන් හෙළා දැකීම් වශයෙන් - මට විතරයි මේක තියෙන්නෙ අනික් අයට මෙහෙම සමාපත්තියක් නැහැ කියල ඒ විදියට මඤ්ඤනා ඇති කර ගන්නෙ නැහැ. අන්න ඒකයි සත්පුරුෂ ධර්මය කියලයි බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ.

එතකොට එයිනුත් අපට හෙළි වෙනව මේ අතම්මයතාව නිවනට එළඹෙන මාර්ගයයි. ක්‍රම ක්‍රමයෙන් අර විදියට ඖදාරික තත්ත්වයෙන් සියුම් තත්ත්වයට පමුණුවලා අර සත්ත්වයින්ගේ සිතිවිලි ගමන්කරන මාර්ග බුදුරජාණන් වහන්සේ අවසානයේ අතම්මයතාවෙන් කුළුගන්වනව. අතම්මයතාව ඔස්සේ නිවනට ළං කරනව, අනුපාදාන තත්ත්වයට. අනුපාදාපරිනිබ්බානයට ළං

කරනව. මේ සූත්‍රය ආශ්‍රයෙන්ම අපට පේනව බුදුරජාණන් වහන්සේ "තත්‍ර ඉදං නිස්සාය ඉදං පජහථ" කියල ඉදිරිපත් කළ සිද්ධාන්තය තුළ තිබෙනව එක්තරා විදියක 'මෙනෙහිකිරීමත්' - 'නොමෙනෙහි කිරීමත්' කියන ද්වයතාව. ඒ කියන්නෙ - වඩ වඩා සියුම් දේවල් මෙනෙහි කිරීමෙන් ඕළාරික දේවල් නොමෙනෙහි කිරීමට සැළැස්වීමේ ක්‍රමයයි, මෙතන තියෙන්නෙ. ඒ ප්‍රතිපදාව - එතකොට මෙනෙහි කිරීමත් මෙතන වැදගත්, නොමෙනෙහි කිරීමත් වැදගත්. යමක් නොමෙනෙහි කිරීමට අවශ්‍ය උනාම නව දෙයක් මෙනෙහි කරනව. ඒ ඕළාරික දේ නොමෙනෙහි කිරීමට ඊට වඩා සියුම් දෙයක් මෙනෙහි කරනව. හැබැයි එතනින් නවතින්නෙ නැහැ. ඊටත් වඩා සියුම් දෙයක් මෙනෙහි කරල අරකත් පන්නල හරිනව. මහ පුදුම අන්දමේ ධර්මතාවක් එතැන තියෙන්නේ. දැන් මේව තුළින් අපට හෙළිවෙන්නෙ අර කලින් අප සඳහන් කළ වචන දෙකයි.

'ප්‍රායෝගික', 'සාපේක්ෂ' - මුළු මහත් බෞද්ධ ප්‍රතිපදාවම තේරුම් ගැනීමට උපකාරවන වචන දෙකක්. ප්‍රායෝගික කියල කියන්නෙ 'යම් කිසි ප්‍රයෝජනයක් සළකාගෙන' කියන අර්ථයයි. අදහසයි. සාපේක්ෂ කියල කියන්නෙ 'තවත් එකක් හා සම්බන්ධ' ඒකාන්තක වටිනාකමක් නැතෙයි කියන අදහසයි, සාපේක්ෂ කියන වචනයෙන් දෙන්නෙ. එතකොට, හැමදෙයකටම ප්‍රායෝගික සාපේක්ෂ වටිනාකමක් අනුවයි මේ ප්‍රතිපදාවේ තැනක් ලැබෙන්නෙ. යම්කිසි අර්ථයක් සළකාගෙන - ඒ වගේම ඒක තවත් එකකට සම්බන්ධවෙල - තනිකර නොවෙයි. තනිකර නම් ඒක ඒකාන්තයි. කරපින්නාගෙන යන්න පුළුවන් ඒක. එහෙම එකක් නැහැ මෙතැන. එතකොට මේ මෙනෙහි කිරීමත් නොමෙනෙහි කිරීමත් පිහිට කරගෙන වඩ වඩාත් සියුම් දෙයින් ඕළාරික දේ පන්නා හරින ධර්මතාව ඊටත් වඩා තේරුම් ගැනීමට පහසු අන්දමින් අපට ඉදිරිපත් කරල තියෙනව- මජ්ඣිම නිකායෙ විතක්කසණ්ඨාන සූත්‍රයේ, වඩුවකුගෙ උපමාවෙන්.[3] මේ වඩුව අපට බොහොම ප්‍රයෝජනවත් වෙනව. දැන් මෙතෙන්දිත් බුදුරජාණන් වහන්සේ වඩුවකුගෙ උපමාවකින් දක්වන්නෙ. මෙතන උපමාව හැටියට දක්වන්නෙ - "සෙය්‍යථාපි භික්ඛවෙ පලගණ්ඩො වා පලගණ්ඩන්තෙවාසීවා සුඛුමාය ආණියා ඔළාරිකං ආණිං අභිනීහනෙය්‍ය අභිනීහරෙය්‍ය අභිනිවජ්ජෙය්‍ය එවමෙව ඛො භික්ඛවෙ භික්ඛුනො යං නිමිත්තං ආගම්ම යං නිමිත්තං මනසිකරොතො උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි තෙන භික්ඛවෙ භික්ඛුනා තම්හා නිමිත්තා අඤ්ඤං නිමිත්තං මනසිකාතබ්බං කුසලූපසංහිතං" ඒ කියන්නෙ 'මහණෙනි දක්ෂ වඩුවෙක් හෝ වඩු අතවැසියෙක් හෝ සියුම් ඇණයකින් රළු ඇණයකට ගසන්නේ යම්සේද, එය ඇද දමන්නේ යම්සේද, ඉවත් කරන්නේ යම්සේද

එසේම, යම් නිමිත්තක් යම් අරමුණක් නිසා, යම් අරමුණක් මෙනෙහි කරන විට යම් කිසි භික්ෂුවකට ඡන්දය ද්වේෂය මෝහය හා සම්බන්ධ වූ පාපක අකුසල විතර්ක උපදී නම් ඒ භික්ෂුව ඒ නිමිත්ත හැර, ඒ අරමුණ හැර, කුසලූපසංහිත - කුසලය හා සම්බන්ධ - අනෙක් නිමිත්තක් මෙනෙහි කළ යුත්තේය." කියල ඒ විදියට දක්වනව.

එතකොට මෙතන මේ කියන උපමාව අනුව අපට පෙනෙනව, මෙතන තිබෙන්නෙ, දැන් ඔය දොරක් එහෙම හදන කොට වැරදිලා ඇණයක් ගැහුනම ඒ ඇණය ඉවත් කරන්නේ ඊට වඩා සියුම් ඇණයකින් ගහල. අර සියුම් ඇණය තියාගන්න නොවෙයි එතන අදහස. ලොකු ඇණය පන්නා දමීමටයි, අර සියුම් ඇණය අතට ගන්නෙ. අන්න ඒ වගේ දැන් මෙතනත් මේ විතක්ක සණ්ඨාන සූත්‍රයේ පෙන්නුම් කරනව ඡන්ද ද්වේෂ මෝහ පිළිබඳ අකුසල විතර්ක බැහැර කිරීමට කුසලය හා සම්බන්ධ වූ විතර්කයක් උපකාර කරගන්න හැටි. දැන් මෙතනින් පෙනෙන හැටියට එතකොට මේ ප්‍රායෝගික සාපේක්ෂ මූලධර්මය මේ ඇණ ඉගිලීමේ උපමාව අනුවත් තේරුම් ගන්න පුළුවන් වඩා පහසුවෙන්. මේ ඇණ ඉගිලීම ඇණ හිරවීමකට -'ඇණ හිටීමකට' - ඉඩ නොතබන එකක්. ඇණ උගුල්ලන්න ගියාම බොහෝ විට සිදුවෙන්නෙ ඇණ හිරවෙනව, 'ඇණ - හිටිනව.' ඒ මොකද එකක් පන්නන්න ගත්තු ඇණේ එතන ගිහින් හිර වෙනව. ඒක වෙන්නෙ අර උපාදානය නිසා. අන්න ඒ උපාදානය නැති එකමයි මේ බෞද්ධ ප්‍රතිපදාවේ මූලික ලක්ෂණය. ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය සා වැදූන ප්‍රතිපදාවක් නිසයි මේක. 'අතම්මයතා' කියන පදයෙන් පෙන්නුම් කරනව අන්න අර ඇණ හිරවීම්, ඇණ හිටීම් වලට ඉඩ නොතබන තත්ත්වය. අතම්මයතා- එක්තරා විදියක විරාගයකින්, එහෙම නැත්නම් යම්කිසි කාර්‍යයක් ඉෂ්ටකර ගැනීම සඳහා පමණයි කියන අදහසයි.

ඒ වගේම මේ කුසල-අකුසල කියන පද දෙක පිළිබඳවත් අපි ටිකක් ගැඹුරින් කල්පනා කරන බැලුවොත්, 'කුසල' කියන වචනයේ තේරුම දක්ෂ කියන එකයි. 'අකුසල' කියල කියන්නෙ අදක්ෂ. මේ දක්ෂ බවත්, අදක්ෂ බවත්, එකිනෙකට සාපේක්ෂකයි. දක්ෂ කියල කියන කොට අදක්ෂ කියන වචනය මතක් වෙනව. අදක්ෂ කියන කොට දක්ෂ කියන වචනය මතක් වෙනව. ඒව සාපේක්ෂ නිසාම මේ එකකවත් ඒකාන්ත වටිනාකමක් නැහැ. කුසලයෙහි පවා ඒකාන්ත වටිනාකමක් නැහැ. මේ කුසල් දේවල් අපි උපකාර කරගන්නෙ අර අකුසල් තල්ලු කරල දාන්න. ඒ වැඩේ කරගත්තට පස්සෙ අර අතම්මයතාව- ඒව පිළිබඳවවත් අල්ලගන්නේ නැහැ. ඔන්න ඔය නිසා තමයි අර ඇණහිටීම් ඇණහිරවීම් ආදියකට

ඉඩක් නැත්තෙ. එපමණක් නොවෙයි සළායතන විභංග සූත්‍රය පිළිබඳ ඒ විග්‍රහයෙන් එහෙමත් අපට හෙළි උනා - වෙන ආගම් වල නම් ද්වයතාව, දෙකක් හැටියට පෙනෙන එක, ජය ගන්නෙ ඒකත්වයෙන්. ඒකත්වයට පත් උනහම ඔක්කොම හරි කියල හිතාගන්නව. මේ සංසාර ප්‍රශ්නය ගැන කථාකරන කොට නිතරම ද්වයතාව කියන වචනය යෙදුන. දෙකක් ඉදිරිපත් වෙනව හැම එකේම. මේ දෙක එකක් කර ගෙන අල්ලා ගැනීම වූ ඒකත්වය විසඳුම නොවෙයි. ඒ වෙනුවට තියෙන්නේ අතම්මයතාව. කිසිවක් අල්වා නොගැනීමේ ප්‍රතිපදාවයි.

දැන් සංසාර ස්වභාවය ගැන ප්‍රකාශ කරන කොට සංසාරයට බැඳිල සත්ත්වය ගමන් කරන්නෙ. සමහර විට වචන දෙකක් ඒකට යොදනව. සංයෝජන කියන වචනය යොදනව. සංයෝජනය කියල කියන්නෙ හැකිල්ල. එහෙම නැත්නම් බන්ධනය. බඳින්න දෙකක් තියෙන්න ඕන. අර ගවයින් දෙන්නෙක් ඈඳුවා වගේ. ඒ වගේම උපාදාන කියන පදයත් නිතර යෙදෙනව, සංසාර ස්වභාවය ගැන ප්‍රකාශ කරන කොට. උපාදාන කියන්නෙ අල්ලගෙන සිටීම. අල්ලගෙන සිටීමේදීත් අර දෙකක් පිළිබඳ හැඟීම තියෙනව. අල්ලාගන්න කෙනෙක් ඉන්නව, අල්ලාගන්න දෙයක් තියෙනව. "සංයෝජන" කියන කොටත් අර දෙකක් පිළිබඳ හැඟීම තිබෙනව. ඔය ද්වයතාව, මෙන්න මේ ද්වයතාව, ඉක්මවීම පහසුවෙන් කළ හැකි දෙයක් නොවේ. මේ සංසාරයේ ඉතාමත් සියුම්ම ප්‍රශ්නය එතනයි. ඒකත්වය ඊට විසඳුමක් නොවෙයි. මේ දෙකම එකයි කියල ගැනීමම විසඳුමක් නොවෙයි. ඉතාමත්ම සියුම් අන්දමකිනුයි මේ ප්‍රශ්නය විසඳන්න සිද්ධ වෙන්නෙ.

ඒකට දීපු පිළිතුර ඉතාමත්ම හොඳින් අපට හමුවෙනව, සංයුත්තනිකායේ පළමුවැනිම සූත්‍රයෙන්. ඒක සංයුක්ත නිකායේ මුලටම දාලා තියෙන්නෙත් ඒ වැදගත් කම නිසා. 'ඕඝතරණ' සූත්‍රය. සැඩවතුරින් එතෙර වීම පිළිබඳ සූත්‍රයක්. දේවතාවෙක් ඇවිල්ල බුදුරජාණන් වහන්සේගෙන් අහනව "කථන්නු ත්වං මාරිස ඔඝං අතරි" නිදුකාණෙනි ඔබ කොහොමද මේ සැඩ වතුරින් එතෙර උනේ. "බුදුරජාණන් වහන්සේ ඊට දෙන පිළිතුර "අප්පතිට්ඨං ඛ්වාහං ආවුසො අනායූහං ඔඝං අතරිං" - "නොනවතිමින් නොදඟලමින් සැඩවතුරින් එතෙර වුනෙමි. ඇවැත්නි මම නවතින්නෙත් නැතිව දඟලන්නෙත් නැතිව සැඩ වතුරින් එගොඩ උනා. ඊළඟට මේ දේවතාවාට එක පාරටම ඒක තේරුම් ගන්න බැරිව අහනව: "යථා කථං පන මාරිස, අප්පතිට්ඨං අනායූහං ඔඝං අතරි." "හරියට කියනවා නම් කොහොමද නිදුකාණෙනි ඔබ එසේ නැවතී සිටින්නෙත් නැතිව දඟලන්නෙත් නැතිව ඒ සැඩ වතුරින් එතෙර උනේ. එතකොට බුදු රජාණන් වහන්සේ ඒකට යම්කිසි අදහසක් ගැනීමට

උපකාරවන පාඨයක් දේශනා කරනව. "යදාඛ්ඛ අහං ආවුසො සන්තිට්ඨාමි, තදාඛ්ඛ සංසීදාමි. යදාඛ්ඛ අහං ආවුසො ආයූහාමි තදාඛ්ඛ නිබ්බුයහාමි. එවං ඛ්වාහං ආවුසො අප්පතිට්ඨං අනායූහං ඔඝං අතරිං."

ඇවැත්නි මම යම් විටෙක නැවතී සිටිම්ද එවිට මම ගිලා බසිමි. යම් විටෙක දඟලම්ද - එහෙම නැත්නම් පමණට වඩා උත්සාහ කෙරෙම්ද කියන එකයි 'ආයූහාමි' කියන වචනයේ තේරුම - තේරුම් ගන්න පහසු වෙන්න අපි "දඟලනව" කියල ගත්ත. යම් විටෙක දඟලම්ද, එවිට ගසාගෙන යෙමි. මෙන්න මේ කාරණය නිසයි මම අර නොවකිමින් නොදඟලමින් සැඩ වතුරින් එතෙර උනා කියල ප්‍රකාශ කළේ කියල බුදු රජාණන් වහන්සේ පිළිතුරු දුන්න. එතකොට අර දේවතාවා ඒකට සතුට ප්‍රකාශ කිරීම් වශයෙන් ගාථාවක් කියනව.

"චිරස්සං වත පස්සාමි - බ්‍රාහ්මණං පරිනිබ්බුතං
අප්පතිට්ඨං අනායූහං - තිණ්ණං ලොකෙ විසත්තිකං"

'නැවතී සිටින්නෙත් නැතිව දඟලන්නෙත් නැතිව විසත්තිකා නම් වූ මේ ලෝකයේ ඇලෙන සුළු තණ්හාවෙන් එතෙරව පිරිනිවියා වූ - නිර්වාණය ලබාගත්තා වූ - බ්‍රාහ්මණයකු මම බොහෝ කාලයකට පසු දකිමි', කියල ඔය විදියට දේවතාවා ප්‍රකාශ කළා.

දැන් එතකොට මේ ඕඝතරණ සූත්‍රයෙන් අපට පේනව මධ්‍යම ප්‍රතිපදාවේ ඇති යම් යම් සියුම් ලක්ෂණ. සැඩ වතුරකට හරි, දිය වැලකට හරි, අහුවුන කෙනෙක් රැඳී සිටින්න- නැවතී සිටින්න - උත්සාහ කළොත් ගිලා බහිනව. එයින් මිදෙන්න කලබල වෙලා දඟලුවොත්, ගහගෙන යනව. මේ අන්ත දෙකටම නොවැටිල, සීරුවෙන්, අනුක්‍රමයෙන්, එක්තරා අනුපිළිවෙලක ප්‍රයත්නයකින්, සැඩ වතුරින් එගොඩ වෙන්න සිද්ධ වෙනව, දක්ෂ පිහිනුම් කාරයෙක් වගේ. එතකොට මෙන්න මේක නිසා තමයි බුදු රජාණන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාවේදී පවා - ධම්මචක්කපවත්තන සූත්‍රයේදී පවා ප්‍රකාශ කළේ- ලෝකයේ තිබෙන අන්ත දෙක තමයි කාමසුඛල්ලිකානු යෝගය- අත්තකිලමථානුයෝගය. මේ අන්ත දෙක හරියට අර සැඩ වතුරට සාමාන්‍ය ලෝකයා දක්වන ආකල්ප දෙක වගේ. කාමසුඛල්ලිකානුයෝග කියල කියන්නෙ කාම සුඛයෙහි ඇලී රැඳී සිටීම. අත්තකිලමථානුයෝග කියන්නෙ සිරුරට වද දෙමින් දඟලීම. ඉක්මනට විමුක්තිය ලබා ගන්න දඟලනව. එතකොට ඔන්න ඔය අන්තදෙකටම මැදිනුයි - අන්ත දෙකම ඉක්මවලයි බුදු රජාණන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාව වශයෙන් ආර්යඅෂ්ටාංගික මාර්ගය ඉදිරිපත් කළේ.

මෙයිනුත් අපට පෙනෙනව සැඩ වතුරක් පිළිබඳ ධර්මතාවමයි මෙතනත් තියෙන්නෙ, මුළු මහත් සංසාරයම, දියවැලක්, එහෙම නැත්නම් සැඩවතුරක් හැටියට ගත්තොත් එයින් එතෙර වීමට සීරුවෙන් අර විදියෙ සියුම් ප්‍රයත්නයක් දැරිය යුතුව තිබෙනව. අපි ඒ වගේම අර පටිච්ච සමුප්පාද ධර්මය ගැන විග්‍රහ කරන අවස්ථාවල - මුල් දේශනා වලදීම - ඒ පටිච්ච සමුප්පාද ධර්මය තේරුම් ගැනීමට පහසු වීමට දියසුළියක උපමාව ගත්ත. ඒ දියසුළියම අපි නැවතත් මතුකර ගත්තොත් - ඒ දිය සුළිය අනුව කල්පනා කරල බලනව නම්- ඒ අනුව අපට කියන්න පුළුවන් "අවිද්‍යාව නිසා සංස්කාර ප්‍රවාහයට අහුවෙල විඤ්ඤාණ නාමරූප දෙක අතරෙ කරකැවෙන එකයි සාංසාරික සත්ත්වයාගේ ස්වභාවය." අවිද්‍යාව එහෙම නැත්නම් විපල්ලාස කියලත් කියන්න, පුළුවන්. 'අනිච්චෙ නිච්චසඤ්ඤා දුක්ඛෙ සුඛසඤ්ඤා ආදී වශයෙන් සතර විපල්ලාස නිසා. එහෙම නැත්නම් අවිද්‍යාව නිසා - විපරීත අදහස් නිසා සංස්කාර ප්‍රවාහයක් ගලාගෙන එනව. ඒ සංස්කාර, අර විඤ්ඤාණ - නාමරූප දෙක අතරෙ කරකැවෙනව. ඕකයි දිය සුළිය. මේ විදියට දිය සුළියක් කර කැවෙන කොට, දැන් සාමාන්‍යයෙන් දිය සුළියක් තිබෙන තැනකට පොඩි කොළයක් දැම්මත් ඒකත් කරකැවෙනව. අන්න ඒ වගේ මේ මුළු මහත් සංසාරයේම ස්වභාවය අර ද්වයතාව. ඒක නිසාම මෙයින් මිදීමත් සියුම් ප්‍රයත්නයකින්ම කළ යුත්තක් වෙනව. සියුම් අන්දමට ඒ ප්‍රශ්නය විසඳන්න සිද්ධ වෙනව. මේ නිසා තමයි මෙතන "අප්පතිට්ඨං අනායූහං" ආදී ඒ පද දැක්වුවෙ. අර අන්ත දෙකට යන්නෙ නැතිව, - රැඳී සිටින්නෙත් නැතිව ඒ වගේම දහලන්නේත් නැතිව, අර සැඩපහරින් එතෙර වීමයි.

දැන් මෙන්න මේ විදියට මේ අන්ත දෙක අත හැරල මැදුම් පිළිවෙතකින් මේ විමුක්තිය ලබා ගත යුතුයි, කියල ප්‍රකාශ කරන කොට ඒ කාලයේ සිටි අන්ත වාදී දෘෂ්ටිගත්තු අය බුදු රජාණන් වහන්සේට නොයෙකුත් විදියේ උපහාසාත්මක වචන ප්‍රකාශ කළා. එහෙමනම් ඔබ ප්‍රකාශ කරන්නෙ මහ මුළාවක් විදියේ ධර්මයක්ය කියලා. එබඳු අවස්ථාවක් අපට හමුවෙනව සුත්තනිපාතයේ අට්ඨක වග්ගයේ මාගන්දිය සූත්‍රයෙන්.[4] මේ මාගන්දිය සූත්‍රයේදී මාගන්දිය බ්‍රාහ්මණයා බුදු රජාණන් වහන්සේගෙන් ප්‍රශ්නයක් අසනව. "අජ්ඣත්තසන්තීති යමෙත මත්ථං - කථන්නු ධීරෙහි පවේදිතං තං" අධ්‍යාත්ම ශාන්තිය කියල යම්කිසි කාරණයක් - යම් කිසි දෙයක් ලෝකයේ තියෙනවද, ඒක ධීරයන්, ප්‍රාඥයින්, කොයි ආකාරයකින්ද ප්‍රකාශ කරන්නෙ. මේ අධ්‍යාත්ම ශාන්තිය කොයි ආකාරයකින්ද ලබාගන්නෙ කියන එකයි ප්‍රශ්නය. ඒකට බුදු රජාණන් වහන්සේ දෙන පිළිතුර මෙන්න මේ විදියයි.

"න දිට්ඨියා න සුතියා න ඤාණෙන
සීලබ්බතෙනාපි විසුද්ධිමාහ
අදිට්ඨියා අස්සුතියා අඤාණා
අසීලතා අබ්බතා නොපි තෙන
එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය
සන්තො අනිස්සාය භවං න ජප්පෙ"

න දිට්ඨියා න සුතියා න ඤාණෙන - දෘෂ්ටියෙනුත් නොවෙයි ශ්‍රැතියෙනුත් නොවෙයි - සුති කියන එක අපි ගනිමු උගත්කම කියල, සුති කියල කියන්නෙ කණෙන් අහල ලබාගත්ත දැනුම - එතකොට දෘෂ්ටියෙනුත් නොවෙයි උගත් කම්නුත් නොවෙයි, ඤාණයෙනුත් නොවෙයි, සීලයෙනුත් නොවෙයි, ව්‍රතයෙනුත් නොවෙයි, විශුද්ධියක් ලබාගන්න පුළුවන් වෙන්නෙ. ඊළඟ පද දෙකෙන් කියැවෙනව මහ පුදුම කියමනක්. 'අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නොපි තෙන' දෘෂ්ටිය නැතිව, ශ්‍රැතිය නැතිව, ඤාණය නැතිව, සීලය නැතිව, ව්‍රතය නැතිව, මේවයිනුත් නොවෙයි විශුද්ධිය ලබන්නෙ. අන්තිම පද දෙකෙන් කියැවෙන්නෙ - 'එතෙ ච නිස්සජ්ජ' මේ හැම එකක්ම අතහැරල, 'අනුග්ගහාය' අල්ලගන්නෙ නැතිව, 'සන්තො' ශාන්ත වූ පුද්ගලයෙම 'අනිස්සාය' කිසිවකට හේත්තු වෙන්නෙ නැතිව, කිසිවක් අල්ලගන්නෙ නැතිව, "භවං න ජප්පෙ" භවයක් ප්‍රාර්ථනා නොකරන්නේය. මේ පිළිතුර දුන්නාම අර මාගන්දිය බ්‍රාහ්මණයාට මේක තේරුම් ගන්න බැහැ. ප්‍රහේලිකා විදියෙ ගාථාවක් වගෙයි. මේ බ්‍රාහ්මණය ඊළඟට ප්‍රකාශ කරනව,

"නො චෙ කිර දිට්ඨියා, න සුතියා න ඤාණෙන
සීලබ්බතෙනාපි විසුද්ධිමාහ
අදිට්ඨියා අස්සුතියා අඤාණා
අසීලතා අබ්බතා නොපි තෙන
මඤ්ඤෙමහං මොමුහමෙව ධම්මං
දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං"

හොඳයි ඔබ කියන හැටියට දිට්ඨියෙන්වත් සුතියෙන්වත් ඤාණයෙන්වත් සීලයෙන් වත් ව්‍රතයෙන්වත් විසුද්ධියක් නැහැ. ඒ වගේම දිට්ඨියක් නැතිව - දිට්ඨියෙන් තොරව - සුතියෙන් තොරව, සීලයෙන් තොරව, ව්‍රතයෙන් තොරව, මේවායින් තොරවත් විසුද්ධියක් නැහැ. එහෙම කියනව නම් "මඤ්ඤෙමහං මොමුහමෙව ධම්මං" එහෙම නම් මට හැඟෙන්නෙ ඔබේ ධර්මය මහා මුළාවක්. මොකද?, "දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං" ඇතැම් ශාස්තෘවරු දෘෂ්ටියෙන්මත් සුද්ධිය ඇති වෙනව කියල ප්‍රකාශ කරනව.

දැන් මෙතෙන්දි යමක් කියන්ට සිද්ධ වෙනව. පාඨාන්තර පිළිබඳ ප්‍රශ්නයකුත් මෙතන තියෙනව. ඒක නම් පුළු දෙයක්. මේ ගාථා දෙකේම අපි ගත්තෙ "විසුද්ධි" කියන වචනය. සමහර ඒවයේ තියෙනව 'සුද්ධි' කියන වචනය. "න සුද්ධිමාහ" මෙතැන වඩාත් අර්ථාන්විත හැටියට පේන්නෙ "විසුද්ධි" කියන එකයි. "න සුද්ධි මාහ, කියල සමහර මුද්‍රණවල තියෙනව.ඒ කොයිඑක හරි එතකොට මේ ගාථා දෙක පිළිබඳ විග්‍රහයේදී අටුවාව තේරුම් කරන්නේ බුදු රජාණන් වහන්සේ කළ ප්‍රකාශනය, ඒ කියන්නෙ දිට්ඨියෙන් සුතියෙන් ඤාණයෙන් සීලයෙන් ව්‍රතයෙන් විසුද්ධියක් ඇතැයිද නොකියමි. දිට්ඨිය නැතිව, සුතිය නැතිව. ඤාණය නැතිව, සීලය නැතිව, ව්‍රතය නැතිව, එයිනුත් විසුද්ධියක් ඇතැයි නොකියමි, කියන ඒ ප්‍රකාශනය අටුවාව තෝරන්නෙ කොහොමද? අර මුල් පද දෙකෙන් කියැවෙන්නෙ මිථ්‍යාදෘෂ්ටිය ගැනය, මිථ්‍යාදෘෂ්ටි, මිථ්‍යා ශ්‍රැති, මිථ්‍යා ඤාන, මිථ්‍යා ශීල මිථ්‍යා ව්‍රත, ඒවයින් විසුද්ධියක් වෙන්නෙ නැත. දෙවෙනි පද දෙකෙන් කියන්නෙ සම්මා දිට්ඨි පක්ෂයේ වූ ධර්මය. ඒ කියන්නෙ අපේ - මගේ - සම්මා දිට්ඨි පක්ෂයේ වන දිට්ඨියෙන් ඤාණයෙන් සීලබ්බතයෙන් - ඒවයින්ය, විසුද්ධිය ඇති වෙන්න කියල. එහෙම ගත්තොත් නම් මේ ගාථාවෙ තියෙන ඉතාමත්ම සියුම් අර්ථය යටපත් වෙනව. එහෙමනම් අර බ්‍රාහ්මණයට ඒක ප්‍රශ්නයකුත් වන්නෙ නැහැ. මාගන්දිය බ්‍රාහ්මණයට පටලැවිල්ලක් ඇතිවෙන්න හේතුවක් නැහැ. මේ බ්‍රාහ්මණය බුදුරජාණන් වහන්සේට චෝදනා කළේ මේක මහා මුළාවක් කියල, ඒ කියමනේ පරස්පර විරෝධීත්වයක් පෙනුන නිසයි. පරස්පර විරෝධී කියමනක් වගේ පෙනුන නිසයි. මුල් පද දෙකෙන් කියවෙනව මේවයින් විසුද්ධියක් නැහැ කියල. ඊළඟට කියනව ඒව නැතිවත් බැරිය කියල. එතකොට මෙතැන සම්මා දිට්ඨි මිච්ඡා දිට්ඨි කියල දෙකකට බෙදන්න බැහැ. එහෙම කියනව නම් අනෙක් ශාස්තෘවරු කළෙත් ඒකමයි. එකිනෙකා සමඟ කලහ විවාද කළ අනෙකුත් ශාස්තෘවරුන් කියන්නෙ කොහොමද? ඔබේ දෘෂ්ටියෙන් නොවෙයි මගේ දෘෂ්ටියෙන්, ඔබේ ශ්‍රැතියෙන් නොවෙයි මගේ ශ්‍රැතියෙන්, මේ විමුක්තිය ලබා ගන්න පුළුවන්. එහෙම කථාවක් නොවෙයි බුදුරජාණන් වහන්සේ මෙතන ප්‍රකාශ කළේ. එතකොට මෙතන කියවෙන්නෙ සම්මා දිට්ඨියට අනුව - බුදුරජාණන් වහන්සේ දක්වූ බෞද්ධ ප්‍රතිපදාවට අනුව- දිට්ඨිය ඇතිවත් බැහැ නැතිවත් බැහැ, වගේ මෙතන කියන්නෙ. ඒකියන්නෙ ඒකාන්ත වට්කා කමක් නැහැ. නැවතත් අපි එන්නෙ අර වචන දෙකටයි. ප්‍රායෝගික - සාපේක්ෂ. යම්කිසි අර්ථයක් ඉෂ්ට කරගන්නව. ඒ මිසක් ඒකේ ඒකාන්ත වටිනාකමක් නැහැ. ඒක නිසා තමයි බුදුරජාණන් වහන්සේ මෙතැන ප්‍රකාශ කරන්නෙ දිට්ඨියෙන් සුතයෙන් ඤාණයෙන් සීලයෙන් ව්‍රතයෙන් මම විසුද්ධියක් ඇතැයි නොකියමි. ඒ වගේම දිට්ඨිය නැතිවත්, සුතිය

ආදිය නැතිවත් සුද්ධියක් ඇතැයි නොකියමි. මෙතැන බැලූ බැල්මට පරස්පර විරෝධී බවක් පේනව. නමුත් මෙතන මධ්‍යම ප්‍රතිපදාවයි ප්‍රකාශ කෙරන්නේ. ඒවයේ ඒකාන්ත වටිනාකමක් නැහැ. සීමිත වූ එක්තරා සාපේක්ෂ වටිනාකමක් තියෙන්නෙ. ඔන්න ඔය කාරණයයි අපට ගන්න වෙන්නෙ මේකෙන්.

දැන් මෙතන කියැවෙන මේ කියන අධ්‍යාත්ම ශාන්තිය වෙන එකක් නොවෙයි. අනුපාදාපරිනිබ්බානයමයි. ඒ බව හෙළිවෙනව බුදු රජාණන් වහන්සේ දේශනා කළ ගාථාවෙ අවසාන පදයෙන්. "එතෙව නිසසජජ අනුගගහාය - සනෙතා අනිසසාය භවං න ජපෙප" මේ හැම දෙයක්ම අතහැරල, "අනුගගහාය" අල්ලගන්නෙ නැතිව- අනුග්ගහාය කියන්නෙ අර අනුපාදා කියන අදහසමයි, උපාදානයක් නැති බවයි.- "අනිසසිතො" යමකට හේත්තු වෙන්නෙ නැතිව. අනිස්සිත කියන වචනය අපට කලින් හමුවුනා, නිවන ගැන කියන කොට. "නිසසිතසස චලිතං අනිසසිතසස චලිතං නතථි"[5] යමකට හේත්තුවුන තැනැත්තාට සෙලවීමක්, එහෙම නැතිනම් චලිතයක් තියෙනව. යමකට හේත්තු නොවුන තැනැත්තාට එවැන්නක් නැත. ඒ කියන්නෙ අර අනුපාදා තත්ත්වය. "අනිසසාය භවං න ජපෙප" ඒ වගේම භවයක් ප්‍රාර්ථනා කරන්නෙ නැහැ. මේ එක එකක් අල්ලගත්ත නම් ඒක භවයක් වෙනව. මේ අල්ලගැනීම, උපාදානය, ඇති තාක් භවයක් තියෙනව. උපාදානය යම් තැනක ද, භවයත් එතැනමයි. එතකොට මෙන්න මේ අනුව අපට තේරුම් ගන්න පුළුවන්, නැවතත් අපට සිහිපත් කරගන්න පුළුවන්, බුදු රජාණන් වහන්සේ පෙන්නුම් කරන්නෙ මේ ධර්මයන් අල්ල ගන්න ඕන දළි පිහිය මදින්න වගේ. මේ හැම එකක්ම දළි පිහිය මදින්න අල්ල ගත්ත වගේ විසිකරන්න ලෑස්ති වෙලා අල්ලගන්න ඕන. එහෙම දෙයක් මේ. වැඩේ කරනව ඊළඟට අත හැරෙනව. අන්න ඒ ධර්මතාවයි මේ සූත්‍රයෙනුත් හෙළි වෙන්නෙ. මේක අපට තව දුරටත් පැහැදිලිව, ඉතාමත්ම පැහැදිලිව, ප්‍රකාශ කෙරෙන සූත්‍රයකට අපි ඊළඟට එනව. මජ්ඣිම නිකායේ රථවිනීත සූත්‍රය. දැන් මේ මාගන්දිය සූත්‍රයේ කියාපු කාරණය තේරුම් ගැනීමට අපහසු නම්, ඔන්න හොඳට හෙළි වෙනව රථ විනීත සූත්‍රයෙන්, මැදුම් සඟියේ. බ්‍රාහ්මණයෙකුත් එක්ක කරන වාදයක් හැටියට නොවෙයි රථවිනීත සූත්‍රයේ සාකච්ඡාව ඉදිරිපත් කෙරෙන්නෙ. මේ ශාසනයේ ඉතාමත්ම ශ්‍රේෂ්ඨ රහතන් වහන්සේලා හැටියට සැළකෙන සාරිපුත්ත ස්වාමීන් වහන්සේත්, පුණ්ණමන්තානිපුත්ත ස්වාමීන් වහන්සේත් අතරයි සාකච්ඡාව. මේ රථවිනීත ප්‍රතිපදාව ගැන දීඝ සාකච්ඡාවක් කරන්නෙ සාරිපුත්ත ස්වාමීන් වහන්සේට මේ ප්‍රතිපදාව ගැන සැකයක් ඇති නිසා නොවෙයි, අර මාගන්දියල සඳහා, ලෝකයේ ඉන්න අර විදියේ

මාගන්දියල සඳහා. බුදුරජාණන් වහන්සේගේ මධ්‍යම ප්‍රතිපදාවේ ප්‍රායෝගික සාපේක්ෂ ස්වභාවය ගැන අවබෝධයක් නැති අය සඳහායි සාරිපුත්ත ස්වාමීන් වහන්සේ දීඝ ප්‍රශ්න මාලාවකින් මේ කාරණය පැහැදිලි කරල දෙන්නෙ මේ සූත්‍රයෙන්. අපි ඒ සූත්‍රයේ දක්වෙන කාරණා තේරුම් ගැනීම පහසුවීමට කොටස් තුනකට බෙදල ඒ සාකච්ඡාව ඉදිරිපත් කරන්න උත්සාහ කරමු.

පළමුවෙන්ම සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පුණ්ණ මන්තානිපුත්ත ස්වාමීන් වහන්සේගෙන් අසන ප්‍රශ්නය, "සීලවිසුද්ධත්ථං බො ආවුසො භගවති බ්‍රහ්මචරියං වුස්සති" ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචරිය වාසය වසනු ලබන්නේ සීල විසුද්ධිය සඳහාද? "නොහිදං අවුසො" නැත ඇවැත්නි කියල පුණ්ණ ස්වාමීන් වහන්සේ පිළිතුරු දෙනව. ඊළඟට අහනව එහෙනම් චිත්ත විශුද්ධිය සඳහාද?, නැත. දිට්ඨි විශුද්ධිය සඳහාද? ඒත් නැත. කංඛාවිතරණ විසුද්ධිය සඳහාද? ඒත් නැත. මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධිය සඳහාද?, ඒත් නැත. පටිපදාඤාණ දස්සන විසුද්ධිය සඳහාද? ඒත් නැත. ඤාණදස්සන විසුද්ධිය සඳහාද? ඒත් නැත. එතකොට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අහනව "කිමත්ථං චරහි ආවුසො භගවති බ්‍රහ්මචරියං වුස්සති" හොඳයි එහෙනම් ඇවැත්නි කුමක් සඳහාද භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචරිය වාසය කරන්නෙ? "අනුපාදා පරිනිබ්බානත්ථං ආවුසො භගවති බ්‍රහ්මචරියං වුස්සති" කිසිවක් අල්ලා නොගෙන පිරිනිවීම සඳහාය භාග්‍යවතුන් වහන්සේ වෙත මේ බ්‍රහ්මචරිය වාසය වසන්නෙ. ඔන්න එතකොට මේ සාකච්ඡාවෙන් පළමුවෙනි කොටස හැටියට ඉදිරිපත් කෙරුනෙ අර එක එකක් සඳහාවත් නොවෙයි බ්‍රහ්මචරියවාසය. අනුපාදාපරිනිබ්බාන නම් වූවක් සඳහායි. මොකක් නමුත් අනුපාදාපරිනිබ්බාන නම් වූ දෙයක් සඳහායි. ඔන්න ඊළඟට දෙවන කොටස හැටියට අපි ඉදිරිපත් කරන සාකච්ඡාවේදී සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අර මාගන්දිය ඇසුව වගේ මෙතන තිබෙන පරස්පර විරෝධී ස්වභාවය මතුකරල දෙනව. බැලූබැල්මට ටිකක් තේරුම් ගන්න අමාරු තැනකුත් මෙතන තිබෙන බව. ඊළඟට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පිළිවෙලින් අහනව "කිනනු බො ආවුසො සීලවිසුද්ධි අනුපාදා පරිනිබ්බානං" ඇවැත්නි මේ සීල විසුද්ධියද අනුපාදාපරිනිබ්බානය කියල කියන්නෙ? නැත. ඒක නොවෙයි. ඇයි? අනුපාදාපරිනිබ්බානයක් ගැන අහන කියවුනානෙ. ඒ නිසා සීල විසුද්ධියමද අනුපාදාපරිනිබ්බානය. නැත. චිත්තවිසුද්ධියද? ඒත් නැත. දිට්ඨි විසුද්ධියද? ඒත් නැත. ඔය විදියට අහනව ඤාණදස්සන විසුද්ධිය දක්වාම. ඒ එකක්වත් නොවෙයි අනුපාදාපරිනිබ්බානය. එහෙම ප්‍රකාශ කළාම සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඊළඟට විමසනව "කිමපන ආවුසො අඤ්ඤත්‍ර ඉමෙහි ධම්මෙහි

අනුපාදා පරිනිබ්බානං" කිමෙක්ද ඇවැත්නි මේ කියාපු ධර්මයන් හතම අතහැරල, මේ හතෙන් පිට, මේව නැතිව - මේවයින් තොරව - අනුපාදාපරිනිබ්බානයක් තියෙනවද? ඒකටත් "නැත" කියල කියනව. ඔන්න එතකොට දන් ප්‍රශ්නය බැලූ බැල්මට පරස්පරවිරෝධී තත්ත්වයකට වගේ ඇවිල්ල.

ඊළඟට තුන්වෙනුව සාරිපුත්ත ස්වාමීන් වහන්සේ විමසනව අර කලින් කළ සාකච්ඡාව ගැනම. දන් කියනවනේ සාමාන්‍යයෙන් පුනරුක්තිවශයෙන්, එහෙම නැතිනම් නැවත උච්චාරණය කරන ක්‍රමයක් තියෙනවනෙ. යම්කිසි කෙනෙකුගේ පරස්පරවිරෝධී බවක් පෙන්නුම් කිරීමට ඒක නැවතත් කියනව. ඇවැත්නි මම ඔබෙන් මෙහෙම ඇහුව ප්‍රශ්නයට ඔබ ඒකටත් නැහැයි කිව්ව. මේකටත් නැහැයි කිව්ව. ඊළඟට ප්‍රශ්න කරනව "යථාකථම්පන ආවුසො ඉමස්ස භාසිතස්ස අත්ථො දට්ඨබ්බො" එහෙනම් කොහොමද ඇවැත්නි මේ ඔබගේ කථාව තේරුම් ගන්නෙ?" අර මාගන්දිය වගේ තදින් කිව්වෙ නැහැ. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මතුකරල දුන්න තේරුම් ගන්න බැරි තැන. කොහොමද ඇවැත්නි ඔබේ මේ කථාව මම තේරුම් ගන්නෙ? සීලවිසුද්ධි ආදී මේ එකක්වත් නොවෙයි අනුපාදාපරිනිබ්බානය. ඊළඟට මේවායින් තොරව අනුපාදාපරිනිබ්බානයකුත් නැත කියල කියනව.

ඔන්න තුන්වෙනි කොටස හැටියට අපි දක්වන එකෙන් මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳනව පූර්ණ මන්තානිපුත්ත ස්වාමීන් වහන්සේ. ඒක මෙහෙමයි ඉදිරිපත් කරන්නෙ. "සීල විසුද්ධිඤ්චෙ ආවුසො භගවා පරිනිබ්බානං පඤ්ඤාපෙස්ස සඋපාදානං යෙව සමානං අනුපාදාපරිනිබ්බානං පඤ්ඤාපෙස්ස" ඇවැත්නි සීලවිසුද්ධිය අනුපාදාපරිනිබ්බානයයි භාග්‍යවතුන් වහන්සේ දක්වනවා නම් උපාදාන සහිත වූවක්ම අනුපාදා පරිනිබ්බානයක් හැටියට දැක්වීමක් වෙනවයි කියල. සීල විසුද්ධිය අනුපාදාපරිනිබ්බානයයි කිව්වොත් එතැන උපාදාන සහිත පරිනිබ්බානයකුයි තියෙන්නෙ. එතකොට ප්‍රශ්නෙ එක පැත්තක් ඒකෙන් විසඳනව. ඊළඟට අනිත් පැත්ත ප්‍රකාශ කරනව. "අඤ්ඤත්‍ර ඉමෙහි ධම්මෙහි අනුපාදාපරිනිබ්බානං අභවිස්ස පුථුජ්ජනො පරිනිබ්බායෙය්‍ය. පුථුජ්ජනො හි ආවුසො අඤ්ඤත්‍ර ඉමෙහි ධම්මෙහි" - මේ ධර්මයන්ගෙන් තොරව පිරිනිවීමක් ඇතිවෙනව නම් පෘථග්ජනයත් පිරිනිවල ඉවරයි. නිවන් දකල ඉවරයි. මක්නිසාද, පෘථග්ජනයට මේ එකක් වත් නැහැ. ඔන්න එතකොට අපට පේනව මෙතන මේ ප්‍රශ්නයෙ සියුම් බව. අර එකක්වත් අනුපාදාපරිනිබ්බානයයි නොකිවූ පමණට ඒව ඉවත් කරන්නත් බැහැ. අපි කලිනුත් සඳහන් කරල තියෙනව අලගද්දූපම සූත්‍රය.[6] ඒකෙ උපමා දෙකක්ම තියෙනව. පහුරෙ උපමාවයි නයාගේ උපමාවයි. පහුර

කරගහගෙන යෑම එක අන්තයක්. නයාගේ වලිගයෙන් ඇල්ලීම අනිත් අන්තය. මේ කිසි එකක් වැඩක් නැහැ කියල 'ඇල්ලුවොත්' ඒක නයාගේ වල්ගෙන් ඇල්ලුව වගේ. ඔන්න ඔය දෙකට අතරෙයි මේ මැදුම් පිළිවෙත තියෙන්නෙ. ඒකයි මෙතෙන්දි මතුවෙන්නෙ. එහෙමනම් පෘථග්ජනයත් නිවන් දැකල ඉවරයි. ඇයි අරව මොකුත්ම නැහැනෙ පෘථග්ජනයට!

ඊළඟට මේ කාරණය තවත් පැහැදිලිකර දීමට පුණ්ණ ස්වාමීන්වහන්සේ අර රථ උපමාව ඉදිරිපත් කරනව. ඒක බොහොම ප්‍රකට උපමාවක්. අපි කෙටියෙන් සඳහන් කළොත්, පසේනදී කොසොල් රජ්ජුරුවෝ සැවැත් නුවර වාසය කරන අවස්ථාවෙ සාකේත නුවර හදිසි කටයුත්තක් සඳහා යන්ට සිද්ධ වෙනව. ඒ ගමන් මාර්ගයෙ කඩින් කඩ රථ හතක් නවත්වල තියෙනව. "රථ විනීත" - කඩින් කඩ දිවීම සඳහා පුරුදු කළ රථ හතක් වෙන්න ඕන. අශ්වරථ. එතකොට ඉක්මනට යන්න ඕන නිසා රජතුමා එක රථයකට නඟිනව. ඒකෙන් දෙවෙනි රථයට ළං වෙනව. පළමු රථය අතහරිනව. දෙවෙනි රථයට නඟිනව. දෙවෙනි රථයෙන් තුන්වෙනි රථය තියෙන තැනට යනව. දෙවෙනි රිය අතහරිනව. තුන්වෙනි රියට නඟිනව. ඔය ආකාරයට ගිහිල්ල හත්වෙනි රථයෙන් සාකේත නගරද්වාරයට පැමිණෙනව. එතැනට පැමිණියාම නෑ හිතවතුන් ආදිය රජුගෙන් අහනව "මහරජ මේ රථයෙන්ද සාකේත නුවරට පැමිණියේ?" එතකොට මේ රථයෙන් කියල කියන්නත් බැහැ, රථ හතෙන්ම කියල කියන්නත් බැහැ. ඒකාන්ත වශයෙන් කොසොල් රජතුමාට පිළිතුරු දෙන්න බැහැ. ඒක නිසා මුළු කථාවම සම්පූර්ණයෙන්ම කියන්න වෙනව. මම සැවැත් නුවරින් එක රථයකින් පිටත් උනා. ඒකෙන් ඇවිල්ල දෙවෙනි රථයට ළංවුනා. පළමු වැන්න අතහැරිය, දෙවෙනි රථයට නැංගා. ඒ විදියට ඒ සිද්ධිය සම්පූර්ණයෙන් කියන්ට සිද්ධවෙනව.

ඒ උපමාව ඉදිරිපත් කරල ඊළඟට ඒක හකුළුවල දක්වනව මේ ධර්ම කාරණයෙන්, පුණ්ණ මන්තානිපුත්ත ස්වාමීන් වහන්සේ. "එවමෙව ඛො ආවුසො සීලවිසුද්ධි යාවදෙව චිත්තවිසුද්ධත්ථා, චිත්තවිසුද්ධි යාවදෙව දිට්ඨි විසුද්ධත්ථා. දිට්ඨි විසුද්ධි යාවදෙව කඞ්ඛාවිතරණ විසුද්ධත්ථා. කඞ්ඛාවිතරණ විසුද්ධි යාවදෙව මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධත්ථා, මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධි යාවදෙව පටිපදාඤාණදස්සන විසුද්ධත්ථා. පටිපදාඤාණදස්සන විසුද්ධි යාවදෙව ඤාණදස්සන විසුද්ධත්ථා, ඤාණදස්සන විසුද්ධි යාවදෙව අනුපාදා පරිනිබ්බානත්ථා. අනුපාදා පරිනිබ්බානත්ථං ඛො ආවුසො භගවති බ්‍රහ්මචරියං වුස්සති." අන්න ඒ විදියටම සීල විසුද්ධිය හුදෙක් - යාවදෙව කියන වචනය මෙතන හුඟක් වැදගත් වෙනව, යාවදෙව කියල කියන්නෙ

'හුදෙක්' සීල විසුද්ධිය හුදෙක් චිත්ත විසුද්ධිය සඳහායි. චිත්ත විසුද්ධිය හුදෙක් දිට්ඨි විසුද්ධිය සඳහායි. දිට්ඨි විසුද්ධිය හුදෙක් කංඛාවිතරණ විසුද්ධිය සඳහායි. මේ හුදෙක් කියල කිව්වෙ අන්න අර ප්‍රායෝගික සාපේක්ෂ අර්ථය මතුකරන්නයි. අර රථ පිළිබඳ උපමාවත් එක්ක ගත්තොත් සීල විසුද්ධියෙන් ලැබෙන 'ජවය' උඩයි චිත්ත විසුද්ධිය ගොඩ නැගෙන්නෙ. චිත්ත විසුද්ධියෙන් ලැබෙන ජවය පිහිට කරගෙනයි දිට්ඨි විසුද්ධිය ගොඩ නැඟෙන්නෙ. මේ එකක්වත් සම්පූර්ණයෙන් ඉවත් කරනව නොවෙයි අර පෘථග්ජනය වගේ. මෙතන පෙන්නුම් කරනව එක්තරා විදියක හේතු ඵල න්‍යායයක්. මේක තුළින් අපට දකින්න පුළුවන් බුදුරජාණන් වහන්සේ කළේ කුමක්ද? අමුතු දෙයක් නොවෙයි. මේ ලෝකයේ පවතින, විමුක්තිය සඳහා උපකාරවන එක්තරා ධර්ම පරම්පරාවක් මතුකරල දුන්න. මේව හරියට එකකින් එකකට පිහිට කර ගන්නව මිසක් එකක්වත් අල්ලා ගැනීමක් නැහැ. අර උපධීන් පිළිබඳවත් නිරුපධි තත්ත්වය පිළිබඳවත් වෙනස තියෙන්නෙ මේකයි. උපධීන් නම් එකතු කරල ගොඩ ගසා ගන්නව. කරගසාගන්නව. සාංසාරික වශයෙන් උපධිවිපාක ගෙනදෙන පිංකම් ආදිය කරනකොට ඒව ගොඩ ගසා ගන්නව. රැස්කරගන්නව. නිරුපධි තත්ත්වය සඳහා තියෙන්නෙ එබඳු ප්‍රතිපදාවක් නොවෙයි. එකකින් එකකට උපකාර ලබාගෙන, ඒකෙන් තවත් එකකට. ඔය විදියට අර රථවිනීත උපමාව අනුව අර එකක්වත් අල්ල ගන්නෙ නැහැ.

සීලවිසුද්ධිය අල්ලගන්නෙත් නැහැ. චිත්තවිසුද්ධිය අල්ල ගන්නෙත් නැහැ. දිට්ඨිවිසුද්ධිය අල්ලගන්නෙත් නැහැ. ඤාණදස්සන විසුද්ධිය පවා අල්ලගන්නෙ නැහැ. ඒ ඔක්කොමගෙන් වෙන්උනාට පස්සෙ සියුම්ම තත්ත්වයට ආවට පස්සෙ, "අනුපාදා පරිනිබ්බානං" කියවෙන අල්ලාගන්නෙ නැති පිරිනිවීමක්. මේක තමයි මේ ධර්මයේ සියුම්ම කාරණය.

අධෝලිපි

1. ම.නි. III බු.ජ. 12-458 පිට
2. ඛු.නි. I බු.ජ. 24-290 පිට
3. ම.නි. I බු.ජ. 10-300 පිට
4. සු.නි. බු.ජ. 25-264 පිට
5. ම.නි. I බු.ජ. 10-362 පිට
6. ම.නි. I බු.ජ. 10-324 පිට